# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2019 ජනවාරි 08 වන අඟහරුවාදා**
2019தை 08 வெள்ளிக் கிழமை
Tuesday 08th January 2019

**බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 (12 වන මහල) හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12ஆம் மாடி) இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற சபைக் கூட்டம்.

Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.49 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.49 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.49 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුභ උදෑසනක් වේවා. සුභ දවසක් ප්‍රාර්ථනා කරනවා. ලැබුවා වූ 2019 නව වසර ඔබ සැමට සාමය, සතුට පිරි වාසනාවන්ත සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, උදේ පාන්දරම කරන්න දෙයක් නැහැ. අලුත් අවුරුද්ද තමයි. රීති ප්‍රශ්නයක් මතු කරන්න ඕනෑ. කාර්ය පටිපාටි රීති 14(5) වෙත ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ගරු සභාපතිතුමනි, මේ සභාවේ මීට පෙරත් මේ ප්‍රශ්නය මතු වුණා. උදේ 09.30 ට මේ සභාව රැස් වෙන්න ඕනෑ කියලා. ඒ අදාළ රීතියේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා. එහෙම නැත්නම් මේ සභාව නීත්‍යානුකූල නැහැ. ගණපූරණය නැහැයි කියලා කවුරු හරි මතු කළොත්, ඔබතුමාට පුළුවන් සීනුව නාද කරලා කැඳවන්න. ඒත් කැඳවලා ගණපූරණය ඇති වුණේ නැත්නම්, ඔබතුමා සභාව කල් දාන්න ඕනෑ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, සභාව මීට කලින් පටන් ගන්න ඕනෑ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නමුත් සභාව පටන් ගැනීමට ගණපූරණය ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. ඔබතුමා මෙතැනට හරියට 09.30 ට වඩින්න ඕනෑ. ඒකයි කියන්නේ. ඉතින් ඒක නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වඩින්න ඕනෑ නැහැ. මම මෙතැනට එන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එන්න පුළුවන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

බෙල් එකට අවනත වෙන්න ඕනෑ. නරක පූර්වාදර්ශයක් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි ප්‍රශ්නය වෙන්නේ. මට මේක -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

වඩින්න කියන වචනය පවා කියැවෙන්නේ ඔබතුමාට තිබෙන ගෞරවය නිසා. බොහොම ගෞරවයෙන් ඒක කියන්නේ. ඒ නිසා ඒ ගරුත්වය ඔබතුමා රකින්න ඕනෑ. මෙතැන කොහේවත් රීතියක සඳහන් වෙලා නැහැ, සභාවේ ගණපූරණය සම්පූර්ණ වුණාට පස්සෙයි ඔබතුමා මෙතැනට එන්න ඕනෑ කියලා. සභාවේ ගණපූරණය ප්‍රශ්නය එන්නේ සභාව පටන් ගත්තයින් පස්සේ. පළමුව සභාව පටන් ගන්න ඕනෑ. එතෙක් ගණපූරණය පිළිබඳ ප්‍රශ්නය නැහැ. මේ රීති පොතේ එහෙම සඳහනක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි. මම ඒක පිළිගන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා ඔබතුමා 9.30 ට සීනුව ගහලා, මේ සභාව 9.30 ට පටන් ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඕක කරන්න හැමදාම උත්සාහ කරනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මොනවා හරි තියෙනවා නම්, ඒක වෙනම ඔබතුමන්ලා තියන්න ඕනෑ. ඒකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මුලින් නම් එක දවසක් දෙකක් පටන් ගත්තා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කවුරු හරි එන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගණපූරණය ප්‍රශ්නයක් තිබෙන නිසා කරුණාකර සීනුව නාද කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සීනුව නාද කරන්න ගණපූරණය ප්‍රශ්න කළේ නැහැ ගරු සභාපතිතුමනි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගණපූරණය ගැන විමසීමක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගණපූරණය නොවෙයි. වෙලාවට පටන් ගන්න කියලා අපිත් කියන්නේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගණපූරණය සම්බන්ධව කවුරුත් ප්‍රශ්න කළේ නැහැ. ඔබතුමා 9.30 ට මේක පටන් ගත්තේ නැති එක සම්බන්ධවයි ප්‍රශ්න කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මමත් මේ සභාව 9.30 ට පටන් ගන්න උපරිම උත්සාහ කරනවා. අපි ලේකම්තුමාත් සභාවේ මන්ත්‍රීවරු බලන කොට සභ ගර්භය තුළ බොහෝ දුරට හත් අට දෙනයි ඉන්නේ. ඒක තමයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ගැන මට දැඩිව කටයුතු කරන්න බැහැ. නමුත් මමත් පුළුවන් තරම් උත්සාහ කරන්නේ, මේ සභාව පිරුණාම, අඩුම වශයෙන් මන්ත්‍රීවරු 10 ක් 15 ක් 20 ක්වත් ඉන්නවා නම් මටත් සතුටක් දැනෙන්නේ. ඒක හැමෝගෙම යුතුකමක්. මගේ විතරක් නොවෙයි. මන්ත්‍රීවරු හැමෝම ඒකට වග කියන්න ඕනෑ. එන අයත් ඉන්නවා. මම ඒ අයට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, එහෙම බල බලා හිටියාම 09.30 ට ආපු අයට අසාධාරණයක් වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අසාධාරණයක් වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි 9.00 ඉඳලා ඇවිල්ලා ඉන්නවා. අපි පැයක් නිකම් ඉන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා වෙලාවට ඇවිල්ලා පටන්ගන්න. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ 09.30 ට පටන් ගන්න. ගණපූරණය නැත්නම් නැවතුණාට කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ පළාත් සභාවේ තව සභා රැස්වීම් හයයි තියෙන්නේ. මේකත් එක්ක හතයි තියෙන්නේ. නමුත් ඊළඟ සභාවේ ඉඳලා අපි උත්සාහ කරමු

9.30 ටම පටන් ගන්න. මම 9.30 ට එන්නම්. මම ඒක ක්‍රියාත්මක කරන්නම්. මට ඒ ගැන අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාට බෙහෙවින් ස්තූතියි.

ඒ වාගේම විශේෂයෙන්ම මම බලාපොරොත්තු වෙනවා ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත්, ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අමාත්‍යවරුන්ගේත්, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ධූරධාරීන්ගෙනුත්, මන්ත්‍රීවරුන්ගෙනුත් මේ මාස තුනක කාලය, එහෙම නැත්නම් සභා රුස්වීම් හයක් පැවැත්වෙන ඉදිරි කාලය තුළ මට සම්පූර්ණ සහාය ලබා දේවි කියලා. එහෙම වුණොත් අපට පුළුවන් වෙනවා, අඩුම වශයෙන් මේ මාස කිහිපයේදිවත් ඵලදායී රුස්වීම් කිහිපයක් පවත්වන්න.

## සභාපතිවරයාගේ නිවේදන
ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරවරයා ලෙස මොහොමඩ් අසාත් සනූන් සාලි මහතාව අතිගරු ජනාධිපතිතුමන් විසින් 2019.01.04 දින සිට පත් කර ඇති බව ජනාධිපති ලේකම් විසින් නිකුත් කළ දැනුම් දීමක සඳහන්ව තිබෙන බව කාරුණිකව දැනුම් දෙනවා."*

*ii*

*"2018.12.07 දින සභා සම්මත වූ, 2019 වර්ෂයට අදාළ මුදල් ප්‍රකාශය හා ඊට අදාළ 2018 අංක 05 දරන විසර්ජන ප්‍රඥප්තියට 2018.12.12 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලබා දී ඇති බව කාරුණිකව දැනුම් දෙනවා."*

## ලිපි ලේඛන පිළිගැන්වීම
PAPERS PRESENTED

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාව හා වාර්ෂික ගිණුම් වාර්තාව, බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2014 සිට 2016 දක්වා වූ වර්ෂයන්හී අවසන් ගිණුම් වාර්තා සහ විගණකාධිපති වර්තාවන් සහ බස්නාහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2017 වර්ෂයේ වාර්ෂික ගිණුම් වාර්තාව සහ විගණකාධිපති වර්තාව මම මෙම සභාවට පිළිගන්වනවා.

***අනතුරුව, ගරු සභාපතිතුමා විසින් එකී වාර්තා පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවට යොමු කරන ලදී.***

## කාරක සභා වාර්තා පිළිගැන්වීම
PRESENTATION OF COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.12.19 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රුස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
PETITIONS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පන්නිපිටිය, පැලැන්වත්ත, ගැමුණු මාවත, එදිරිසිංහ පෙදෙස, අංක 391/3ඒ/1 හි පදිංචි පියුමි වාසනා ජයරත්න යන අගේ පෙත්සම,

ii. මහරගම, දෙහිවල පාර, අංක 162/2 හි පදිංචි පී.පී. නුවන් රංග ඩයස් යන අයගේ පෙත්සම සහ

iii. මහරගම, නාවින්න, දුම්රිය මාවත, අංක 110 හි පදිංචි එගොඩ වඩුගේ ගෙට්ලර් යන අයගේ පෙත්සම.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, උස්වැටකෙයියාව, ඇන්ටන් මාවත, අංක 308/සී හි පදිංචි කුමාරි පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අංගොඩ, ගොතටුව, බෝපැත්ත, අංක 293/ඒ හි පදිංචි කේ.ඒ. කරුණාවතී යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ජනක කුරුප්පු**
Hon. Janaka Kuruppu

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. ගම්පහ, බෙම්මුල්ල, දාරළුව අංක 3 හි පදිංචි පදිංචි දර්ශන ප්‍රදීප් ආරියරත්න යන අගේ පෙත්සම සහ

ii. බෙම්මුල්ල, කඳඔළුවාව, අංක 14/3 හි පදිංචි එන්.ඒ.එම්. සුනිල් ශාන්ත යන අයගේ පෙත්සම.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, කොට්ටාව, හොරණ පාර, අංක 175/2 ඒ හි පදිංචි දොන් ප්‍රසන්න රණසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, දොඩංගොඩ, නෑහන්න, දෙල්ගස් හන්දිය, "අහිංසා" හි පදිංචි ඒ.එස්. නිරෝෂනී ද සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, හෝමාගම, පනාගොඩ, අංක 532/1 හි පදිංචි ලීලාරත්න උඩුමුල්ල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න සහ අතුරු ප්‍රශ්නය යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව -

**ගරු එස්. කුහවරදන්**
Hon. S. Kuhawarthan

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මගේ ජීවිතයට තර්ජනයක්. ඒ කියන්නේ Trekking සම්බන්ධව. මම අද සභාවට වාහනයෙන් එන ගමන්, විශේෂයෙන් මගේ ගෙදරින් පිටත් වෙලා ටික දුරක් ඇවිල්ලා එතැන ඉඳලා මේ සභාවට එනකල් Number එකක් නැති මෝටර් බයික් එකක් මාව Follow කරගෙන ආවා. ගරු සභාපතිතුමනි, ගිය මාසේ 26 වැනිදා ඔබතුමාටත්, මම ලිඛිතව ලියුමක් මගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ඉදිරිපත් කළා. අවුරුදු විස්සකට වැඩිය කාලයක ඉඳලා කරන මගේ ව්‍යාපාරයේ තිබෙන පෞද්ගලික ගණුදෙනු, ඒ කියන්නේ ඒ ප්‍රශ්නය දේශපාලන ක්ෂේත්‍රයට සම්බන්ධ වුණේ කොහොමද කියන එක ගැටළුවක්. සම්පූර්ණයෙන්ම දේශපාලන පළි ගැනීමක්. මගේ නම Damage කරන්න සම්පූර්ණයෙන්ම Plan කරලා ගිය මාසේ 25 වැනිදා මට e-mail එකෙන් තර්ජනයක් ඇවිල්ලා තිබුණා, මනෝ ගනේෂන් ඇමැතිතුමාගෙන්. ඊට පස්සේ 26 වැනිදා උදේ CID එකෙන් මාව Inquiry එකකට අරගෙන ගිහිල්ලා, 27 වැනිදා උදේ Court එකෙන් නීතිපති කියන්න ඉස්සෙල්ලා හැම පත්තරේම මගේ වැරදි තොරතුරු ඇවිල්ලා තිබෙනවා. හැම පත්තරේම. Tamil Mirror කියන පත්තරේ. ලංකාදීප, Daily News කියන පත්තරවල Front Page එකේම දාලා. සම්පූර්ණ වැරදි තොරතුරු. තමන්ගේ පෞද්ගලික ව්‍යාපාර ලෝකයක් හැම කෙනෙකුටම තිබෙනවා. අම්බානිටත් තියෙනවා. බිල් ගේට්ස්ටත් තියෙනවා. මේ වාගේම ප්‍රශ්නයකදී මගේ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ඒ සම්බන්ධයෙන් මම IGP ටත් Inform කරලා තිබෙනවා. Defense එකටත් Inform කරලා තිබෙනවා. ජනාධිපතිතුමාට Inform කරලා තිබෙනවා. සභාපතිතුමාටත් Inform කරලා තිබෙනවා. මගේ ජීවිත තර්ජනය සම්බන්ධව බලවත් ප්‍රශ්නයක් තිබෙනවා කියලා මේ අවස්ථාවේ කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාට ඇරෙන්න කිසිම අමාත්‍යවරයෙකුට, කිසිම මන්ත්‍රීවරයෙකුට මේ වනවිට

පොලිස් ආරක්ෂාව ලබා දීලා නැහැ. පළාත් සභාවේ සභාපතිවරයා වශයෙන් මටත් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සමහර වෙලාවලදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමහර වෙලාවල්වලදී තිබුණා. මටත් කලින් තිබුණා. ඔබතුමාගේ ප්‍රශ්නය පිළිබඳව මමත් සභාපතිවරයා වශයෙන්, අපේ සභාව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමාගේ කාරණාව මම ජනාධිපතිතුමාටත්, පොලිස්පතිතුමාටත් යොමු කරන්නම්. ඒ පිළිබඳව මම ලේකම්තුමාට අවශ්‍ය උපදෙස් දෙනවා ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා ලෙසට.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. 2018.12.26 වැනිදා, 2018.12.17 වැනිදා, 2018.12.15 වැනිදා ගරු සභාපතිතුමාත්, සුමිල් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමාත්, ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාත් ආණ්ඩුකාරතුමාට ව්‍යාපෘති ඉදිරිපත් කරලා මුදල් ලබා ගැනීමට ලිපි ලේඛන ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ව්‍යාපෘති 30 කට මිලියන 59 ක් ලක්ෂ 591 ක් ඉල්ලලා ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම ඒක 2018.12.26 වැනිදා ආණ්ඩුකාරතුමා ප්‍රධාන ලේකම්තුමාට අනුමත කරලා එවලා තිබෙනවා. ඒ වාගේම සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමා ව්‍යාපෘති 67 කට මිලියන 51.3 ක්, ලක්ෂ 513 ක ව්‍යාපෘති සඳහා. ඒක 2018.12.19 වැනිදා ප්‍රධාන ලේකම්තුමාට ආණ්ඩුකාරතුමා අනුමත කරලා එවලා තිබෙනවා. ඒ වගේම ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා ව්‍යාපෘති 13 ක්, මිලියන 121 ක්, කෝටි 12 ක්. 2018.12.17 වැනිදා ආණ්ඩුකාරතුමා ඒකත් අනුමත කරලා තිබෙනවා. මීටත් වැඩිය තවත් ධූරධාරීන් සහ මන්ත්‍රීවරු ඉතිහාසයේ කවදාවත් නොවුණු ආකාරයට සම්ප්‍රදාය කඩ කරලා, මම හිතන්නේ මහ ඇමැතිවරයා දැනුවත්ද නැද්ද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා මේ විධියට මුදල් වෙන් කර ගත්තේ මොන පදනම මතද කියලා අපි දැනගන්න කැමැතියි. මොකද, මේකේ මන්ත්‍රීවරු 104 ක් ඉන්නවා. 104 දෙනාට මුදල් බෙදෙන්න ඕනැ. ඒ මුදල්වලට අමතරව මෙහෙම ධූරධාරීන් මිලියන ගණන් වෙන් කර ගන්න ගියොත් - මේ සභාවේ අපි අයවැය අනුමත කරලා, අත උස්සලා තියෙන්නේ, එක් එක් ධූරධාරීන්ට මුදල් බෙදා ගන්න නොවෙයි. මට පේන විධියට මේ සභාව හදිසියේ විසුරුවා හැරියොත්, නැත්නම් අප්‍රේල් 22 විසුරුවා හැරියාට පස්සේ නැවත සභාව පත් වනතුරු සභාපතිතුමා මේකේ පාලන බලයේ ඉන්න නිසා මේ මුදල් ටික වෙන් කරලා, හිටපු ආණ්ඩුකාරතුමා හේම කුමාර නානායක්කාර මැතිතුමා අනුමත කරලා ප්‍රධාන ලේකම්තුමාට එව්වාම විසුරුවපු කාලයට මේ වැඩ ටික කර ගන්න පුළුවන්. ප්‍රාදේශීය සභා නගර සභාවල ලියුම් අරගෙන, ප්‍රාදේශීය සභා නගර සභා සමහර ඒවායේ ලියුම් නැතුව මෙහෙම මිලියන ගණනක් වෙන් කර ගත්තේ කොහොමද? අපි සභාපතිතුමාගෙන් අහනවා, මන්ත්‍රීවරු 104 ටම අසාධාරණයක්. මේක මොන පදනමකින්ද කරලා තිබෙන්නේ කියලා අපි දැනගන්න කැමැතියි. ඔබතුමාත් ඒකට සම්බන්ධයි. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ගරු මහ ඇමැතිතුමනි, අපි 2018 දෙසැම්බර් මාසේ අයවැය ඉදිරිපත් කරලා, අයවැයට අත උස්සලා, අපි ඒක ජයග්‍රහණය කරලා, මේ වාගේ 2019 වසරේ මුදල් බෙදා ගන්න ගියොත්, මේ මන්ත්‍රීවරුන්ට යන කල මොකක්ද? අපි හැමෝම ඡන්දයෙන් ඇවිල්ලා තියෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමන්ලාට කොපමණ දෙන්න පොරොන්දු වෙලා තියෙනවාද කියන්න කෝ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපට පොරොන්දු වෙලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මිලියන 20 ක් දෙන්න පොරොන්දු වෙලා නැද්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපට අමාත්‍යාංශවලින් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපට නොදී මේ විපක්ෂයට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ විධියට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

විපක්ෂයට ලක්ෂ 25 ක් විතරක් දීලා, ඔබතුමන්ලාට මිලියන 20 ක් - ඔබතුමා කිව්වා 104 දෙනෙක් ඉන්නවා කියලා. ගරු සභාපතිතුමනි, එහෙම නම් අනෙක් අයටත් මිලියන 20 ගණනේ දෙන්න එපැයි. එහෙම නම් ඔබතුමන්ලා ඒකටත් කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොඩ්ඩක් අහගන්න. ඔබතුමා අහගන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒකටත් කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා අහගන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එහෙම නම් ගම්පෙරළිය එන්නෙත් එහෙමද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අමාත්‍යාංශවලට යෝජනා එවන්න කියන එක වෙනයි. මේවා අනුමත කරලා, අමාත්‍යවරු එවලා තිබෙන්නේ යෝජනා දෙන්න කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ ආණ්ඩුකාරයා ඉන්න කල් කළේ බලු වැඩයි. කුහක වැඩයි. හොර වැඩයි. ආණ්ඩුකාරවරයා දැන් ගිහිල්ලා තියෙන්නේ.

[සභාවේ ඝෝෂා]

මේවා වලංගු නැහැ. මේවා අහෝසි කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරවරයා පුටුවලට කථා කළා. ආණ්ඩුකාරවරයා දොරට කථා -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

දැන්වත් කඩේ යන එක නතර කරන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ කාලෙත් වැරදි පූර්වාදර්ශ තිබුණා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරවරයා බලය පාවිච්චි කරලා මිලියන ගණන් වෙන් කරන්නේ කොහොමද? මේකේ පුටුවලට සල්ලි වියදම් කරන්න එපා කිව්වා. මේකේ දොරට වියදම් කරන්න එපා කිව්වා.

**ගරු රෝස් ප්රනාන්දු**
Hon. Rose Fernando

මහ ඇමැති දුන්නේ නැති නිසා ඉල්ල ගන්න ඇති.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මොන පදනමකින්ද සල්ලි වියදම් කරලා තිබෙන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි ඔය ආණ්ඩුකාරවරයා ගැන මේ සභාවේදී කිව්වා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලන්නේ. ගරු ප්‍රධාන ඇමැතිතුමනි, මේකට අපට පිළිතුරක් ලබා දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේගොල්ලෝ ආණ්ඩුකාරයාට කඩේ ගියා. ඒ ආණ්ඩුකාරයාගේ ආණ්ඩුකාර කාර්යාලයට හොරෙන් හොරෙන් රිංගුවේ ඕකට තමයි. අපි කිව්වා ඔය ආණ්ඩුකාරයා ඕහොමයි කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මොන පදනමකින්ද මුදල් වෙන් කරලා තියෙන්නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

හිටපු ආණ්ඩුකාරයා අත්සන් කරපු ලියුම් එකක්වත් දැන් වලංගු නැහැ. ඒ ආණ්ඩුකාරයා ගිහිල්ලා ඉවරයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අපි අහන්නේ, එහෙම ඉදිරිපත් කරලා අනුමැතියක් අරගෙන ආණ්ඩුකාරවරයා කොහොමද ප්‍රධාන ලේකම්තුමාට නියෝග කරන්නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අනෙක් එක ධූරධාරීන්. වගකීමක් ඇතිව නේ කරලා තියෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නම් සභාවක් ඕනෑ නැහැ නේ? එහෙම නම් සභාවක් අවශ්‍ය නැහැ නේ? එහෙම නම් මේක ආණ්ඩුකාරතුමාට කරගන්න පුළුවන්. ආණ්ඩුකාරතුමාද මේක පාලනය කරන්නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉස්සරත් ඔහොම කළා නේ?

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියපු කථාවට මම විරුද්ධයි. මොකද, ධූරධාරීන් කිව්වාට මම ඒ ගොඩේ නැහැ. මමත් ධූරධාරියෙක් තමයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා දැන් වෙන පක්ෂයක.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

මගේ යෝජනා එකක්වත් ඕකේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා වෙන පක්ෂයක. දීලා නැහැ. ඒකයි.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ඒක නිසා ඒක නවත්වන්න ඕනෑ. ධූරධාරීන්ගේ නම් ටික කියන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ආණ්ඩුකාරයා දීපු නියෝග දැන් අවසන්. ඒ නිසා ඒ කඩදාසි ඔක්කෝම අයින් කරන්න ඕනෑ. ආණ්ඩුකාරවරයාගේ ධූර කාලය දැන් අවසන්.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ආණ්ඩුකාරයා සළකපු ධූරධාරීන් ඇති. මම ඒ ගොඩේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරතුමාට හිතවත් ධූරධාරීන්ට දීලා තියෙන්නේ.

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

හිතවත් ධූරධාරීන්. ඒ කියන්නේ මම හිතවත් කෙනෙක් නොවෙයි. මගේ යෝජනා ඔය ගොඩේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් කථා කරනවාද? ඇමැතිතුමා සිද්ධියට අදාළව -

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු සභාපතිතුමනි, ආණ්ඩුකාරවරයා ඉවත් කිරීම පිළිබඳව අපි සතුටු වෙනවා. බලන්න ආණ්ඩුකාරතුමා මේ දීලා තිබෙන Diary එක මොකක්ද කියලා. මේ මනුස්සයාට මේ Diary එකට සල්ලි අනුමත කරන්න බැහැයි කිව්වා. අද සභා ලේකම් කාර්යාලයෙන් නිකම් කොළයක් ගහලා දීලා තියෙන්නේ. කොළඹ මහ නගර සභාවේ Diary එක බලන්න. අපට Diary යක් දෙන්න. මේ වාගේ ආණ්ඩුකාරයෙක් මම ජීවිතේට දැකලා නැහැ. මිනිහෙකුට කන්න දෙන්නෙත් නැහැ. බොන්න දෙන්නෙත් නැහැ. කථා කරන්නෙත් නැහැ. සල්ලි අනුමත කරලා දෙන්නෙත් නැහැ. බොරුවට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නමුත් තමුන්ට හිතවත් අයට දෙනවා.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ආණ්ඩුකාරයා දේශපාලනය කරන්න ගියාම කොහොමද කරන්නේ? මේ Diary යක් දීලා තියෙනවා. පළාත් සභා ඉතිහාසයේ කවදාවත් මෙහෙම දෙයක් වෙලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒක වුණේ ආණ්ඩුකාරයාගේ වැරැද්දෙන්.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ඒක වුණේ ආණ්ඩුකාරයාගේ වරද නිසා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිලකසිරි ඇමැතිතුමා, ඔබතුමා කථා කරනවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පුටුවට කෙළියා. පුටුවටත් කෙළ වුණා.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, ඒ කණ්ඩායමේ ලැයිස්තුවට මගේ නමත් කියැවුණා. ඒ නිසා මම කරුණු පැහැදිලි කිරීමක් කළ යුතුයි. මේ බස්නාහිර පළාත් සභා ඉතිහාසයේ යම් යම් පුද්ගලයෝ නම් නොකිව්වාට හිතවත්කම් වලින් වැඩ කරගත්තු යුග අනන්ත අප්‍රමාණ තිබුණා. එදා ඉඳලා මේ වනකනුත් ඒකයි සත්‍යය. පසුගිය අවුරුද්ද ඇතුළතම මට මාර්ගයක් හදා ගන්න මුදලක් ලැබුණේ, ජනවාරි මාසේ විතරයි. ගරු සභාපතිතුමනි, අපි කැබිනට් මණ්ඩලයේ යම්කිසි උමනාවකට ගිය වෙලාවේ ආණ්ඩුකාරතුමාට පැහැදිලි කළා, සර් අපි ඇමැතිවරුන් හැටියට, මගේ කෘෂිකර්මාන්තයෙන් දැන් මට පාරවල් හදන්නම බැහැ. සර් සල්ලි ටිකක් මේකට හොයා ගන්න ක්‍රමයක් නැද්ද? මහ ඇමැතිතුමා ළඟත් සල්ලි නැහැයි කියනවා කියලා. මම ඔයගොල්ලෝ සියලු දෙනාටම කියන්නම්. ඔයගොල්ලෝ ළඟ පාරවල් තිබෙනවා නම් මට ගෙනැල්ලා දෙන්න. මම කිව්වා සර් කොපමණ විතරද? තියෙන ටික අරගෙන එන්න. මේ කැබිනට් එක කැඳවපු වෙලාවේ කරපු ප්‍රකාශයක්. එහෙම කිව්වාම ගරු සභාපතිතුමනි, අපට වෙලාවක් දුන්නා. අපි ඇහුවා සර් මේක කොයි වෙලාවටද ගෙනැල්ලා දෙන්නේ කියලා. අහවල් දවසේ කියලා කිව්වාම උදේ වෙලාවක් දුන්නා. උදේ 10.00 ට ගෙනැල්ලා දෙන්න කිව්වාම, උදේ 10.00 ට හිටියේ මම පමණයි. මම ගිහිල්ලා අපේ ආණ්ඩුකාරතුමාට ලිපිය නිකුත් කළාම ඒ වෙලාවේම ලේකම්තුමාට නියෝගයක් නිකුත් කළා වහාම මේ කටයුත්ත ඉෂ්ට කරන්න කියලා. ඒ අනුව මිසක් අපි මේ ද්වේශ සහගතව - අපිත් ආසයි අපේ මැතිවරණ කොට්ඨාශවලට වැඩ කරන්න. අපේ මැතිවරණ කොට්ඨාශයේ - පොඩ්ඩක් ඉන්න කියනකල්. පොඩ්ඩක් ඉන්න. ඉතිහාසයේ මේ වාගේ දේවල් ඕනෑ තරම් සිද්ධ වුණා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

දැන් මෙරිල්ට දීලාම නැද්ද? ඒ කියන්නේ මෙරිල් මන්ත්‍රීතුමාට දීලාම නැද්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේ අහන්න.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ගරු ඇමැතිතුමා -

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මට කථා කරන්න දෙන්න.

**ගරු සුනිල් ජයමිණි**
Hon. Sunil Jayamini

ආණ්ඩුකාරයාට කඩේ ගියා. කවදාවත් ආණ්ඩුකාරවරු පාරවල් හදන්න සල්ලි දීලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මුදල් මූලාශ්‍රය මොකක්ද කියලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් මෙතුමාට කථා කරන්න දෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේ තරම් අසාධාරණ වැඩක් කරලා -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කථා කරන්න අවස්ථාවක් දෙන්න. එතුමාට පැහැදිලි කිරීමක් කරන්න දෙන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අද ආණ්ඩුකාරතුමාට හැම එකාම බනිනවා. ඒක වෙනම දෙයක්. ආණ්ඩුකාරයා ගියාට පස්සේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ප්‍රසන්න රණතුංගගේ කාලයේ කොහොමද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මගේ ඉතිහාසයේ මේ අවුරුදු -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ප්‍රසන්න දුන්නේ කාටද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අපි කොහොමද ඉන්නේ? ඒ අනුව තමයි අපි පාරවල්වලට ඉල්ලීමක් කළේ. අපි දන්නේ නැහැ කොහෙන්ද සල්ලි හම්බ වෙන්නේ කියලා. මහ ඇමැතිතුමාගෙන් ගන්න බැහැ නේ? මහ ඇමැතිතුමා ළඟ සල්ලි නැහැ. ඒ අනුව තමයි එතුමා ඒක කළේ. ගෙනැල්ලා දෙන්න කිව්වාම අත්සන් කරලා දුන්නා. අපි ඊට වඩා දෙයක් කරලා නැහැ. තමුන්නාන්සේට තමුන්නාන්සේගේ -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ආණ්ඩුකාරවරුන්ට කොහොන්ද සල්ලි?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

දෙන නොදෙන එක වෙනම දෙයක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේකට පරීක්ෂණයක් කරන්න ඕනෑ.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

මේවා අපි කළේ අපේ මැතිවරණ කොට්ඨාශය තුළ අපට අයිති වෙලා තිබුණු පාරවල් හදන්නයි. පාරවල් ගණනාවක්ම ඉල්ලුවා. ඇස්තමේන්තු කළා. මුදල් දෙන්න විතරයි තිබුණේ. විරෝධතාවය තමුන්නාන්සේලා යොමු කළාට ප්‍රශ්නයක් නැහැ. අපි කළේ ජනතාව වෙනුවෙන් වැඩක් මිසක්, අපේ ගෙදර ගෙනියන වැඩක් නොවෙයි. කැඟහන්න ඕනෑ තරම් ඉන්නවා. ඒක අසාධාරණ වැඩක්. තමන්ට කරගන්න -

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

අපිත් ගෙදර ගෙනියන්නද?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

දැන් මහ ඇමැතිතුමා ඔක්කෝම පාරවල් හැදුවාට මට පුළුවන්ද ?

**ගරු රජිත හපුආරච්චිගේ**
Hon. Rajitha Hapuarachchige

ගෙදර ගෙනියන්නද අපිත් කරන්නේ? අපිත් කරන්නේ ජනතාවට තමයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, අපටත් විනාඩියක් දෙන්න.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමා තනියම බෙදා ගන්න එකයි වැරැද්ද.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම මේ ගැන විවාදයකට යන්න අවශ්‍ය නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, ඇමැතිතුමා ගැන මම ලැජ්ජ වෙනවා. ඇමැතිතුමාගේ අයවැය යෝජනාව සම්මත කරන්න ගිහිල්ලා වැන්දේ නැති එක විතරයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම සඳහන් කරන්නේ

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ සභාවට කියන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මේක සම්මත කරලා දෙන්න කියලා. අපි නැත්නම් මේ ගිය වැඩ පිළිවෙළ -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

මුදල් කොහෙන්ද ආවේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

විරුද්ධව දෙන්න හිටපු මිනිස්සු -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි දැනගෙන හිටියා ගරු සභාපතිතුමනි, ඒ කාලේත් හිතෙන හිතෙන විධියට සල්ලි වියදම් කළා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි මේ අය ගැන විශ්වාස කරලා සාධාරණ විධියට ඡන්දය අනුමත කරලා, පළාත් සභාව දිනලා දුන්නා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ කාලෙත් හිතෙන හිතෙන විධියට සල්ලි වෙන් කළා. අද මේ104 දෙනා -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි හිතුවේ නැහැ මේ වාගේ බලු වැඩ කරයි කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කරුණාකරලා අපට කියන්න කොහොන්ද මුදල් දුන්නේ කියලා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එහෙම මුදලක් බෙදනවා නම් සාධාරණව බෙදන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි මේ ගැන දිගින් දිගටම කථා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ආණ්ඩුකාරතුමා ළඟට ගිහිල්ලා, හොරෙන් ලියුම් අත්සන් කරලා, පාරවල් හදන්න හොරෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේක දිගන් දිගටම -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඇමැතිවරුන්ට, නිලධාරීන්ට වැඩ කරන්න මේකේ අවස්ථාවක් දුන්නේ නැහැ. අපි දුන්නේ කාත් එක්කත් සාධාරණව වැඩ කරන්න. හොරෙන් ගිහිල්ලා මුදල් අරගෙන -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

හොරෙන් කෑවා, වාගේ තවත් කන්න හදන්නේ මේ පළාත් සභාවෙන්. වහාම ඔය ලියුම් ටික ඉවත් කර ගන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, මේ නිලධාරීන්ගේ කාමරයේ ප්‍රධාන ලේකම් ඉන්නවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔය ලියුම් ටික සේරම -

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කරුණාකර අහලා, අපට මේ සභාවට දැනුම් දෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

නැතුව මේ එක එකාට හොරා කන්න මේ පළාත් සභාවේ මුදල් දෙන්න බැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ප්‍රධාන ලේකම්තුමා මේ කාමරයේ ඉන්නවා. සල්ලි කොහෙන්ද කියලා මූලාශ්‍රය කියන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ලේකම්තුමාට කොහොමද නියෝග නිකුත් කළේ? අපට ඒක දැනගන්න ඕනෑ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අයවැයේ නැති මුදලක්ද මේ දෙන්නේ? අනුමත කරලා නැති මුදලක්ද දෙන්නේ? ආණ්ඩුකාරයා ගෙදරින්ද ගේන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි,

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කරුණාකර මේ සභාවට දැනුම් දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරතුමාගේ අයවැයේ මාර්ගවලට මුදල් වෙන් කරලා නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කොහෙන්ද අවිස්සාවේල්ලට කෝටි 4 ක් ගියේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මාර්ගවලට මුදල් වෙන් කරලා නැහැ. කොහෙන්ද සල්ලි දෙන්නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ආණ්ඩුකාරයාට කොහෙන්ද මුදල් තියෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට Vote එකක් නැහැ. මමත් ඒක දන්නවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා ප්‍රධාන ලේකම්ගෙන් අහලා මේ සභාවට දැනුම් දෙන්න, මුදල් මූලාශ්‍රය කොහෙන්ද පාවිච්චි කරන්නේ කියලා. කොහෙන්ද සල්ලි ගේන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුදල් දීලා නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේ සභාවේ සභා සමුම්තියක් කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, දැන් ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමා කියන විධියට හේම කුමාර නානායක්කාර සර් එහෙම කළා නම් අසාද් සාලි සර් අපි ඉල්លුවොත් දෙයිද දන්නේ නැහැ නේද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරු 104 දෙනා නියෝජනය කරන කෙනෙක් හැටියට මම කියන්නේ මේ හිටපු මහ ඇමැතිවරු තමන්ට ඕනෑ, ඕනෑ විධියට, තමන්ට වාසි ලැබෙන විධියට මේ මුදල් වියදම් කළා. මේ 104 ගැන දැනුයි කථා කරන්නේ. මෙහෙම වෙන් කරපු සල්ලි සියල්ලම Cancel කරන්න පුළුවන්, සභාවේ සම්මුතියක් දාලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්, පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

104 ටම දෙනවා නම්, අපිත් අත උස්සනවා. ඕක හරියට බෙදුණා නම් හරි. ඒ ගත්තු තීන්දු සියල්ලම Cancel කරන්න කියලා. ඒවා අවලංගු කරන්න කියලා සභාවට යෝජනා කරන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගම්පෙරළියත් එහෙම එවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා මන්ත්‍රීතුමන්ලා -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, දැන් මේ ආණ්ඩුකාරතුමාගේ Photo එක තියෙනවා. දැන් අවුරුද්ද පුරාම නැති ආණ්ඩුකාරයෙක්ගේ Photo එක තමයි අපේ Diary එකේ දාගෙන ඉන්න වෙන්නේ. ඒක නිසා මේක අපි ඉරලා දානවා. මේ ඉරලා දානවා. අපට ආණ්ඩුකාරයා වැඩක් නැහැ. අපේ විදේශ අධ්‍යයන සංචාර නැවැත්තුවා. ඒ වාගේ අය වැඩක් නැහැ. මේහෙත් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මේකත් ඉරනවා. මොකද, දන්නවාද? රජයේ නීති උල්ලංඝණය කරපු කෙනෙක්. මෙයාට අපි ජනාධිපති කියලා කියන්නේ නැහැ. අපි අද ශෝක දිනයක් ප්‍රකාශයට පත් කරනවා. මෙතුමා නීති උල්ලංඝණය කරපු කෙනෙක්. අපි මෙයාවත් ඉරලා දානවා. තමුන්නාන්සේලාට අපි කියනවා කොන්ද කෙළින් තියෙනවා නම් මේකත් ඉරන්න කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔයගොල්ලෝ නේ ගෙනාවේ. අපියැ ගෙනාවේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කවුද පත් කළේ? ඡන්දයෙන් පත් කළේ කවුද?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපි ද පත් කළේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කවුද ඡන්දය දීලා පත් කළේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දිට්ටධම්මවේදනීය කර්මය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාරතුමාගේ Photo එක ඉරනවා නම් ඒත් එක්කම ඔබතුමාගේ Photo එකත් ඉරෙනවා. මහ ඇමැතිතුමාගේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇයි ඒ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. ඒක ඉරන කොට එතුමාගේ Photo එකත් ඉරෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නැහැ, නැහැ. එතුමා ඉරෙන්නේ නැහැ. මේ ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

Photo එක එකට තියෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නැහැ, නැහැ. මේ ඉන්නේ. ඔබතුමාට ඇස් පේනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඇස් පේනවාද? ඒක ඉරන්නේ නැහැ අපි. ඔබතුමා ඉන්නවා. ඉරන්නේ නැහැ. අපේ මහ ඇමැතිතුමා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, අර රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය අද ඉරාපු පින්තූරය අපි ඉරුවේ 2015 දී. 2015 ජනවාරි 08 තමයි ඒ පින්තූරේ අපි ඉරලා දැම්මේ. ඒ නිසා, ඒක අපට අදාළ නැහැ. ආණ්ඩුකාරතුමා මුදල් සොයා ගත්තු මුදල් මූලාශ්‍රය කරුණාකරලා මේ සභාවට හෙළිදරව් කරන්න. ප්‍රධාන ලේකම්තුමා මේ නිලධාරි කාමරයේ ඉන්නවා. කරුණාකරලා කියන්න කොහොමද ආණ්ඩුකාරයා මුදල් දෙන්නේ කියලා. ගෙදරින් ගෙනාපුවාද? ගාල්ලෙන් ගෙනාපුවාද? දකුණෙන් ගෙනාපුවාද? කියලා. මේ සභාව ආණ්ඩුකාරයාට මුදල් අනුමත කළේ නැහැ. මේකේ මුදල් බලය තිබෙන්නේ ප්‍රධාන ඇමැතිතුමාට. ඒ නිසා ප්‍රධාන ලේකම්තුමාගෙන් අහලා කරුණාකරලා මේ සභාවට දැනුම් දෙන්න කොහෙන්ද මුදල් මූලාශ්‍ර සොයා ගත්තේ කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ප්‍රධාන ලේකම් මොනවා කරන්නද? ලියුමක් විතරයි. කොළ කෑල්ලක් එවලා තියෙන්නේ. මුදල් නැහැ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඇස්තමේන්තු කරන්න දීපු නිසා ඇස්තමේන්තු කරලා තියෙන්නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මහ ඇමැතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජනක වැලිවත්ත ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අනෙක් අයටත් අවස්ථාවක් දෙන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මම ඉල්ලීමක් කරනවා මේ සභාවේ ගරුත්වය ආරක්ෂා වන ආකාරයට කටයුතු කරන්න කියලා. හැමෝම නිකම් මාළු කඩේක වාගේ කෑගහන්නේ නැතුව එක් එක්කෙනා තනියම තමන්ගේ අදහස් ප්‍රකාශ කරන කොට අනෙක් මන්ත්‍රීවරු නිශ්ශබ්දව ඉඳලා තමන්ගේ අවස්ථාවක් අරගෙන කථා කරනවා නම්, මීට වඩා හොඳයි කියලා යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මේක උසාවිය නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේ ප්‍රශ්නය පිළිබඳව මම පොඩි පැහැදිලි කිරීමක් කරනවා. මොකද, මගේ නමත් කියැවුණු නිසා. ඒක මම කියන්න එපැයි. නැත්නම් හොඳ නැහැ නේ? මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයෙන් යම්කිසි මුදලක් වෙන් කිරීමට - ඇමැති මණ්ඩලය ගිය වෙලාවක, මම හිතන්නේ මහ ඇමැතිතුමා දන්නේ නැතුව ඇති. ගාමිණී තිලකසිරි ඇමැතිතුමා එක්ක, සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමන්ලා ගිහිල්ලා ඔය කාරණාව කියලා තිබෙනවා. දුක් ගැනවිල්ලක් කියලා තියෙනවා. පස්සේ එතුමා හොයලා බලලා කියලා තිබෙනවා PRD එකේ සල්ලි තියෙනවා නම් දෙන්නම් කියලා. ඒ අනුව තමයි ඇමැතිවරුන්ට උපදෙස් දුන්නේ යෝජනා ඉදිරිපත් කරන්න කියලා. ඒ අනුව ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමයි, සුමිත් ලාල් මැන්දිස් ගරු ඇමැතිතුමයි යෝජනා ඉදිරිපත් කළා. පස්සේ මටත් මේ ආරංචිය ආවා. ඊට පස්සේ මමත් කිව්වා ගරු ආණ්ඩුකාරතුමා, ඔබතුමා සල්ලි වගයක් දෙනවාද? කියලා. ඔබතුමාත් එහෙම නම් යෝජනා දෙන්න කියලා ආණ්ඩුකාරතුමා කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපටත් දැනුම් දෙන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා දැන ගත්තා නම් සභාවට කියන්න එපැයි. අනෙක් මන්ත්‍රීවරුන්ටත්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා අපෙත් සභාපති. ඔබතුමා අපෙත් සභාපති. සමාන වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා හැමෝටම කිව්වාද කියලා මම දන්නේ නැහැ නේ?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් තමයි අපි ආරක්ෂාව ඉල්ලන්නේ. ඔබතුමා දැනගත්තා නම් අපට කියන්න ඕනෑ. සභාවට කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතුවේ එතුමාට හැමෝටම කියන්න ඇති කියලා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඔබතුමා තනියම අත්සන් කර ගත්තු එක ඉතා වැරැදියි නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මහ ඇමැතිට කියන්න බැරි දේ බලල්ලු ලවා කොස් ඇට බාවනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම හිතන්නේ මේ මුදල් ටික PRD එකෙන් මෙතුමාට තමයි යොමු කරලා තිබෙන්නේ. නමුත් මේකේ මුදල්

නැහැ. මම එතුමාගෙන් පස්සේ ඇහුවා. දැන් මේකේ මුදල් නැහැ. ඇත්ත වශයෙන්ම ලියකියවිල්ලක් විතරයි. මුදල් අනුමත කිරීමක් කරන්න මුදල් නැහැ. එහෙම නැත්නම් මහ ඇමැතිතුමා මුදල් දෙන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඇමැතිතුමා සල්ලි ටික වියදම් කළා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එහෙම නම් ඔබතුමා ප්‍රධාන ලේකම්තුමාට නියෝගයක් දෙන්න, ඒ කඩදාසි සියල්ල විසික් කරන්න කියලා. ප්‍රධාන ලේකම්තුමාට කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි ප්‍රධාන ලේකම්තුමා මට පේන්න ඉන්නවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, අපේ මහ ඇමැතිතුමා හරහා ආණ්ඩුකාරයාගේ තිබෙන Vote එක අයින් කරන්න මේ සභාවට යෝජනාවක් ගෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට මේ සභාවේ අනුමැතිය අනුව තමයි වැඩි ඡන්දයෙන් අනුමත වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් න්‍යාය පත්‍රයට යමු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, අපි ඔබතුමා කියපු දේට විරුද්ධයි. මොකද, ඔබතුමා ලිපිය ලියලා තිබෙන්නේ,

බස්නාහිර පළාත් සභාවේ ගරු අමාත්‍ය මණ්ඩලය සතු සියලු වරප්‍රසාද සහ පහසුකම් මා වෙත හිමි වන නමුත් ප්‍රතිපාදන, රැකියා අවස්ථා ලබා දීමේදී මා හට ලැබෙනුයේ මන්ත්‍රීවරයෙකුට හා සමාන පහසුකම්ය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව් ඉතින් මට ලැබුණේ නැහැ නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙම තත්ත්වය පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කොට ඉදිරියේදී මාද මැතිවරණයට ඉදිරිපත් වන නිසා - අනෙක් අය නැද්ද? මාද මැතිවරණයට ඉදිරිපත් වන නිසා මේ ආයතන විසින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඇත්ත නේ? බොරුවක් නොවෙයි නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා ඉදිරිපත් කරන ලද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත නේ ඉතින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමා විතරක් නොවෙයි ඡන්දයට ඉදිරිපත් වෙන්නේ. අපිත් ඡන්දයට ඉදිරිපත් වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලියවිල්ල සභාගත කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතකොට අනෙක් මන්ත්‍රීවරුන් මැතිවරණයට ඉදිරිපත් වෙන්නේ නැද්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා එය ලියවිල්ල සභාගත කරනවාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාගත කරනවා.[1]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔය කථා කළාට හැමෝගෙම කිල්ලෝටවල හුණු තියෙනවා හොඳේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මාර්ගය සංවර්ධන අධිකාරිය හෝ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමහරු පසුගිය කාලයේ කෝටි ගණන් ගත්තා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරි. ගන්න ක්‍රමවේදයක් තියෙනවා.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඕවා කියන්න කෝ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අමාත්‍යාංශයට ගිහිල්ලා ගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපට විතරක් ඇඟිල්ල දික් කරන්න එපා. මේක මේ සභාපතිවරුන්ටයි, ඇමැතිවරුන්ටයි -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කවුද ගත්තේ කියලා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කථා කරන්න එක අසාධාරණයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, උපදේශක කාරක සභාවට සම්බන්ධ වෙලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමහරු එක එක හිතවත්කම්වලට මුදල් වෙන් කර ගත්තාම. ඒකට අපි මුකුත් කියන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ව්‍යාපෘතිවලට මුදල් ගත්තාට කමක් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

සමහරු කියන එකේ අර්ථය දැන් තමුන්නාන්සේ පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ ගැන මුකුත් කියන්න යන්නෙත් නැහැ. තමුන්ගේ හැකියාව මත සමහර මන්ත්‍රීවරු යම් යම් අමාත්‍යාංශවලින් මුදල් වැඩිපුර ගත්තා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

එතකොට හුඟක් දේවල් හොරෙන් සිද්ධ වෙලා තියෙනවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අමාත්‍යාංශවල අමාත්‍යවරු හම්බ වෙලා, උපදේශක කාරක සභාවට ගිහිල්ලා, ව්‍යාපෘති ඉදිරිපත් කරලා සල්ලි ගත්තාට කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් නැහැ. ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ වාගේ හොරෙන් ගිහිල්ලා තමුන්ට විතරක් සල්ලි ගත්තා නම් ඒක වැරැදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොරෙන් ගිහිල්ලා නොවෙයි මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. එහෙම ප්‍රකාශ කරන්න එපා. හොරෙන් ගිහිල්ලා නොවෙයි.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

සල්ලි ඔක්කෝම එකතු කරලා වියදම් කළා නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක නීති විරෝධියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක අමතක කරමු. ප්‍රධාන ලේකම්තුමා අපට ඒ ගැන -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේකේ සදාචාරයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම විවාද කරන්න මේක වැදගත් කාරණාවක් නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, සදාචාරයක් තියෙන්න ඕනෑ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රයට යන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තමුන්නාන්සේ කවදාවත් නොකරපු විධියට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම, නම් කියන්නේ නැහැ. ඉතිහාසයේ ඕනෑතරම් සල්ලි ගත්තා

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ආණ්ඩුකාරතුමාට මුදල් බෙදන්න බැහැ. ආණ්ඩුකාරතුමා මුදල් බෙදන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතිහාසයේ එක එක දේවල්වලට, සමහර ආසනවලට කෝටි ගණන් මුදල් ගත්තා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මහ ඇමැතිතුමා සල්ලි බෙදුවේ පොහොට්ටුව Balance කර ගන්න. මහ ඇමැතිතුමා සල්ලි බෙදපු විධියට අපි කවුරුත් දන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා ඕවා කථා කරන්න ගියොත් එහෙම -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පත් කරපු ආණ්ඩුවට නොවෙයි නේ දුන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාර්තාවක් ගන්න පසුගිය කාලේ මුදල් දුන්නේ කාටද කියලා ඉවර වෙලා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, හිටපු ආණ්ඩුකාරතුමා පළාත් සභාව සම්පූර්ණයෙන්ම අප්‍රසාදයට පත් කරපු ක්‍රමයක් ගෙන ගියේ. මොකද, පළාත් සභාවේ සම්පූර්ණ මූල්‍ය පාලනය තිබුණේ, ප්‍රධාන ඇමැතිතුමා යටතේ. ඒ තියෙද්දී අනවශ්‍ය ආකාරයෙන් ලේකම්තුමාට ලියුම් ඉදිරිපත් කරලා, පළාත් සභා ක්‍රමය සම්පූර්ණයෙන් විනාශ කරන, පළාත් සභාවට බලපෑම් කරන අනවශ්‍ය ක්‍රමයක් තමයි එතුමා කළේ. ඒ නිසා මම පළාත් සභා මන්ත්‍රීවරු වෙනුවෙන් ඉතාමත් සන්තෝෂ වෙනවා. මෙතුමා තවදුරටත් ඉස්සරහාට හිටියා නම් මේ ඉදිරි කාලය තුළ සහ පළාත් සභාව විසිරෙව්වාට පස්සේ පළාත් සභාවත් විකුණන්න පුළුවන්. ඒ නිසා එතුමාගේ බලය පාවිච්චි කරලා මේ කරපු වැඩේ, පළාත් සභා සම්ප්‍රදායට විරුද්ධව කිහිප දෙනෙකුට විතරක් අල්ලස් දීම තුළ මෙතුමාගේ ධූරය නැති වීම ගැන මම පළාත් සභා මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉතාමත් සන්තෝෂ වෙනවා. ඇත්තටම සන්තෝෂ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රධාන ලේකම්තුමා, ඔබතුමා අපට ඒ පිළිබඳව වාර්තාවක් ලබා දෙන්න. මුදල් වෙන් වුණාද, නැද්ද, ක්‍රියාත්මක වුණාද කියලා ඊළඟ සභාවට වාර්තාවක් ලබා දෙන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් න්‍යාය පත්‍රයට යමු නේද?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. තවලම්පිටිය විද්‍යාලයේ දෙම්පියෝ පිරිසක් අද මම එනකොට මාව හම්බ වුණා. මේක බස්නාහිර පළාත් සභාව වග කියන්න ඕනෑ ප්‍රශ්නයක් ගරු සභාපතිතුමනි. මීට අවුරුදු දෙකකට කලින් තවලම්පිටිය වර්තමාන විදුහල්පතිතුමා ගැන කලාප කාර්යාලයෙන් විමර්ශනයක් කරනවා. කලාප කාර්යාලයෙන් කරන ඒ විමර්ශනය අනුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට නිර්දේශ එවනවා. මේ විදුහල්පතිවරයා තවදුරටත් මේ විදුහලේ සේවය කිරීම සුදුසු නැහැ. ඒ නිසා මේ විදුහල්පතිවරයා මේ විදුහලෙන් මාරු කරලා, විදුහල්පති තනතුරේ ශ්‍රේණිධාරියෙක් වුණත් ඉවත් කරලා, උප විදුහල්පති තනතුරකට යවන්න කියලා. ගරු සභාපතිතුමනි, දරුවෙක් අඹ ගහකට ගලක් ගහලා මේ විදුහල්පතිවරයාගේ වාහනය කැඩුණා කියලා 1 වසරේ දරුවෙකුට විරුද්ධව පොලීසි ගිය විදුහල්පතිවරයෙක්. 1 වසරේ දරුවෙකුට විරුද්ධව පොලීසි ගිය විදුහල්පතිවරයෙක්. හැමදාම මූල්‍ය වංචා සිද්ධ වෙනවා. අදත් දෙමව්පියන් ඇවිල්ලා මට කථා කරලා කිව්වේ, දැන් 1 වසරට ළමයින් භාර ගන්න රුපියල් 2500/- ක් මේ විදුහල්පතිවරයා ඉල්ලනවා කියලා. මේ පළාත් සභාවේ මම මීට කලිනුත් ඒ පිළිබඳව කථා කළා. ඊත් එක්කම කලාප අධ්‍යක්ෂතුමා විමර්ශනය කරලා ඒක අපේ නෝනිස් මහත්තයා හරහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා හරහා අමාත්‍යාංශ ලේකම්තුමාට යවනවා, විමර්ශනය අනුව මේ විදුහල්පතිවරයා ස්ථාන මාරු කරන්න කියලා. අමාත්‍යාංශ ලේකම්වරයාට තමයි මේක කරන්න පුළුවන්. මම අධ්‍යාපන ඇමැතිතුමාට කථා කළා. අධ්‍යාපන ලේකම්තුමාට කථා කළා. මේ දෙන්නම බීරෝ වගේ ඉන්නේ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, වරප්‍රසාදයක් කියන්නේ, මෙතුමියගේ වරප්‍රසාදයක් ගැන කථා කරන්න කියන්න. නිලධාරීන්ගේ වරප්‍රසාද කථා කරන්න මෙතැන අයිතියක් නැහැ. ඔබතුමිය ඉදිරිපත් කරන්න. මේක පෞද්ගලික -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දරුවෝ සම්බන්ධ ප්‍රශ්නයක් නේ?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

න්‍යාය පත්‍රයට පටහැනියි. එහෙම දෙන්න බැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මම හිතන්නේ ඒකයි නීතිය.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පෞද්ගලික වරප්‍රසාද නොවෙයි නේ?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමා පොඩ්ඩක් කල්පනා කරලා කටයුතු කරන්න. අපේ පක්ෂය කථා කරන කොට එක විධියකටයි, ආණ්ඩු පක්ෂය කථා කරන කොට වෙනත් විධියකටයි මේක බෙදන්න එපා. කථා කරන කොට සියලුම දෙනාටම නීතිය අනුව කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

තමන්ගේ මන්ත්‍රී ධූරයේ සේවය කරන්න, බාධාවක් වුණොත් විතරයි වරප්‍රසාද.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාත් උදව් කරන්න. ඔබතුමාගේ ආසනයේ මන්ත්‍රීවරියක් කථා කරන්නේ. මම කිසිම මන්ත්‍රීවරයෙකුගේ පැත්තක් ගන්නේ නැහැ. දෙන්නම එකම ආසනයේ. ඔබතුමා, මෙතුමියට උදව් කරන්න.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක නොවෙයි අහන්නේ -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේක වැරදි පූර්වාදර්ශයක් වෙනවා ගරු සභාපතිතුමනි.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

කෝකිලා මන්ත්‍රීතුමියගේ වරප්‍රසාද කඩ වෙන්නේ කියන එකයි අහන්න ඕනෑ. ඒකයි අහන්න ඕනෑ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

නිලධාරියෙකුට චෝදනාවක් කරනවා නම්, ඒ නිලධාරියාට චෝදනා කරන්න. කලාප අධ්‍යක්ෂ ඉන්නවා. කමිටුවක් තියෙනවා. අපි මන්ත්‍රීවරු හැටියට මෙතැන චෝදනාවක් කරනවා නම්, ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔබතුමාගේ කථාව ඉවර නම් මට කථා කරන්න දෙන්න. මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ පළාතේ දරුවන්ගේ අධ්‍යාපනය ගැන මම කථා කරන්නේ. මම කථා කරන්නේ මගේ දරුවාගේ අධ්‍යාපනය ගැන නොවෙයි ගරු සභාපතිතුමනි. මගේ පළාතේ ජීවත් වන දරුවන්ගේ අධ්‍යාපනය ගැන. මේ පාසල අවුරුදු 05 ක් තිස්සේ - ළමයින් තුන්සිය ගණනක් ඉන්න පාසලක්. ඒ ළමයින් තුන්සිය ගණනක් ඉන්න පාසල අද දෙසිය ගණනට බැහැලා තිබෙනවා. දෙසිය ගණනට බහින්න ප්‍රධාන හේතුව ඒ පාසලේ විදුහල්පතිවරයා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීතුමිය සමාවෙන්න. වරප්‍රසාද ප්‍රශ්න යටතේ ඔබතුමියට ඕකට මට කාලය දෙන්න බැහැ. ඔබතුමිය මට වෙනම ප්‍රකාශයක් වශයෙන් ඉදිරිපත් කරන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ප්‍රකාශයක් නොවෙයි නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විශේෂ ප්‍රකාශයක් ගරු මන්ත්‍රීතුමිය.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

විශේෂ ප්‍රකාශයක් විධියට ඒක ගේන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතකොට කථා කරන්න පුළුවන්.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

වරප්‍රසාද උල්ලංඝණය කරන්න එපා. විශේෂ ප්‍රකාශ ඕනෑතරම් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියට මම අවස්ථාව දෙන්නම්. නොදී ඉන්නේ නැහැ. ඔබතුමිය පෞද්ගලික ප්‍රකාශයක් කරන්නේ. යම්කිසි රීතියක් තියෙනවා නේ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, හරි. මම කියන කාරණාව. දෙමව්පියන්ගේ ප්‍රශ්නයත් මගේ ප්‍රශ්නයක් වෙන්න බැරිද? මේ තියෙන්නේ ඒ සියලුම දේවල්. මේ පරීක්ෂණ වාර්තාව. මම මේක සභාගත කරනවා.[2]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේ වාගේ අවස්ථා අපි ඉල්ලුවාම ඔය විධියට දෙන්න වෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මේක මගේ වරප්‍රසාදයක් නොවෙයි කියන කාරණාව කියන්න එපා. මේක මගේ වරප්‍රසාදයක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මන්ත්‍රීතුමිය කියන විධියට කමිටුවට දාලා මේ කියන විධියට නිලධාරීන් වැඩ කරලා නැත්නම්, එතකොට ප්‍රශ්නයක් වෙන්න පුළුවන්.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

නිලධාරීන් මෙතැන ඉන්නවා. මෙතැන නිලධාරීන් ඉන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒ අයට යොමු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය ඕක එවන්න කෝ?

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

කමිටුවට යොමු කළා. ඊයේ කලාප කමිටුවේ කථා කළා. ඊයේ කලාප කමිටුවේ කථා කරලා මේක පැහැදිලි කළා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමියමයි දැම්මේ ඒ විදුහලිපතිතුමිය.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔය විධියට පාසල් ප්‍රශ්න කථා කළොත් හැමදාම වරප්‍රසාද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, මන්ත්‍රීතුමිය. ඔබතුමිය මට ඒ ටික එවන්න කෝ? අධ්‍යාපනය ගැන නම් ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, මේක සෙල්ලමකට ගන්න එපා. අදටත් මේ පාසල විනාශ කරනවා. මේ පාසල විනාශ කරනකල් නිලධාරීන් බලාගෙන ඉන්නවා. මම මෙතැන කථා කරන්නේ නැතුව වෙන කොහේද කථා කරන්නේ?

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඔබතුමියමයි ඒ විදුහල්පතිතුමියව දැම්මේ.

---
[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මගේ ගෙදර මිනිහත් එක්ක කථා කරන්නද? මට වෙන කථා කරන්න තැනක් නැහැ. මම වෙන කොහේද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමිය, මට තේරෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මේ ප්‍රශ්න විසඳන්න ඕනෑ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

පළාත් සභාවේ රීතිය අනුව කථා කළා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තේරෙනවා. අපේ ගම්පහ දිස්ත්‍රික්කයේම මේ ප්‍රශ්න තියෙනවා. බස්නාහිර පළාතේම තියෙනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගම්පහ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි. බස්නාහිර පළාතේම තියෙනවා. මම මේක සභාගත කරනවා. හැබැයි ඊළඟ සභාවට කලින් මට විසඳුමක් දෙන්න. බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපනය සම්පූර්ණයෙන් විනාශ කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ බස්නාහිර පළාතේම අධ්‍යාපනය සම්බන්ධයෙන් ඔබතුමිය කියන ප්‍රශ්නය තියෙනවා. හැමදාම කොහෙන් හරි මන්ත්‍රීවරයෙක් කථා කරනවා. ඔය කාරණාව ගම්පහත් තියෙනවා. හැමතැනම තියෙනවා. ඇමැතිතුමාත් අද නැහැ. ඕවා අහන්න කෙනෙක්වත් නැහැ නේ ඉතින්.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඇමැතිතුමා එන්නේ නැති එක අපේ ප්‍රශ්නයක් නොවෙයි සභාපතිතුමා. එතුමා එන්න දැනගන්න එපැයි. ඒක මට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. එතුමා දැන ගන්න ඕනෑ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමිය මට දෙන්න. ලේකම්තුමා ඉන්නවා. මට පේනවා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ලේකම්තුමා කරන්නේ නැහැ. මම පෞද්ගලික ලේකම්තුමාට කථා කළා. ලේකම්තුමා ඒක කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාට කථා කරමු මන්ත්‍රීතුමිය.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඔය නිර්දේශ ගිහිල්ලා තියෙද්දීත් ගරු සභාපතිතුමනි, එතුමා දෙවැනි වතාවටත් අහනවා, මේ ඔබතුමිය කියන දේ කරන්න ඕනෑද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඉතින් ඒක වැරැදියි. ලේකම්තුමා කරන්නේ නැත්නම් මම මේක කොහේද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මේ වරප්‍රසාද ප්‍රශ්නයට විනාඩි 07 ක කාලයක් ඔබතුමා දුන්නා. ඒ නිසා මීට පස්සෙත් මේ වාගේම විනාඩි 07 ක කාලයක් කථා කරන්න අපේ පක්ෂයත්, විපක්ෂ කණ්ඩායමත් ඉල්ලුවොත් වරප්‍රසාද ප්‍රශ්නයකට ඔබතුමා ඉඩ දෙන්න ඕනෑ. මම හරියටම බලාගෙන හිටියා. විනාඩි 07 ක් ඔබතුමා බලාගෙන හිටියා.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

විනාඩි 07 න් විනාඩි 04 ක් කථා කළේ ඔයා. විනාඩි 07 ක් නොවෙයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තමුන්නාන්සේට උපදෙස් දෙන්න බැහැ සභාපතිතුමාට. ඒක සභාපතිතුමාට ඕනෑ විධියට -

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

විනාඩි 03 ක් හෝ 04 ක් අපි කථා කරන්නේ අසාධාරණයට විරුද්ධව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම සභා රීති උල්ලංඝණය කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කවුරු හරි මන්ත්‍රීවරයෙක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් කියන්නේ ඔබතුමියට හෝ කවුරු හරි මන්ත්‍රීවරයෙකුට මේ සභාවට පැමිණෙන කොට වුණු ප්‍රශ්නයක්. මේ වාගේ පාසල් ප්‍රශ්න, වෙන වෙන ප්‍රශ්න මෙතැන කථා කරන එක සුදුසු නැහැ. අපි දැන් න්‍යාය පත්‍රයට යමු.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මම මෙපමණ කල් හිතාගෙන හිටියේ වෙන කෙනෙක් විරුද්ධයි කියලා. බලන කොට මෙපමණ දවසක් රැකලා තියෙන්නේ ඔබතුමා. මම ඕක ගිහිල්ලා ගමට කියන්නම්.

**ගරු හෙක්ටර් බෙත්මගේ - සභා නායකතුමා**
Hon. Hector Bethmage - Leader of the House

මෙයා තමයි යටින් වැඩේ දීලා තියෙන්නේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

එයා ඕක යට ඉන්න නිසා තමයි ඔය විධියට කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් න්‍යාය පත්‍රයට යමු.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් ගොඩක් කථා කළා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගොඩක් කථා කළා නේ මන්ත්‍රීතුමා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

විනාඩියක්. වරප්‍රසාද ප්‍රශ්නයක්. මේකට අදාළව නොවෙයි. මම පසුගිය වසරේ පළාත් සභාවේ අයවැයට ඉස්සෙල්ලා මේ සභාවෙන් කිහිප වතාවක්ම ඉල්ලා සිටියා, බස්නාහිර පළාත් සභාවේ සමූපකාර ඡන්දය තියන්න කියලා. ඡන්දය තියන්නේ නැහැ. දින වකවානු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආයෙත් සමූපකාරයට යනවා. පෞද්ගලික ප්‍රකාශයක් ඕක.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

වරප්‍රසාද, වරප්‍රසාද. සභාවට යෝජනා කරලා මම ඇහුවේ. දින වකවානු ඉදිරිපත් කරනවා කියලා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ විධියට සභාව යන්න බැහැ මන්ත්‍රීතුමා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, තවම දින වකවානු ඉදිරිපත් කරන්නේ නැහැ, ඡන්දය තියන්නේ කවද්ද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අලුත් අවුරුද්දේ පළමුවැනි සභාව. අපි සභාව පොඩ්ඩක් යමු.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සමූපකාර ඡන්දය තියෙන දින වකවානු ටික ඉදිරිපත් කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවක් මෙතුමාගේ තියෙනවා. ඉතාම වැදගත් යෝජනාවක් තිබෙනවා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඔක්කෝම නිලවරණ ඉවරයි. එදා පොරොන්දු වුණු විධියට ප්‍රශ්න කථා කරන කොට දින වකවානු ඉදිරිපත් කරනවා කිව්වා. දැන් මාස ගණනක් ගියා. තවම නැහැ. දින වකවානු ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටින්නේ. සමූපකාර ඡන්දය තියන්න. ඒකයි මම ඉල්ලා සිටින්නේ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි වාඩි වෙන්නම්. ලබන පාරත් මේ වරප්‍රසාද ප්‍රශ්නය මම ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ප්‍රශ්න සම්බන්ධව ගරු ඇමැතිතුමන්ලා මේ සභාවට උත්තරයක් දෙනවා නම් මට පහසු වෙනවා. මට මතකයි ගිය පාරත් ඔය සමූපකාර ප්‍රශ්නය එතුමා යොමු කළා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගිය පාර නොවෙයි. මාස පහක් තිස්සේ ඉල්ලන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිගින් දිගටම යන්න ගියොත් එහෙම -

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. 37 (1) යටතේ. ගරු සභාපතිතුමනි, අපි මාසයකට දෙපාරයි මේ සභාවට එන්නේ. කෝකිලා මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නය තියෙනවා. ඇයි අපි න්‍යාය පත්‍රය වෙනස් කරගෙන පැයක් හරි දෙකක් හරි මේ ප්‍රශ්න පිළිබඳ කථා නොකරන්නේ. අර විශේෂ ප්‍රකාශ විතරක් මදී. ඊට අමතරව වෙනත් කරුණු යටතේ මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් දෙන්න. අපි න්‍යාය පත්‍රය අලුත් කරලා හදමු. අනෙක් එක තමයි සවස 02.00 ට සභාව නවත්වන්න ඕනෑත් නැහැ. උදේ පටන් අරගෙන පැය දෙක තුනක් එහාට ගිහිල්ලා සභාවේ කාලය දීර්ඝ කරලා මේ ප්‍රශ්න කථා කරන්න කාලය ලබා දෙන්න. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, අපි මේ කරුණු හිතේ තියාගෙන එනවා. අපට මේවා කථා කරගන්න විධියක් නැහැ. පොඩි වෙලාවක් දෙන්න. අපි මීට වැඩිය සභාව ඉදිරියට අරගෙන යමු. සභාවේ කාලය දීර්ඝ කරමු.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, ඒක හරි. ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සභාවට ඇවිල්ලා හැම මන්ත්‍රීවරයෙකුටම කථා කරන්න අවස්ථාවක් දෙන්න. මෙතැනට ආවාට මාස ගණනකට අපට නැගිටලා වචනයක් කථා කර ගන්න අවස්ථාවක් නැහැ. උදේට ආවාම Group Meeting එක -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක හරි. ඒක හරි. ඒ යෝජනාව හොඳ යෝජනාවක්.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, දැන් මේ ප්‍රශ්නයක් ඇති වුණා. මට විශේෂ ප්‍රකාශයක් කරන්න පුළුවන්ද?

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

එක්සත් ජාතික පක්ෂයට තියෙන්නේ අවස්ථාවන් තුනයි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අද උදේ ඇති වුණු ප්‍රශ්නයට මට විශේෂ ප්‍රකාශයක් කරන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක සභා රීතිවල තිබෙන්නේ. මම තනියම හැදුවේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාවල රීති අනුව යන්න ඕනෑ. රීතිවලට ඇතුළත් කර ගන්න තිබුණා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මේ යෝජනා කරන්නේ ඉස්සරහා සභාවකට හරි හදමු කියලා. ඊළඟ සභාවකදී හරි මේක හරියට යන්න කටයුතු කරමු. අපි කාටවත් අවස්ථාවක් නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න මාර්ගයෙන් මේවා යොමු කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මන්ත්‍රීතුමිය කොහොමද ප්‍රශ්න මාර්ගයෙන් යොමු කරන්නේ. ඊයේ වුණු සිද්ධියක් අද ප්‍රශ්නයක් හැටියට දාන්න පුළුවන්ද? පෞද්ගලික ප්‍රකාශයක් හැටියට දාන්න පුළුවන්ද? මෝඩ කථා කියන්න එපා මන්ත්‍රීතුමිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් න්‍යාය පත්‍රයට යමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

යෝජනාවක් හැටියට දාන්න කෝ මේ සභාව අත්හිටුවන්න කලින්. යෝජනාවක් දාන්න කෝ හරියට අමාත්‍යාංශයේ වැඩ කරන්නේ නැත්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි දැන් න්‍යාය පත්‍රයට යමු. නැත්නම් කාලය නැතුව යනවා මන්ත්‍රීතුමිය. කෝකිලා හර්ශනී ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රශ්නයත් ලේකම්තුමාත් එක්ක පෞද්ගලිකව කථා කරන්නම්. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු රාශියක් අදහස් ප්‍රකාශ කළා ආණ්ඩුකාරතුමාගේ අර මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන්. ඒ නිසා මම ප්‍රධාන ලේකම්තුමාට අවශ්‍ය උපදෙස් දෙනවා, ඒ සම්බන්ධව අපට පැහැදිලි වාර්තාවක් ලබා දෙන්න කියලා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, ඒකට පොඩි දෙයක් එකතු කරන්න. ඒ වාගේම මේ මන්ත්‍රීවරු සියලුම දෙනා, එක එක්කෙනා ගත්තු ප්‍රමාණය වාර්තා කරන්න කියලාත් ඉල්ලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම්වලට දුන්නු ප්‍රමාණය දාන්න කියන්න. සමහර අය ඉදියි ලක්ෂ 500 ගත්තු අය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සමහර විට ලක්ෂ 700 ගත්තු අය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒක දාන්න. දානවා නම් සියලු මන්ත්‍රීවරු ගත්තු ගණන මේකට දාන්න. ආණ්ඩුකාරයාගේ එක විතරක් දාන්න එපා. ඔක්කෝම ටික දාන්න කියලා අපි ඉල්ලන්නේ. ඒක දාන ගමන් අනෙක් ඒවාත් දාන්න. දැන් ඔබතුමා කියනවා සමහර මන්ත්‍රීවරු දහස් ගණන්වලින් වැඩ කළාලු. ඇමැතිවරයෙක් හැටියට හම්බ -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එතකොට ජෝර්ජුත් අහු වෙනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

කවුරු, කවුරුද ගත්තේ කියලා. කෝටි ගණන් අපි අනුමත කළේ. අපි අතිරේක අයවැය දාලා කෝටි ගණන් අනුමත කළා. මන්ත්‍රීවරුන්ට කීයක් දුන්නාද කියලා දැන ගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ කියන එක ප්‍රධාන ලේකම්තුමාට ඇහෙනවා ඇති. උදේ පටන් ගත්තු ගමන් මන්ත්‍රීවරු රාශියක් පොඩි ප්‍රශ්න වගයක් යොමු කළා, ආණ්ඩුකාරතුමා මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන්. ඔබතුමා ඒ ගැන ඊළඟ සභාවට මට වාර්තාවක් දෙන්න. කොහොමද මුදල් වෙන් වුණේ? ක්‍රියාත්මකද? ක්‍රියාත්මක වෙන්නේ නැද්ද කියන එක මට පැහැදිලි කරන්න. ඒ වාගේම ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ අනුව 2018 වසරේ මන්ත්‍රීවරු 104 දෙනාට මුදල් ලබා දීපු ආකාරය පිළිබඳවත් මට වාර්තාවක් දෙන්න, සභාවට ඉදිරිපත් කරන්න. පැහැදිලිව මට වාර්තාවක් දෙන්න. ඔබතුමාගේ ඉල්ලීමට මම ස්තුතිවන්ත වෙනවා. එතකොට බලන්න පුළුවන් මොකක්ද කියලා ඉවර වෙලා. ඔබතුමා කියපු වාර්තාව මම ඊළඟ සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

බොහොම හොඳයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මුදල් ලැබුණු හැටි.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

පහු කරන්න එපා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පොහොට්ටුව රකින්න වැඩ කරපු විධිය බලාගන්න පුළුවන්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඇයි පොහොට්ටුවට ඔච්චර හය?

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

පොහොට්ටුවේ අපේක්ෂකත්වය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කියවන්නෙම පොහොට්ටුව ගැන. පුදුම භීතිකාවක් තියෙන්නේ පොහොට්ටුව ගැන.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි බය නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බය නැති නිසාද ඔච්චර පොහොට්ටුව ගැන කියවන්නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පළාත් සභාවක්. ඒක අමතක වුණාද? අපි පොහොට්ටුවේ එක වෙනම කථාවක්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එහෙම නම් කෑගහන්නේ නැතුව ඉන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි අදත් කියනවා පොහොට්ටුවේ කියලා.

**ගරු රෝස් ප්රනාන්දු**
Hon. Rose Fernando

එහෙම නම් ඇමැතිවරු -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒකේ ගැටළුවක් නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි මන්ත්‍රීවරු පාවා දුන්නේ නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මේක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පළාත් සභාවක්. එක්සත් ජාතික පක්ෂ පළාත් සභාව නොවෙයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මොනව කළත් අපි මන්ත්‍රීවරු පාවා දුන්නේ නැහැ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් තමයි ආවේ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

සභාපතිතුමාත් ඒකේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

සභාපතිතුමාටත් අයිතියක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපි නම් පොහොට්ටුවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉඩ දෙන්න. අපි න්‍යාය පත්‍රයට යමු. දැන් ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙනුත් අපේ සභා ලේකම්තුමා ඉන්නවා. ඔබතුමා ඒ ගැන ප්‍රධාන ලේකම්තුමා එක්ක සාකච්ඡා කරලා ඊළඟ සභාවට ඉදිරිපත් කරන්න. පැහැදිලි වාර්තාවක් මට දෙන්න, සභාගත කරන්න. මම ඒ වාර්තාව සියලුම මන්ත්‍රීතුමන්ලාට ඉදිරිපත් කරනවා. මම සභාවට ඉදිරිපත් කරනවා මුදල් ගත්තු හැටි කොහොමද, මුදල් වෙන් කළේ කොහොමද කියන එක.

# ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම
QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මාර්ග, ප්‍රවාහන ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට දීර්ඝ පිළිතුරක් තිබෙනවා. එම නිසා මම එම පිළිතුර සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

***01.***

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/75)***

***ප්‍රශ්නය :***

*අ. ගම්පහ දිස්ත්‍රික්කයේ සී/ස බෙම්මුල්ල විගොඩ සණස සමිතියේ සියලු දේපලවල වටිනාකම කොපමණද?*

***පිළිතුර:***

*අ. 2016.03.01 සිට 2017.02.28 දක්වා වූ විගණනයේදී 2017.02.28 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව මුළු වත්කම් රු.666,156,688.73 ක් වන අතර 2018.09.30 දිනට ප්‍රාග්ධන ගිණුම අනුව රු.829,047,446.07 වන අතර මෙම අගයන් ගිණුම් අනුව පෙන්නුම් කළ ද සත්‍ය වශයෙන්ම මෙම වටිනාකමට අදාළ මූල්‍ය තත්ත්වයක් සමිතිය සතුව නොමැත.*

***ප්‍රශ්නය :***

*ආ. ගම්පහ දිස්ත්‍රික්කයේ සී/ස බෙම්මුල්ල විගොඩ සණස සමිතියේ තැන්පත්කරුවන්ගේ කල් පිරුණුකල ගෙවන පොලී මුදල් ආපසු ලබා නොදෙන බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර:***

*ආ. 2018.09.30 දිනට මුළු තැන්පත් ප්‍රමාණය රු.750,483,433.87 ක් වන අතර මුළු ණය ප්‍රමාණය රු.669,790,318.37 ක් වන අතර ඉතිරි රු.80,693,115.50 ක මුළු මුදල් ප්‍රමාණය සඳහා වත්කම් ඇති බවට තහවුරු කර ගත නොහැකි වී ඇත. තැන්පත්කරුවන් විසින් තම මුදල් ඉල්ලා ඇති අවස්ථාවලදී අදාළ මුදල් ගෙවීම සමිතිය සිදු නොකරන බව තැන්පත්කරුවන් විසින් වාර්තා කර ඇති අතර සමිතියේ ද්‍රවශීලතාවයක් නොමැති බවත් අනාවරණය වී ඇත.*

***ප්‍රශ්නය :***

*ඇ. එකී සමිතියේ තැන්පත් කරන ලද මුදල් එහි සභාපතිගේ පෞද්ගලික සමාගමක් වන දීසායු නමින් පිහිටුවා තිබෙන සමාගම වෙත යොමු කරන බව ඔබතුමා දන්නේහිද?*

***පිළිතුර:***

*ඇ. ඔව්.*

*I. දීසායු හෝම්ස් ඇන්ඩ් ලෑන්ඩ්*
*II. දීසායු හෝල්ඩින්ස්*
*III. ඩී.එන්. කන්ස්ට්‍රක්ෂන්*
*IV. දීසායු*
*V. දීසායු කැපිටල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම*

*යන ආකාරයෙන් එක් එක් කාලවකවානු වලදී බාහිර ගිණුම් පවත්වාගෙන ගොස් ඇති බව විගණනවලදී අනාවරණය වී ඇති අතර උක්ත දීසායු කැපිටල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම හැර අනෙකුත් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන් ලිඛිත තොරතුරු නොමැති අතර වාචිකව අනාවරණය වූ කරුණු අනුව සභාපති එස්.ඒ.එස්.පී. සේනානායක මයා හා ලේකම්, ඩබ්.එම්.පී. ධම්මිකා නන්දනී මහත්මිය රන්බිම ලෑන්ඩ් ආයතනයේ හැර අනෙකුත් ආයතනවල අධ්‍යක්ෂ*

මණ්ඩලයේ සිටින බව අනාවරණය වී ඇත. එම ආයතන සඳහා සමිතියේ අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදන වලින් බැහැරව විශාල වශයෙන් ණය සමිතිය මගින් ලබා දීමට කටයුතු කර ඇත.

**ප්‍රශ්නය :**

ඇ. එකී සමිතියේ තැන්පත්කරුවන්හට ඔවුන්ගේ තැන්පතුවල අදාළ පොළිය හා සියලු මුදල් තැන්පත්කරුවන් විසින් ඉල්ලන ඕනෑම විටකදී ලබා දීමට හැකිද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

**පිළිතුර:**

ඇ. 2018.09.30 දිනට මුළු තැන්පත් ප්‍රමාණය රු.750,483,433.87 ක් වන අතර මුළු ණය ප්‍රමාණය රු.669,790,318.37 ක් වන අතර ඉතිරි රු.80,693,115.50 ක මුළු මුදල් ප්‍රමාණය සඳහා වත්කම් ඇති බවට තහවුරු කර ගත නොහැකි වී ඇත. තැන්පත්කරුවන් විසින් තම මුදල් ඉල්ලා ඇති අවස්ථාවලදී, අදාළ මුදල් ගෙවීම සමිතිය සිදු නොකරන බව තැන්පත්කරුවන් විසින් වාර්තා කර ඇති අතර සමිතියේ ද්‍රවශීලතාවයක් නොමැති බවත් අනාවරණය වී ඇත.

**ප්‍රශ්නය :**

ඉ. සමිතියේ මුදල් සභාපතිවරයා විසින් ඔහුගේ පෞද්ගලික සමාගම හරහා ඉඩම් මිලදී ගැනීම් හා විකිණීම් කටයුතු හා වෙනත් කටයුතු සඳහා යොදවන බව ඔබතුමා පිළිගන්නෙහිද?

**පිළිතුර:**

ඉ.

I. දීසායු හෝම්ස් ඇන්ඩ් ලැන්ඩ්
II. දීසායු හෝල්ඩින්ස්
III. ඩී.එන්. කන්ස්ට්‍රක්ෂන්
IV. දීසායු
V. දීසායු කැපිටල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම

යන ආකාරයෙන් එක් එක් කාලවකවානුවලදී බාහිර ගිණුම් පවත්වාගෙන ගොස් ඇති බව විගණනවලදී අනාවරණය වී ඇති අතර, වර්තමානයේදී දීසායු හෝම්ස් ඇන්ඩ් ලැන්ඩ් ආයතනයේ ගිණුම් රන්බිම ලැන්ඩ් නිමින් වන ගිණුමකට මාරු කර ඇත. අදාළ ගිණුම් තැබීම පිළිබඳ මූල්‍ය ලේඛන අනුව සඳහන් වන නමුත් ලබා ගන්නා ලද එම ණය මුදල්වලින් ඉඩම් මිලදී ගැනීම් හා විකිණීම් කටයුතු හා වෙනත් කටයුතු සිදු කරන්නේද යන්න සම්බන්ධයෙන් විගණනයේදී පරීක්ෂා නොකරන අතර සමිතිය විසින් බාහිර ගිණුම් ලෙස පවත්වාගෙන යනු ලබන ගිණුම් මොනවාද යන්නත්, එම ගිණුම්වල මූල්‍ය තොරතුරු මොනවාද යන්නත් පමණක් පරීක්ෂා කරනු ලබයි.

**ප්‍රශ්නය :**

ඊ. තම අභිමතය පරිදි කටයුතු කරමින් අදාළ තැන්පත්කරුවන්ට ඔවුන්ට හිමි මුදල නොගෙවීමට කටයුතු කරන අදාළ සභාපතිවරයාට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගයන් හා අදාළ තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කර දීමට ගනු ලබන ක්‍රියාමාර්ගයත් ඔබතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

**පිළිතුර:**

ඊ. බස්නාහිර පළාත් සමූපකාර ප්‍රඥප්තියේ 47(2) වගන්තිය අනුව සමිතියේ කටයුතු විමර්ශනය සඳහා විමර්ශන කණ්ඩායමක් පත් කර ඇති අතර එහිදී අනාවරණය වන කරුණු අනුව මූල්‍ය හානියක් සිදුව තිබේ නම් එම මුදල අය කර ගැනීම සඳහා ප්‍රඥප්තියේ 58 වගන්තිය අනුව කටයුතු කරනු ලැබේ.

1. 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරැදි පිළිබඳ පනත අනුව 2016.03.01 සිට 2017.02.28 දක්වා වන (වර්තමානයේ සිදුකරන ලබන විගණනය) විගණනයේදී අනාවරණය වන කරුණු අනුව සමිතියේ මුදල් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල තත්ත්වයන් අනාවරණය කර ගැනීම සඳහා පොලිස් අපරාධ විමර්ශන කාර්යංශයට පවතින තත්ත්වය විගණන වාර්තාවත් සමග ඉදිරිපත් කිරීමට නියමිතය.

***තැන්පත්කරුවන්ට සාධාරණය ඉටුකර දීම සඳහා පහත ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.***

1. *1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 40 වන වගන්තිය අනුව තැන්පතු ආපසු ගෙවීමේ නොහැකි තත්ත්වයක් සමිතියේ පවතින බව වාර්තා වී ඇති බැවින්, 2018.08.27 දිනැතිව තැන්පතු භාර ගැනීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට කටයුතු කර ඇත.*

2. *2018.10.05 දින සමිතියේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවා තැන්පත්කරුවන් හට කඩිනමින් මුදල් ලබා දීමට කටයුතු කරන ලෙසත්, අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදන වලින් බැහැරව ණය ලබා දී ඇති ආයතන, පුද්ගලයන් වෙතින් ණය මුදල් නොපමාව අය කර ගැනීමට කටයුතු කරන ලෙසත්, වර්තමානයේ රන්බිම ලෑන්ඩ් නමට ගිණුම්ගත කර ඇති ණය මුදල් අය කර ගැනීම සඳහා සැලැස්මක් සති දෙකක් තුළ ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදී. එහිදී රන්බිම ලෑන්ඩ් ආයතනයේ ශේෂ පත්‍රය ද ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.*

3. *නමුත් මේ දක්වා අදාළ සැලැස්ම හෝ ශේෂපත්‍රය ලබා දී නොමැති අතර 2018.11.15 දින නැවත සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවීමට කටයුතු කළ නමුත් එදින භාණ්ඩාගාරික, ලේකම් හා එක් අධ්‍යක්ෂවරියක් පමණක් සහභාගී වූ අතර අදාළ තැන්පත්කරුවන්ගේ මුදල් නොපමාව ගෙවීමට කටයුතු කරන ලෙසත්, සමිතිය සතු වත්කම් කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව විකිණීම් නොකරන ලෙසත්, රන්බිම ලෑන්ඩ් ආයතනයේ තිබෙන වත්කම් නොපමාව විකුණා සමිතියෙන් ලබාගෙන ඇති ණය මුදල් පියවීමට කටයුතු කරන ලෙසත් දන්වන ලදී.*

4. *එක් එක් තැන්පත්කරුවන් විසින් ලිඛිතව කර ඇති පැමිණිලි අනුව තැන්පත්කරුවන්ගේ මුදල් කඩිනමින් ගෙවන ලෙස දන්වා සමිතියේ සභාපතිවරයාට ලිපි යොමු කර ඇත.*

5. *සමිතියට ණය වාරික වශයෙන් අයවන මුදල් තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවීමට භාවිතා නොකර සමිතියේ කටයුතු සඳහා යොදා ගන්නා බවට පැමිණිලි ලැබීම හේතුවෙන්, මාසිකව එකතු වන ණය වාරික මුදල් දැනට පවත්නා ගිණුම්වල තැන්පත් නොකර, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත සී/ස විගොඩ සණස සමිතිය නමින් නව ඉතිරි කිරීමේ ගිණුමක් රජයේ බැංකුවක ආරම්භ කර තැන්පත් කිරීමට කටයුතු කරන ලෙස 2018.11.26 දිනැතිව සමිතියේ සභාපතිවරයා වෙත දන්වා ඇත.*

***ප්‍රශ්නය :***

*උ. නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර:***

*උ. අදාළ නොවේ.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එම ප්‍රශ්නයේ දීර්ඝ පිළිතුරක් තිබෙනවා. ඔබතුමාට අවස්ථාවක් අවශ්‍යද? මොකක්ද හරි අහන්න තියෙනවාද? ඒ කාරණාව සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්නයක් තිබෙනවා නම් ඔබතුමා යොමු කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මට අතුරු ප්‍රශ්න අහන්න මේක නැවත අධ්‍යයනය කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් Study කරලා එන්න. මම ලබන පාර අවස්ථාව දෙන්නම්. හරි. බොහොම ස්තූතියි. ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඊළඟ ප්‍රශ්නයත් එහෙමයි. ඒකත් දීර්ඝ විස්තරයක් තියෙනවා කියලා ඇමැතිතුමා මට කිව්වා. ඒ ප්‍රශ්නයත් එතුමාටමයි තියෙන්නේ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

**02.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/18/76)**

*ප්‍රශ්නය :*

*අ. ගම්පහ දිස්ත්‍රික්කයේ සී/ස බේමුල්ල විගොඩ සණස සමිතියේ වර්තමාන සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් මොනවාද? යන්නත්, ඔවුන් වෙනත් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ ප්‍රධාන තිලයක් දරන්නේද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද?*

*පිළිතුර:*

*අ. වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය*

1. *එස්.ඒ.එස්.පී. සේනානායක - සභාපති*
2. *කේ.සී. ජගත් කුමාර - උප සභාපති*
3. *ඩබ්.එම්.පී. ධම්මිකා නන්දනී - ලේකම්*
4. *වයි.ඒ. ස්වර්ණා ශාන්ති කුමාරි - භාණ්ඩාගාරික*
5. *ජේ.බී.එල්.කේ. ජයසූරිය - අධ්‍යක්ෂක*
6. *පී.ඒ.එච්.එන්. වික්‍රමසිංහ - අධ්‍යක්ෂක*
7. *ඩබ්.ඒ. ශ්‍රියානි විජේසූරිය - අධ්‍යක්ෂක*

*දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විගණනයන්හිදී බාහිර ගිණුම් ලෙස පවත්වාගෙන ගොස් ඇති ආයතන පහත පරිදි වේ.*

I. *දීසායු හෝම්ස් ඇන්ඩ් ලැන්ඩ්*
II. *දීසායු හෝල්ඩින්ස්*
III. *ඩී.එන්. කන්ස්ට්‍රක්ෂන්*
IV. *දීසායු*
V. *දීසායු කැපිටල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම*
VI. *රන්බිම ලැන්ඩ්*

*උක්ත ආයතන සඳහන් කර ඇති පිළිවෙළින් එක් එක් කාලවකවානුවලදී බාහිර ගිණුම් ලෙස පවත්වාගෙන ගොස් ඇති අතර, වර්තමානයේදී දීසායු හෝම්ස් ඇන්ඩ් ලැන්ඩ් ආයතනයේ ගිණුම්, රන්බිම ලැන්ඩ් නමින් වන ගිණුමකට මාරු කර ඇත.*

*උක්ත දීසායු කැපිටල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම හැර අනෙකුත් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය සම්බන්ධයෙන් ලිඛිත තොරතුරු නොමැති අතර, වාචිකව අනාවරණය වූ කරුණු අනුව සභාපති එස්.ඒ.එස්.පී. සේනානායක මයා හා ලේකම්, ඩබ්.එම්.පී. ධම්මිකා නන්දනී මහත්මිය රන්බිම ලැන්ඩ් ආයතනයේ හැර අනෙකුත් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින බව අනාවරණය වී ඇත.*

*දීසායු කැපිටල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල නාම ලේඛනය සමාගම් ලේකම්ගෙන් තහවුරු කරගත් පරිදි පහත තොරතුරු වේ.*

1. *එස්.ඒ.එස්. සමීර ඥානනන්ද*
2. *කේ.සී.ජේ. කුමාර*
3. *ඩබ්.එල්.පී.ඩී. නන්දනී විජේසිංහ*
4. *වයි.ඒ.එස්.එස්. කුමාරි*
5. *ජේ.බී.එල්.කේ. ජයසූරිය*
6. *ආර්.ඒ.එල්.සී. ධර්මසිංහ*
7. *ජී.ඒ.එච්.එන්. වික්‍රමසිංහ*

*රන්බිම ලැන්ඩ් ආයතනය නමින් බාහිර ගිණුම් 2018.02.28 දින සිට පවත්වාගෙන ගොස් ඇති අතර එහි අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.*

1. *ඩබ්.ඒ.අයි.කේ. වික්‍රමාරච්චි*
2. *ඩී. ශ්‍යාමිකා දිසානායක*
3. *ඩබ්.ඒ. චොලිනි කාංචනා*
4. *එච්.ඒ.ටී.ඩී. සේනානායක*
5. *එච්.පී. වෂිතා රෝෂිනී කරුණාසේකර*
6. *යූ. අනුර චමින්ද කුමාර*

*ප්‍රශ්නය :*

*ආ. එහි සභාපතිවරයා විසින් ඔහුගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නමින් ඇති දීසායු ලැන්ඩ් හෝම්ස් නමින් ආයතනයක් පවත්වාගෙන යන බවත්, සණස සමිතියේ මුදල් එම සමාගම වෙත කිසිදු පොලියක් හෝ ඇපකරයක් නොමැතිව ලබා දී ඇති බවත් ඔබතුමා දන්නෙහිද?*

*පිළිතුර:*

*ආ. දීසායු ලැන්ඩ් හෝම්ස් නමින් වූ සාමාජික තැන්පත් ගිණුමක් පවත්වාගෙන යන බවත්, එම ගිණුම*

නීත්‍යානුකූල නොවන ගිණුමක් බවත් 2013.03.01 සිට 2014.02.28 දක්වා වූ විගණනයේදී අනාවරණය වී ඇති අතර, එම ගිණුම අත්හිටුවන ලෙස සභාපතිවරයාට දන්වා ඇත.

2015.03.01 සිට 2016.02.29 දක්වා වූ විගණන කාලය තුළ දීසායු කැපිටල් හෝල්ඩින්ස් ආයතනයට සුරැකුම් රහිතව දේපළ ඇප මත රු.21,800,000.00 ක් ද 2016.03.01 සිට 2017.02.28 දක්වා විගණන කාලය තුළ දීසායු කැපිටල් හෝල්ඩින්ස් ආයතනයට සුරැකුම් රහිතව ඉඩම් විකුණුම් ණය රු.349,802,750.00 ක් ද 2018.10.04 දින වන විට පහත සඳහන් පරිදි සුරැකුම් රහිතව හා ප්‍රමාණවත් සුරැකුම් නොමැතිව රු.441,462,425.00 ක මුදලක් ණය වශයෙන් නිකුත් කර ඇත.

| | රු. | ශත |
|---|---|---|
| රන්බිම ලෑන්ඩ් | 398,404,500 | 00 |
| එස්.ඒ.ටී.ඩී. සේනානායක (පොල්හේන ලොට් 2) | 992,925 | 00 |
| එච්.ඒ. කෞෂල්‍යා මධුභාෂිනී (වල්පිටමුල්ල ලොට් 8) | 2,435,000 | 00 |
| යූ. අනුර චමින්ද කුමාර (වරාදල ලොට් 4) | 2,310,000 | 00 |
| එච්.පී. චෂිතා රෝෂින් (අලුතැපොල ලොට් 2) | 835,000 | 00 |
| ඩී.එන්. කන්ස්ට්‍රක්ෂන් | 36,485,000 | 00 |
| | **441,462,425** | **00** |

**ප්‍රශ්නය :**

ඇ. එකී සණස සමිතියේ තැන්පතු නීති විරෝධී ලෙස සභාපතිවරයා විසින් භාවිතා කිරීම හේතුවෙන් අදාළ සණස සමිතිය මූල්‍ය අර්බුදයකට පත්ව ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

**පිළිතුර:**

ඇ. 2018.10.04 දිනට විගොඩ සණස සමිතියේ සමස්ත ණය තත්ත්වය අනුව ඉඩම් ඇප මත ණය හා ඉඩම් විකුණුම් ණය සමිතියේ අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදනවලින් බැහැරව විශාල ලෙස උක්ත (ආ) පිළිතුරෙහි සඳහන් අය වෙත නිකුත් කර ඇති බවත් ඒ අනුව මුළු ණය ප්‍රමාණය රු.441,462,425.00 ක් බවත් එහි පොළී ප්‍රතිශතය 12% ක් බවත් අනාවරණය වී ඇත. මෙම ණය සඳහා සුරැකුම් හෝ ඇප ලබාගෙන නොමැති බවත්, නිසි පරිදි ණය අය නොවන බවත් අනාවරණය වී ඇත. අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදනවලින් බැහැරව කටයුතු කරන සෑම අවස්ථාවකදීම සභාපති ඇතුළු අධ්‍යක්ෂක මණ්ඩලය වගකිව යුතු වේ.

2018.09.30 දිනට මුළු තැන්පත් ප්‍රමාණය රු.750,483,433.87 ක් වන අතර මුළු ණය ප්‍රමාණය රු.669,790,318.37 ක් වන අතර ඉතිරි රු.80,693,115.50 ක මුළු මුදල් ප්‍රමාණය සඳහා වත්කම් ඇති බවට තහවුරු කර ගත නොහැකි වී ඇත. තැන්පත්කරුවන් විසින් තම මුදල් ඉල්ලා ඇති අවස්ථාවලදී, අදාළ මුදල් ගෙවීම සමිතිය සිදු නොකරන බව තැන්පත්කරුවන් විසින් වාර්තා කර ඇති අතර සමිතියේ ද්‍රවශීලතාවයක් නොමැති බවත් අනාවරණය වී ඇත.

**ප්‍රශ්නය :**

ඈ. මේ වන විට තැන්පත්කරුවන් විසින් තම මුදල් ඉල්ලීම් කළ විට සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා නොදෙන බව ඔබතුමා දන්නෙහිද?

**පිළිතුර:**

ඈ. ඔව්.

තැන්පත්කරුවන් විසින් තම මුදල් ඉල්ලා ඇති අවස්ථාවලදී, අදාළ මුදල් ගෙවීම සමිතිය අපොහොසත් වී ඇති බව තැන්පත්කරුවන් විසින් වාර්තා කර ඇත.

**ප්‍රශ්නය :**

ඉ. අදාළ සණස සමිතියේ තැන්පත්කරුවන්හට කඩිනමින් ඔවුන්ගේ මුදල් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද? යන්න මෙම සභාවට දන්වන්නෙහිද?

**පිළිතුර:**

ඉ. 1998 අංක 03 දරන සමූපකාර සමිති ප්‍රඥප්තියේ 40 වන වගන්තිය අනුව, තැන්පතු ආපසු ගෙවීමේ නොහැකි තත්ත්වයක් සමිතියේ පවතින බව වාර්තා වී ඇති බැවින් 2018.08.27 දිනැතිව තැන්පතු භාර ගැනීම වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට කටයුතු කර ඇත.

*2018.10.05 දින සමිතියේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවා තැන්පත්කරුවන් හට කඩිනමින් මුදල් ලබා දීමට කටයුතු කරන ලෙසත් අතුරු ව්‍යවස්ථා ප්‍රතිපාදනවලින් බැහැරව ණය ලබා දී ඇති ආයතන, පුද්ගලයන් වෙතින් ණය මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කරන ලෙසත් වර්තමානයේ රන්බිම ලෑන්ඩ් නමට ගිණුම්ගත කර ඇති ණය මුදල් අය කර ගැනීම සඳහා සැලැස්මක් සති දෙකක් තුළ ඉදිරිපත් කරන ලෙසත් දන්වන ලදි. එහිදී රන්බිම ලෑන්ඩ් ආයතනයේ ශේෂ පත්‍රයද ඉදිරිපත් කරන ලෙස දන්වන ල දී.*

*නමුත් මේ දක්වා අදාළ සැලැස්ම හෝ ශේෂ පත්‍රය ලබා දී නොමැති අතර 2018.11.15 දින නැවත සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය කැඳවීමට කටයුතු කළ නමුත් එදින භාණ්ඩාගාරික, ලේකම් හා එක් අධ්‍යක්ෂවරියක් පමණක් සහභාගි වූ අතර අදාළ තැන්පත්කරුවන්ගේ මුදල් නොපමාව ගෙවීමට කටයුතු කරන ලෙසත් සමිතිය සතු වත්කම් කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව විකිණීම් නොකරන ලෙසත් රන්බිම ලෑන්ඩ් ආයතනයේ තිබෙන වත්කම් නොපමාව විකුණා සමිතියෙන් ලබාගෙන ඇති ණය මුදල් පියවීමට කටයුතු කරන ලෙස දන්වන ලදී.*

*එක් එක් තැන්පත්කරුවන් විසින් ලිඛිතව කර ඇති පැමිණිලි අනුව තැන්පත්කරුවන්ගේ මුදල් කඩිනමින් ගෙවන ලෙස දන්වා සමිතියේ සභාපතිවරයාට ලිපි යොමු කර ඇත.*

*සමිතියට ණය වාරික වශයෙන් අයවන මුදල් තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවීමට භාවිතා නොකර සමිතියේ කටයුතු සඳහා යොදා ගන්නා බවට පැමිණිලි ලැබීම හේතුවෙන් මාසිකව එකතු වන ණය වාරික මුදල් දැනට පවත්නා ගිණුම්වල තැන්පත් නොකර, අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයක් මත සී/ස විගොඩ සණස සමිතිය නමින් නව ඉතිරි කිරීමේ ගිණුමක් රජයේ බැංකුවක ආරම්භ කර තැන්පත් කිරීමට කටයුතු කරන ලෙස 2018.11.26 දිනැතිව සමිතියේ සභාපතිවරයා වෙත දන්වා ඇත.*

***ප්‍රශ්නය :***

*ඊ. අදාළ සමිතිය සතු මුදල් වෙනත් කාර්යයන්වලට යෙදවූ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?*

***පිළිතුර:***

*ඊ. බස්නාහිර පළාත් සමූපකාර ප්‍රඥප්තියේ 47(2) වගන්තිය අනුව සමිතියේ කටයුතු විමර්ශනය සඳහා විමර්ශන කණ්ඩායමක් පත් කර ඇති අතර, එහිදී අනාවරණය වන කරුණු අනුව මූල්‍ය හානියක් සිදුව තිබේ නම්, එම මුදල අය කර ගැනීම සඳහා ප්‍රඥප්තියේ 58 වගන්තිය අනුව කටයුතු කිරීම.*

*1. 1982 අංක 12 දරන පොදු දේපළ විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත අනුව 2016.03.01 සිට 2017.02.28 දක්වා වන විගණනයේදී අනාවරණය වන කරුණු අනුව සමිතියේ මුදල් අවභාවිතා කිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල තත්ත්වයන් අනාවරණය කර ගැනීම සඳහා පොලිස් අපරාධ විමර්ශන කාර්යංශයට පවතින තත්ත්වය විගණන වාර්තාවත් සමග ඉදිරිපත් කිරීමට නියමිතය.*

***ප්‍රශ්නය :***

*උ. නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර:***

*උ. අදාළ නොවේ.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විශේෂයෙන්ම විගොඩ සමිතිය පිළිබඳව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඔව්. ඒක නම් ජාතික අපරාධයක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා දන්නවා. ඔබතුමාගේ ප්‍රදේශයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දන්නවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විශාල මූල්‍ය වංචා සිදු කරපු, ඒ වාගේම ඒ ප්‍රදේශයේ ඉතාමත් අහිංසක දුප්පත් අය විවිධ විධියට සොයා ගත්තු සල්ලි තමයි මේ විගොඩ සමිතියේ තැන්පත් කරලා තිබෙන්නේ. ඒ තැන්පත්කරුවන් විශාල අපහසුතාවයන්ට පත් වෙලා තිබෙනවා. සමහරු දිවි තොර කර ගන්න තත්ත්වයකටත් පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඇමැතිතුමා අවධානය යොමු කරලා, අදාළ නිලධාරීන්ගෙත් අවධානය යොමු කරලා වහාම මැදිහත් වෙලා විසඳුම් ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සණස ව්‍යාපාරයේ විගොඩ සණස විතරක් නොවෙයි, පසුගිය කාලයේ මෙතුමාත් යෝජනාවක් ගෙනාවා කොළඹ දිස්ත්‍රික්කයේ සණසක් සම්බන්ධව. ඒ නිසා සණස ව්‍යාපාරයේ ගොඩක් දූෂණ අක්‍රමිකතා තිබෙනවා. ඒ නිසා ඔබතුමා විෂයය භාර ඇමැතිවරයා වශයෙන් මේ පිළිබඳව දැඩිව ඉන්න. FCID යට හරි නිලධාරී ඇවිල්ලා ඉදිරිපත් කරනවා. FCID හරි කමක් නැහැ. අපරාධයක්. මේ මිනිස්සුන්ගේ සල්ලි. නිකම් කටවුට් ගහනවා. පෝස්ටර් ගහනවා. කෝටි ගණන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, සණස මෙතුමා කියන්නේ නියාමනයක් විතරයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

දැන් එක තැන්පත්කරුවෙක් ඉන්නවා තමන්ගේ ඉඩමයි, නිවසයි උකස් කරලා සල්ලි දීලා තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මම දන්නවා ඕක.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔව්. ආපහු තමන්ගේ දරුවොත් එක්ක කුළියට නිවසක් අරගෙන ඒ කුළිය ගෙවා ගන්න විධියයක් නැතුව අද වනකොට අසරණ වෙලා ඉන්නවා. මේ ප්‍රශ්නවලට විසඳුම් සොයාගෙන නිලධාරීන් ළඟට යද්දී ඒවාට ඔවුන්ගේ පැත්තෙන් මේ වනතුරු හොඳම උත්තර ලැබිලාත් නැහැ. ඒ නිසා මේ පිළිබඳව පුළුල් අවධානයක් යොමු කළ යුතුයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඇත්ත වශයෙන්ම ඔබතුමාට ගොඩක් පිංසිද්ධ වෙනවා. ඔය කාරණාවට මැදිහත් වෙන්න. මම දන්නවා සමහර මිනිස්සු ඉන්නවා ලක්ෂ 20 තැන්පත් කරලා, ඒක කල් පිරුනාම ලක්ෂ 20 ආපහු දෙන්න විධියක් නැහැයි කියනවා. ලක්ෂ 2 ක් දෙන්නම් කියනවා Loan එකක් හැටියට. තමුන් දාපු ලක්ෂ 20 ට කල් පිරිලා ඉල්ලන්න ගියාම ලක්ෂ 2 ක Loan එකක් ගන්න කියනවා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා අසන ලද දෙවැනි ප්‍රශ්නයටත් මම හිතන්නේ පිළිතුරු තිබෙනවා. විශාල පිළිතුරු සංඛ්‍යාවක් තිබෙනවා. ඒ නිසා ඒකත් සභාගත කරනවා. මම එතුමා එක්ක සාකච්ඡා කළා මේක අධ්‍යයනය කරලා එක දිනයක නිලධාරියෙක් ගෙන්නලා ඒ පිළිබඳව සාකච්ඡාවක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා විෂයය භාර ඇමැතිවරයා වශයෙන් ඔබතුමාත් කොමසාරිස්තුමා ලවා එම ක්‍රියා මාර්ග ගන්න. අවශ්‍ය නම් ඊට එහාට ගිහිල්ලා අපේ තිබෙනවා FCID, CID ඒවාට ගිහිල්ලා මේවා ගැන පැමිණිලි කරන්න. මේ වාගේ දූෂණ, වංචා සිද්ධ වෙලා තිබෙනවා කියලා. එතකොට පොඩ්ඩක් හරි හැදෙයි.

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ තුන්වැනි ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව. ගරු අධ්‍යාපන ඇමැතිතුමා නම් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය යොමු කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education ]

ගරු සභාපතිතුමනි, පිළිතුරු සභාගත කරනවා.

** [සභාගත කරන ලද පිළිතුරු]*
*[Tabled Answer]*

***03.***

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :*** ***(ප්‍ර/VI(1)/18/79)***

***ප්‍රශ්නය :***

*අ. i. ජයවර්ධනපුර කලාපයට අයත් තලපත්පිටිය සිද්ධාර්ථ විද්‍යාලයේ විදුහල්පතිවරයා හා ආචාර්ය මණ්ඩලය අතර පවතින අරවුලක් සම්බන්ධව දැනට විමර්ශනයක් ආරම්භ කර තිබේද?*

*ii. එම විමර්ශනවලට පාදක වූ පැමිණිලි ඉදිරිපත් වූ දිනයන් කවරේද?*

*iii. මෙහිදී එල්ලවන චෝදනා මොනවාද?*

*iv. එම විමර්ශන මේ වන විට අවසන් කර තිබේද?*

*v. නැතිනම් එයට හේතුව කුමක්ද?*

***පිළිතුර:***

*අ. i. ඔව්.*

*ii. 2018.01.15 දින විදුහල්පතිතුමන් විසින් එල්.පී.එස්.කේ. කරුණාතිලක ගරු මහතා සම්බන්ධව.*

*2018.02.29 දින ගුරු මණ්ඩලයේ පිරිසක් විසින් විදුහල්පතිතුමන් සම්බන්ධව.*

*2018.04.20 දින පාසලේ ආදි ශිෂ්‍ය සංගමය හා පාසල් සංවර්ධන සමිතිය මගින් එල්.පී.එස්.කේ. කරුණාතිලක ගුරු මහතා සම්බන්ධව.*

*2018.08.03 දින ගුරු මණ්ඩලයේ පිරිසක් විසින් විදුහල්පතිතුමන් සම්බන්ධව.*

*iii. එල්.පී.එස්.කේ. කරුණාතිලක ගුරු මහතා විසින් පරිපාලනය සම්බන්ධව ගැටලු ඇති කර ගැනීම.*

*රාජකාරී හා ඉගෙනුම් ක්‍රියාවලියේ මතුව ඇති ගැටලු.*

*විදුහල්පතිගේ ක්‍රියා පටිපාටිය හා මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව.*

*iv. විදුහල්පතිට අදාළ මූල්‍ය අක්‍රමිකතා හැර අනෙකුත් විමර්ශන අවසන් කර ඇත.*

*v. මූල්‍ය විමර්ශනයක් කිරීමට ගණකාධිකාරිවරිය දැනුවත් කර ඇත.*

***ප්‍රශ්නය :***

*ආ. i. එම විමර්ශනවල ප්‍රතිඵල මත පාසලේ ගුරුවරයෙකු ස්ථානමාරු කර තිබේද?*

*ii. ඒ අනුව ඔහුට එල්ලවන චෝදනා සම්බන්ධව විධිමත් පරීක්ෂණ ආරම්භ කර තිබේද?*

*iii. එම ගුරුවරයාට මූලික විමර්ශන මත ස්ථාන මාරු ලබා දීමට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් වෙනත් ස්ථාන මාරුවීම් ලබා දී තිබේද?*

*iv. එය කුමන හේතු මත කුමන පාසල්වලටද?*

***පිළිතුර :***

*ආ. i. ඔව්.*

*ii. නැත.*

*iii. ඔව්.*

*iv. 2017.02.28 ගුරු තුලනයෙන් අතිරික්ත වීම. 2016/1 චක්‍රලේඛය අනුව නැවත අතිරික්ත වීම මත 2018.04.06 නැවත බප/ජය/ ශාන්ත තෝමස් විද්‍යාලය සඳහා සංගීත ගුරුවරයෙකු ලෙස ස්ථාන මාරු කළ ද, පුරප්පාඩු නොමැති බැවින්, 2018.04.10 දින අවලංගු කරන ලදී.*

*එහෙත් ඔහු සම්බන්ධව ඉදිරිපත්ව ඇති පැමිණිලි පිළිබඳව සිදු කරන ලද විමර්ශනය අනුව 2018.07.18 දින බප/ජය/ජයවර්ධනපුර මහ විද්‍යාලය සඳහා ස්ථාන මාරු කර ඇත.*

***ප්‍රශ්නය :***

*ඈ. ඒ අනුව මෙම සියලු පැමිණිලි සම්බන්ධව විමර්ශන සිදු කර, එහි ප්‍රතිඵල අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නේද?*

***පිළිතුර :***

*ඈ. විදුහල්පති සම්බන්ධව ඉදිරිපත්ව ඇති පැමිණිලි පිළිබඳව විමර්ශනයක් කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සිදු කර ඇත. ඒ අනුව අවවාද ලිපියක් විදුහල්පති සඳහා නිකුත් කර ඇති අතර, පාසලේ මූල්‍ය විගණනයක් සිදු කරන ලෙස ගණකාධිකාරීතුමිය දැනුවත් කර ඇත. මූල්‍ය විගණනයෙන් පසු විදුහල්පතිවරයා සම්බන්ධයෙන් පියවර ගැනීමට අදහස් කරයි.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමාට කරන්න දෙයක් නැහැ. නමුත් මම ඒ පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැහැ. ගිය පාර මට මතකයි ඩෝල්ටන් ජානක මන්ත්‍රීතුමා ගම්පහ ඉස්කෝලයක් ගැන ප්‍රශ්නයක් ඉදිරිපත් කළා 1 සිට 13 දක්වා ශිෂ්‍ය සංඛ්‍යාවේ වාර්තාවක් දෙන්න කියලා. නමුත් දැන් කොලේ වහලා 1 සිට 5 දක්වා පන්ති දුන්නේ. දුන්නේ නැහැ. මේක මන්ත්‍රීතුමාට කරන හරි අසාධාරණයක්. ප්‍රශ්නයට හරියට උත්තරයක් දෙන්න. මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීමක් එතැනම තිබෙනවා. මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් අහන්නේ නිලධාරීන්ගෙන් මොකක් හරි දැනගන්න. නිලධාරීන් මේවාට හරියට උත්තරයක් දෙන්නේ නැහැ. යටින් එහෙන් මෙහෙන් ගහලා, එදා ඩෝල්ටන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයටත් උත්තරයක් නැහැ. ඒක අමු බොරුවක් කළේ. ඒ නිසා කරුණාකරලා නිලධාරීන්ගෙනුත් ඉල්ලා සිටිනවා පොඩ්ඩක් දැනුවත් වෙන්න. නිලධාරීන්ටය කියන්න මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ නොවන ආකාරයෙන් මන්ත්‍රීවරුන්ට උත්තරයක් දෙන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, දැන් මේ ප්‍රශ්නයට අදාළව මට අතුරු ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අතුරු ප්‍රශ්න තුනක් තිබෙනවා. මේ අතුරු ප්‍රශ්න අහන්න විධියකුත් නැහැ. දැන් මේ ප්‍රශ්නය, දීර්ඝ කාලයක් තිස්සේ මේ උඩහමුල්ල සිද්ධාර්ථ විද්‍යාලේ ඉදිරියට ඇදෙන ප්‍රශ්නයක්. විදුහල්පතිවරයා සහ මේ ආචාර්ය මණ්ඩලය අතරේ තිබෙන ගැටළුව. ඒ වාගේම මා සතුව තිබෙනවා කම්කරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරපු ලිපිය. මේ විදුහල්පතිවරයා කලාපයේ මාරු මණ්ඩලයට නීති විරෝධී ලෙස සහභාගී වෙනවා. ඔහුට සහභාගී වෙන්න බැහැ. එසේ තිබියදී සහභාගී වෙලා මේ නිලධාරීන් එක්ක එකතු වෙලා තමයි මේ පාසලේ ගුරුවරුන්ට අඩන්තේට්ටම් කරමින් තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන ප්‍රශ්නය ගරු මන්ත්‍රීතුමා පෙත්සම් කාරක සභාවට ආවද?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ ප්‍රශ්නය පෙත්සම් කාරක සභාවටත් ආවා. මේකට විමර්ශනයක් කරන්න කියලා 11 වැනි මාසේ 30 වැනිදා පෙත්සම් කාරක සභාවට ආවා. වහාම විධිමත් පරීක්ෂණයක් සිදු කරන්න කියලා තීරණයක් ආවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි බලමු.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, පරිපූරක ඇස්තමේන්තුවට අදාළව කොන්ත්‍රාත් කිරීමට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ කිසිදු වාර්තාවක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එයා මාරු මණ්ඩලයේ නියෝජිතයෙක්. එයාට මාරු මණ්ඩලය නියෝජනය කරන්න බැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

පරිපූරක ඇස්තමේන්තුව තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විදුහල්පති සේවයේ අයට මාරු මණ්ඩලය නියෝජනය කරන්න බැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මෙතුමා ප්‍රශ්නයක් ඇහුවා. කොන්ත්‍රාත් දීමට අදාළව කිසිදු උත්තරයක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ජාතික අධ්‍යාපන සේවක සංගමය. එක්සත් ජාතික පක්ෂයේ ගුරු සංගමය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හැටි. උත්තර නම් ගොඩක් බොරු කියන්නේ. හරි මන්ත්‍රීතුමා. අපි න්‍යාය පත්‍රයට යමු. ගරු ඇමැතිතුමන්ලා සූදානම් නම් මේ වෙලාවේ අතුරු ප්‍රශ්නවලට උත්තර දෙන්න පුළුවන්. නැහැ නේ?

# පෞද්ගලික ප්‍රකාශ කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ පෞද්ගලික ප්‍රකාශය සඳහා අවස්ථාව. එතුමා සභා ගර්භයේ නැහැ. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ පෞද්ගලික ප්‍රකාශය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මෙම විශේෂ ප්‍රකාශය ඍජුව අපේ අසාද් සාලි සර්ට යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ආණ්ඩුකාරතුමාට. ඉතින් ගරු සභාපතිතුමනි, විශාල ගැටළුවක් ඇති වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මගේ විශේෂ ප්‍රකාශය කාරණා දෙකකටයි යොමු වෙන්නේ. විශේෂයෙන්ම පෙර පාසල්වලට අදාළව. මුළු බස්නාහිර පළාතේම පෙර පාසල් දැවැන්ත අර්බුදයකට වැටිලා තිබෙනවා. ඒකේ සාම්පල් එකක් ගන්න ඕනෑ නම් ගරු සභාපතිතුමනි, කොලොන්නාවට යන්න ඕනෑ. කොලොන්නාවේ පෙර පාසල් තුනයි තිබෙන්නේ. එම පෙර පාසල් තුනේ විශේෂ ගැටළු කිහිපයක් මතු වෙලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මේ පෙර පාසල්වල පොදු ගැටළුවක් තිබෙනවා. ඒ ගැටළුව තමයි කම්කරු ගැටළුව. ඊට පස්සේ දරුවන් පිළිබඳව දැනුවත් සහායිකාවන් නැති එක. එතකොට මේ විශේෂ ගැටළු පිළිබඳව ගරු සභාපතිතුමනි, නිකම් හිටියේ නැහැ. මෙම ගැටළු පිළිබඳව ඒ අදාළ බලධාරී තැන්වලට, පළාත් පාලන ආයතනය, පළාත් සභාව විටින් විට දැනුවත් කරලා තිබෙනවා. ඒ අනුව 2018 වසරේ 11 වැනි මාසේ දෙමව්පියෝ 46 ක් අත්සන් කරලා කැලණි නදීගම පෙර පාසලේ එකමුතු දෙමව්පිය සංසදය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරලා තිබෙනවා. තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා එම ඉල්ලීම මම මෙම සභාවට ඉදිරිපත් කරනවා.[3]

ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මෙම පෙර පාසල්වලට අදාළ ගැටළුව, මේ කොලොන්නාව ආසනයේ ඇති වෙලා තිබෙන දැවැන්ත පෙර පාසල් ගැටළුව නිසාම පුංචි අපේ පෙර පාසල නමින් ත්‍රී පුද්ගල කමිටුවක් හරහා ත්‍රී පුද්ගල කමිටු වාර්තාවක් සැකසුවා පෙර පාසල්වලට අදාළවම. ඒකේ කමල් ජයකොඩි මහත්මා හිටියා. හේමසිරි අමරසිංහ මහත්මා. නිල්මිණී ගැර්ලැක් මහත්මිය. දැන් මේ සභාවේ අපේ ප්‍රකාශය අහගෙන ඉන්නවා එක මන්ත්‍රීවරියක්. එතකොට මේවායේ පොදුවේ පෙර පාසල්වලට අදාළ ගැටළු රාශියක් ඉදිරිපත් කරලා තිබෙනවා. එම ත්‍රී පුද්ගල කමිටු වාර්තාවත් තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා මම මේ සභාවට ඉදිරිපත් කරනවා.[4] ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි, මේ පෙර පාසල්වල විශේෂ ගැටළු, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව ආමන්ත්‍රණය කරලා බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමිය, චන්ද්‍රානි සමරකෝන් මැතිනිය ඉදිරිපත් කරලා තිබෙනවා, විශේෂ හඳුනාගත් අඩුපාඩු කියලා. පෙර පාසලක අඩුපාඩු 53 ක්. ගරු සභාපතිතුමනි, එක පෙර පාසලක අඩුපාඩු 53 ක් තිබෙනවා නම් ඒක පෙර පාසලක්ද කියන කාරණය අපි ඉස්සරහා තියෙනවා. ඉතින් ගරු සභාපතිතුමනි, පොදුවේ ඔබතුමාගේ අවධානය යොමු කරන්නේ මෙන්න මේ පෙර පාසල්වලට අදාළව තිබෙන පොදු ගැටළු පිළිබඳව යම් පියවරක් ගත යුතුයි කියලා.

[3] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.
[4] - එම -

ගරු සභාපතිතුමනි, ඊට අමතරව ආණ්ඩුකාරවරයාගේ විශේෂ අවධානයට යොමු කරන්න තමුන්නාන්සේට මම විශේෂ ගැටළුවක් පිළිබඳව අවධානය යොමු කර සිටිනවා. ඒක තමයි මම තමුන්නාන්සේට ලිඛිතව ඔය ප්‍රකාශයෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒකේ තිබෙන්නේ ගරු සභාපතිතුමනි, කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට අදාළව පෙර පාසල් පුරප්පාඩු පුරවන්න කියලා, අතිවිශේෂ ගැසට් පත්‍රයක් 2018.11.30 වැනිදා රාජ්‍ය සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට පමණි කියලා කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ 2 සේවා ගණයේ පෙර පාසල් ගුරු තනතුරු සඳහා පුරප්පාඩු පිරවීමට සීමිත තරග විභාගයක් පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මුළු කොට්කාවත්ත - මුල්ලේරියාව බල ප්‍රදේශය තුළම මොකද, ඒකේ කලින් සිටි පෙර පාසල් ගුරුවරියන්ට පමණයි අයදුම් කරන්න පුළුවන් වෙන්නේ. එම අයදුම් කරන අවස්ථාවේ පරිවාස කාලයට බඳවාගෙන තිබෙන දෙදෙනෙක් සිටිනවා. ගරු සභාපතිතුමනි, එම දෙදෙනා අයදුම් කරලා තිබෙනවා. ඔවුන් මීට වසර 9 කට පෙර බඳවා ගන්න කොට ඔවුන්ගෙන් අධ්‍යාපන සුදුසුකම් ඉල්ලා සිටියේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් හයක් පමණයි. අවාසනාවකට ගරු සභාපතිතුමනි, ඔවුන් දැන් ස්ථිර සේවයට බඳවා ගන්න කොට ඔවුන්ගෙන් ඉල්ලා සිටිනවා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයයන් හයක් සහ සිංහල සහ ගණිතය සාමාර්ථයක්. ගරු සභාපතිතුමනි, මෙම අයදුම්කරුවන් දෙදෙනාටම සිංහල සාමාර්ථය තිබෙනවා. ගණිතයට සම්මාන සාමාර්ථයක් නැහැ. එතකොට කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළින්ම ඉල්ලා තිබෙන්නේ, මේ දෙන්නා විතරයි.

එතකොට ගරු සභාපතිතුමනි, මුලින් ඉල්ලා සිටි සුදුසුකම්වලට අමතර සුදුසුකමක් තමයි මේ සම්මාන සාමාර්ථ දෙක පසුව ඉල්ලා සිටින්නේ. ගරු සභාපතිතුමනි, මේක ඉතාමත්ම අසාධාරණ තත්ත්වයක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙම තත්ත්වය පොදුවේ තිබෙන තත්ත්වයක් නොවෙයි. ඒක නිසා මෙය ආණ්ඩුකාරවරයාට වෙනස් කළ හැකි තත්ත්වයක්. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, මෙම පෙර පාසල් ඇද වැටී තිබෙන තත්ත්වයෙන් ගොඩ ගන්න අඩුම තරමින් මේ ගුරුවරියන් දෙදෙනා බඳවා ගන්නා ලෙස. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ගණිතයට S සාමාර්ථය තිබෙනවා. නමුත් සම්මාන සාමාර්ථයක් නැහැ. නමුත් ගරු සභාපතිතුමනි, මේ මොහොතේ එහෙම ඉල්ලා සිටීම අසාධාරණයක්. ඒක නිසා ආණ්ඩුකාරවරයාට මෙම විශේෂ ගැටළුව තමුන්නාන්සේගේ මාර්ගයෙන් මම යොමු කරනවා. විශේෂයෙන්ම මෙම ඉල්ලුම් පත්‍රය දාලා තිබෙන ගුරු මහත්මියට වසර 9 ක සේවා කාලයක් තිබෙනවා. පළපුරුද්දක් තිබෙනවා. ඊට අදාළ ඇමුණුම් සම්පූර්ණයෙන් මා සතුව තිබෙනවා. 1999.08.17 වැනිදා එතුමිය ඉල්ලුම් කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථාව අවසන් කරන්න. ඔබතුමාට මම වෙලාව දුන්නා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ වෙලාවේ සාමාන්‍ය සාමාර්ථ හයක් විතරයි ඔවුන් ඉල්ලා තිබෙන්නේ. ඒ අනුව මම සියලු ලේඛන සභාගත කරනවා. මේ සියල්ල සභාගත කරන අතරම විශේෂ ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ මාර්ගයෙන් මෙය ආණ්ඩුකාරතුමාට යොමු කොට ඇයට සාධාරණ විසඳුමක් ලබා දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා කරන ලද පෞද්ගලික ප්‍රකාශය පිළිබඳව මම ලේකම්තුමාට උපදෙස් දෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය පිළිබඳව වාර්තාවක් ගරු ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කරන්නය කියලා.

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය සභාපති -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න කොටම මතු කරන්න ඕනෑ. අපේ ඉල්ලීම පරිදි ඔබතුමා ලිපි ගණනාවක් සභාගත කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, එතකොට මේකෙන් කරුණු ගණනාවක් පැන නඟිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ඒ ටික ලැබුණා නේද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ලැබුණා. ඒ හරහා ගැටලු ගණනාවක් මතු වෙනවා. ගරු සභාපතිතුමනි, අපි නොදන්නවාට ආණ්ඩුකාරතුමාට වැඩ ඒකකයක් තිබෙනවාද කියලා ප්‍රශ්නයක් එනවා. ඒක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට අපි දැන ගන්න ඕනෑ. ඒ වාගේම තමයි එතුමා කොහොමද මේ මුදල් - ඔබතුමා ඉල්ලන පරිදිම ඒ මුදල් ලබා දෙන්නේ කොහොමද? ඒ වාගේම අපට දැනගන්න ඕනෑ. මේ ඉල්ලීම් කරන ලද ඒවායේ තිබෙනවා. ඉදිරියේදී මැතිවරණයක් එන නිසා මා හට මේ මුදල් දෙන්න කියලා. එතකොට එහෙම ක්‍රමවේදයක් තිබෙනවාද? අපි දන්නවා අප්‍රේල්වලින් පස්සේ මැතිවරණයක් එන්න ඕනෑ. පහුවෙලා හරි, කොහොම හරි මැතිවරණයක් එන්න ඕනෑ. එතකොට මේ හැම මන්ත්‍රීවරයෙකුටම ආණ්ඩුකාරතුමාට මේ මුදල් දීම සඳහා ක්‍රමවේදයක් තිබෙනවාද? ඒ වාගේම තමයි පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අදාළව අමාත්‍යවරයෙක් මේ සභාවේ ඉන්නවා. එතකොට ඒ අමාත්‍යවරයාගේ විෂයයන්වලින් ගණනාවක් ආණ්ඩුකාරතුමාට දීලද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. එහෙම නැහැ. මම දන්න විධියට එතුමාට තමයි යොමු කළේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි. අපට මේවායින් සාධාරණ ප්‍රශ්න වගයක් මතු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මතු වෙනවා. මමත් ඒක දන්නවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මේක සභාගත කරපු එක හොඳයි. කරුණු ගණනාවක් තිබෙනවා. ඒ නිසා අන්න ඒ කරුණුවලට මේ සභාවේ ඔබතුමන්ලා උත්තර දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් සභා ලේකම්තුමාට උපදෙස් දුන්නා. ඒ ගැන ප්‍රධාන ලේකම්තුමාත් එක්ක සාකච්ඡා කරලා සභාවට වාර්තාවක් දෙන්නය කියලා. අපි ඊළඟ සභාවේදී ඉදිරිපත් කරන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අනිවාර්යයෙන් මම මතු කරන කරුණුවලට උත්තර මේ සභාවට ලබා දෙන්න ඕනෑ. කවදාද ඔබතුමා දෙන්නේ? ලබන සභාවට දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලබන සභාවට දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි. හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා ලේකම්තුමා හරහා මම යෝජනා කරනවා. ඉක්මණටම, මට ඊළඟ සභාවට ඔබතුමාගේ යෝජනාවයි, අර කලින් කිව්ව ශිරන්ත ගරු මන්ත්‍රීතුමාත් යෝජනාවක් කළා නේ 2018 වසරේ ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව. ඒ ඔක්කොම විස්තර මට දෙන්නය කියලා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පොඩ්ඩක් සමාවෙන්න. ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රසන්න රණතුංග හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇවිල්ලා එළියේ පොඩි සාකච්ඡාවක් තිබුණා. ඒකට මම සහභාගි වුණු වෙලාවේ අපේ ගරු සභාපතිතුමා මගේ ප්‍රකාශය කැඳවලා තිබුණා. මම මේ සභාවේ සිටියේ. ඒ නිසා මට ඒ අවස්ථාව ලබා දෙන්නය කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. හිටපු සභාපතිතුමාට දැන් කථා කළාම යන ගමන් කිව්වා, ඔබතුමාට කියන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2018.07.17 වන දින මෙම සභාවේදී මම පෞද්ගලික ප්‍රකාශයක් කළා. එහි විෂය වුණේ, ප්‍රාදේශීය සභාවල සේවය කරන ලේකම්වරුන්ට බලපාන ප්‍රශ්නයක්. සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභාවල ලේකම්වරුන් ලෙස පත් කෙරුනේ සාමාන්‍ය ලිපිකරු සේවයේ අධි පන්තියේ නිලධාරීන්. ප්‍රාදේශීය සභා ලේකම් තනතුර කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තියේ නිලධාරීන්ට අහිමි කොට, ඒ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් පත් කිරීමට පිරිසක් කුමන්ත්‍රණකාරී උත්සාහයක යෙදෙන බව මා එදා පෙන්වා දුන්නා. මම මෙම ප්‍රකාශය කළාට පස්සේ අදාළ නිලධාරීන් නියෝජනය කරන සංගමය එනම්, සමස්ත ලංකා පරිපාලන නිලධාරීන්ගේ සංගමය සියලුම ආණ්ඩුකාරවරුන්ට හා මහ ඇමතිවරුන්ට මේ පිළිබඳව දැනුම් දුන්නා. ඒ වාගේම ඔවුන් එවකට සිටි, විෂය භාර අමාත්‍යවරයා වන ෆයිසර් මුස්තාපා මහතාට මාගේ කථාවේ හැන්සාඩ් පිටපතක් සමඟ ලිපියක් යවා තිබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාව කියන්නේ, මේ රටේ ප්‍රධානතම පළාත් සභාව. මේක ඇතුළේ පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. එබැවින් පුහුණු පිරිසක් මෙම පළාත් පාලන ආයතනවලට යෙදවීම අත්‍යවශ්‍යයි කියන එක මම අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. එදා මා මගේ ප්‍රකාශයෙන් මේකේ සියලු මාන විස්තරාත්මකව පෙන්වා දුන්නා. ගැටලුවේ ස්වභාවය සහ ගත යුතුව ඇති විසඳුම එම ප්‍රකාශයේ සඳහන් වුණා. එදා ඒ ප්‍රකාශයත් සමස්ත ලංකා පරිපාලන නිලධාරීන්ගේ සංගමය යැවූ ලිපියත් සැලකිල්ලට ගෙන අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතා තම අමාත්‍යාංශයේ ලේකම්ට 2018.11.27 දින ලිඛිත නියෝගයක් කළා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම නියෝගය මා සතුව තිබෙනවා. එහි දැක් වුණේ, *"මේ තත්ත්වය සැලකිල්ලට ගෙන මතු කී කැබිනට් තීරණය අත්හිටුවා මේ ගැන ගැඹුරින් අධ්‍යයනය කර, වාර්තාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබීම සඳහා කැබිනට් අනු කමිටුවක් පත් කරනු ලැබීමට යෝජනා කර 'අමාත්‍ය මණ්ඩල සටහනක්' වහාම සකස් කර මා වෙත ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි."* යනුයි. මේ කියන්නේ කවුද? ෆයිසර් මුස්තාෆා අමාත්‍යතුමා. මම එදා ප්‍රකාශය කළාට පස්සේ තමන්ගේ අමාත්‍යාංශයේ ලේකම්ට ලියනවා.

මොකද වෙන්නේ? මෙය ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස සලකා මීළඟ අමාත්‍ය මණ්ඩලයට එය ඉදිරිපත් කිරීමට හැකි වන සේ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස ද සිහිපත් කරමි කියලා අමාත්‍යවරයා තම ලිපියෙන් ලේකම්වරයාට දැනුම් දුන්නා. ඊට පස්සේ වුණේ මොකක්ද කියලා අපි දන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් එවකට හිටපු ලේකම්වරයා ගත්ත තීරණය මොකක්ද කියලා අපි දන්නේ නැහැ. එතැන ප්‍රශ්නාර්ථයක් තිබෙනවා.

කොහොම වුණත් 2018.07.17 වන දින මා කළ ප්‍රකාශය සියලුම පළාත් සභාවල ආණ්ඩුකාරවරුන්ට, ප්‍රධාන අමාත්‍යවරුන්ට ලිපි යවමින් සමස්ත ලංකා පරිපාලන නිලධාරීන්ගේ සංගමය කළ ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරය ඉතාම ශෝචනීයයි. කනගාටුවට පත් වෙනවා.

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යතුමාට හා ආණ්ඩුකාරතුමා ඇතුළු පිරිසට ද මෙම ඉල්ලීම කළත් ඊට කිසිදු ප්‍රතිචාරයක් ලැබුණේ නැහැයි කියලා එම සංගමය කිව්වා. එහෙත් ඌව, මධ්‍යම හා උතුරු මැද පළාතේ ආණ්ඩුකාවරුන් මම කියන්න සතුටුයි. මේකට ප්‍රතිචාර

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

දක්වලා අදාළ සංගමයට දැනුම් දීලා තිබුණා, තමන් මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා කියලා. අඩුම ගණනේ එතුමන්ලාට පොඩි සදාචාරයක් තිබුණා, මේ වාගේ දැවැන්ත සංගමයක්. රට පුරා හැත්තෑ දහසක් නියෝජනය කරන සංගමයක්. ඔවුන්ගේ ඒ ලිපියට ප්‍රතිචාර දක්වන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අත්දැකීම් සහිත විෂයානුබද්ධ දැනුමෙන් පොහොසත් නිලධාරීන් පිරිසක් ලේකම් තනතුරුවලට යෙදවීම වෙනුවට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නවක නිලධාරි යෙදවීම හැම අංශයෙන්ම අනුමත කළ නොහැකි එකක්. ඔවුන් බොහොමයක් පළාත් සභාවල නොරැඳෙන බව අපි අමුතුවෙන් කිවයුතු නැහැ. මේකේ වරද දැකලා අවබෝධ කර ගෙන මේ අසාධාරණයට විරුද්ධයි කියලා කියන්න, කටයුතු කරන්න අවබෝධයක්, කොන්දක් තිබුණේ මධ්‍යම පළාතට විතරයි. එම ලිපිය මම සභාගත කරන්න කැමැතියි.

මේ පිළිබඳව යෝජනාවක් 2018.09.14 වන දින මධ්‍යම පළාත් සභාවට ඉදිරිපත් කෙරුණා. සාකච්ඡා කෙරුණා. ඒකමතිකව සම්මත වුණා. පක්ෂ විපක්ෂ බේදයක් නැතිව මේකට සහාය දුන්නා. එහි දැක් වුණේ මධ්‍යම රජය ගෙන ඇති මෙම තීරණය අවලංගු කරන ලෙසත්, පෙර පරිදි රාජ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්ට සේවා හිමිකම් ආරක්ෂා කරමින් ඉදිරියටත් පෙර පරිදිම මධ්‍යම පළාත් සභාවේ කටයුතු කිරීමට ඔවුන් යෝජනා කරන බව එම යෝජනාවේ දැක් වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ලැජ්ජා විය යුතු නැද්ද? මේ තරම් සේවයක් කරන නිලධාරීන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි පෙනී සිටින්නේ නැද්ද? එයයි අද මම නඟන ප්‍රශ්නය. ඔවුන්ගේ දුක් අඳෝනා සාපයක් බවට පරිවර්තනය වීම ඉතාම ඉක්මණින් සිදු වෙනු ඇතැයි මගේ විශ්වාසයයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස මධ්‍යම පළාතේ ලිපිය දැක්කාම ඇත්තටම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට ලැජ්ජාවකුත්, හිරිකිතකුත් ඇති වුණා. ඇයි? අපි මේ සභාවේ ඉඳගෙන ඉන්නේ, මෙහෙම මිනිස්සුන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරන්න බැරි නම් කියලා. මේක අවලංගු කළ යුතුයි කියලා විෂය භාර අමාත්‍යවරයා නියෝග කරද්දී මේ අමනෝඥ තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා බස්නාහිර පළාත් සභාව තවදුරටත් ක්‍රියා කිරීම ඊටත් වඩා ලැජ්ජා සහගත කරුණක් නොවේද? කියලා මම ඔබතුමන්ලාගෙන් ප්‍රශ්න කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මා ළඟ ලිපිය තිබෙනවා. මොකක්ද? ගම්පහ දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමිය තමන්ට පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලැබුණු ලිපිය සියලුම ප්‍රාදේශීය සභා ප්‍රධානීන් වෙත යවා තිබෙනවා. මේ ලිපිය යවන්නේ 2018.12.02 වන දින. ඒ කියන්නේ පසුගිය දෙසැම්බර් 02 වැනිදා. ඊට පාදක වෙන්නේ මොකක්ද? පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිපියට පාදක වෙන්නේ 2018.11.23 වන දින කොමසාරිස්වරයා වෙත ලැබුණු 2018 මාර්තු මස 27 වැනිදා - මම මේ ප්‍රකාශය කරන්නේ හත්වැනි මාසයේ. මේ ලිපිය ලැබිලා තිබෙන්නේ 2018 මාර්තු මාසයේ. ඊට පස්සේ ඇමතිවරයා නියෝගයක් කරනවා. ඒ සියල්ල තිබෙද්දී පළාත් පාලන කොමසාරිස්වරයා මාර්තු මස 27 වැනි දින ලිපියට 2018.11.23 වැනිදා මෙයා ලිපියක් යවනවා. මේක අප්‍රසන්නද? නැද්ද? දැන් මේක ඇතුළේ කුමන්ත්‍රණය තේරෙනවාද? ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හෝද හෝදා මඬේ දාන්න මට ඕනෑ නැහැ. අවශ්‍ය ලේඛන සියල්ල මා අද සභාගත කරනවා. අඩුම වශයෙන් අලුත් ආණ්ඩුකාරවරයෙක් පත් කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒ ආණ්ඩුකාරවරයා කොපමණ කල් ඉඳියිද කියලා. අලුත් ආණ්ඩුකාරවරයාගෙනුත් මේ සංගමය සාකච්ඡාවක් ඉල්ලලා තිබෙනවා කියලා මට ඊයේ දැනගන්න ලැබුණා. ඒ නිසා අඩුම ගණනේ අලුත් ආණ්ඩුකාරවරයාගේවත් හදවතේ තෙතමනයක් තියෙයි කියලා මම විශ්වාස කරනවා, මේ නිලධාරීන් සම්බන්ධයෙන් කථා කරන්න. අපේ ඉහළම පරිපාලන නිලධාරියා මේ සභාවේ ඉන්නවා. අපේ හිතවත් ප්‍රධාන ලේකම්තුමා. එතුමාත් මේ කථාව අහගෙන ඉන්නේ. එතුමාට යටත් පළාත් පාලන කොමසාරිස්වරයා. ඒ නිසා මේවා වෙන්නේ කොහොමද? කළ යුත්තේ මොකක්ද කියලා අඩුම ගණනේ අපේ ගරු මහ ඇමතිතුමාට උපදෙසක් දෙන්නය කියලා එතුමාගෙනුත් ඉල්ලීමක් කරමින්, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතියි. මේ විශේෂ ප්‍රකාශය පදනම් වන්නේ පාසල් පාවහන් ලබා දීම ගැන. පළාත් අරමුදලින් පාසල් ළමුන් සඳහා පාවහන් ලබා දීම. මෙවර පාසල් ළමුන් සඳහා

බස්නාහිර පළාත් අරමුදලින් පාවහන් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වීම සතුටට කරුණකි. එසේ වුවද විවිධ මන්ත්‍රීවරුන්ගේ නම් සහ ඡායාරූප ඇතුළත් පාවහන් සඳහා වන අයදුම්පත් ප්‍රදේශයේ ඇතැම් ළමුන්ට පමණක් ලබා දීමෙන් එකී පාවහන් ලබා දීමේ වැඩ සටහන දේශපාලනීකරණය වී ඇතුවා පමණක් නොව, එකම පළාතේ, එකම පාසලේ අධ්‍යාපනය ලබන දරුවන් හට වෙනස් කර සැලකීමෙන් ඔවුන්ගේ මූලික අයිතීන්ද උල්ලංඝණය වීමක්ද සිදු වී ඇත. තවද දේශපාලන ගැතිකම් කරන පිරිසකගේ දරුවන්ට පාවහන් දී ඇතැම් දරුවන් නොසලකා හැරීමෙන් අනෙක් දරුවන්ගේ මානසිකත්වයේ බිඳ වැටීමක් ද මෙමගින් සිදුවේ. මෙම පාවහන් බෙදාදීම දේශපාලනීකරණය කර තමන්ට තැනක් සාදා ගැනීමට උත්සාහ කරන දේශපාලන අඳ බාලයන් නිසා දේශපාලනයේ නියුතු සැමටම සමස්ත ජනතාවගේම දෝෂ දර්ශනයට ලක් වීමට සිදුව ඇත. එපමණක් නොව මෙම පාවහන් ලබා දීමේ සමාජ මෙහෙවර තුළින් බස්නාහිර පළාත් සභාවට හිමි වීමට තිබූ ගෞරවයද මෙමගින් අහිමි වී ඇත. සමස්ත ජනතාවම මේ සම්බන්ධයෙන් දෝෂ දර්ශනයෙන් කථා කරයි.

එහෙයින් මෙම ක්‍රියා පිළිවෙත අති පිළිකුලෙන් යුතුව හෙළා දකින අතර දරුවන් අතර අසමගිකම් ආරවුල් ඇතිවන ලෙස කටයුතු කරමින් දේශපාලනයේ නම් හදා ගැනීමට වැරැදි පූර්වාදර්ශ සපයන, දේශපාලනය කුමක්දැයි හරි හැටි නොදන්නා දේශපාලන අඳබාලයන්ද පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. එහෙයින් මෙම ක්‍රියා පිළිවෙත ඉතා පිළිකුලෙන් යුතුව හෙළා දකින බව මා මෙම සභාවට නැවතත් ප්‍රකාශ කරනවා. ඇත්ත වශයෙන්ම දරුවන් අතර අසමඟිකම්, ආරවුල් ඇති වන ආකාරයෙන් දේශපාලනයේ නියැලෙමින් වැරැදි පූර්වාදර්ශ ලබාදෙන, මේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරන දේශපාලන අඳබාලයින් ද මා පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා.

මෙරට නිදහස් අධ්‍යාපනය තුළින් නොමිලේ පාසල් පොත්, නොමිලේ නිලඇඳුම් නොමිලේ , දිවා ආහාර, රක්ෂණ ක්‍රම ලබා දීමට දායක වූ දේශපාලන නායකන් එම වරප්‍රසාද සියලුම පාසල් ළමුන්ට පොදුවේ භුක්ති විඳීමට ඉඩ සැලසුවා විනා තෝරා බේරාගෙන, මන්ත්‍රීගේ ගෙදරට කැඳවා, ඇතැම් අය හරවා යවා මේ විධියට කටයුතු කළේ නැහැ. ඒ නිසා මෙවන් සුබසාධන කටයුතු මගින්, ඒවා විකුණාගෙන කමින් කටයුතු කිරීම සුදුසු නොවන බව මා සභාවට පවසා සිටිනවා.

ඒ නිසා ජනතාව පිළිබඳ වගකීමක් දැරිය හැකි පළාත් සභාවක් ලෙස පාසලේ සිටින සියලුම සිසුන් සංඛ්‍යාව අනුව ඒ සෑම සිසුවෙක්ටම වෙනසක් නොවන ලෙස සලකා සෑම කෙනෙකුටම ඒ පාවහන් ලැබෙන පරිදි මෙම වරප්‍රසාද භුක්ති විඳිය හැකි පරිදි එම කටයුතු ක්‍රියාත්මක කිරීමෙන් මෙම වැරැදි සාදා ගැනීමට හැකියාව තිබෙනවා. ඒ නිසා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, සියලුම අමාත්‍යවරුන්ටත් මන්ත්‍රී මණ්ඩලයෙනුත් විශේෂ ඉල්ලීමක් කරනවා. මේ පාවහන් බෙදා දීම වැනි වැඩ සටහන්වලදී දේශපාලනීකරණය කිරීම සම්පූර්ණයෙන් පැත්තකින් තියලා, ඒ අසරණ දරුවන් පවා මානසික අපහසුතාවට පත් නොවන ලෙස, විශේෂයෙන්ම පාසල් දරුවන් දේශපාලනයට ඇඳා නොගෙන මේ කටයුතු කරන්නය කියලා මා විශේෂ ප්‍රකාශයෙන් සඳහන් කරනවා.

ඒ වාගේම මෙලෙස බෙදා දෙන පාවාහන් සම්බන්ධයෙන් විවිධ මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කරමින් නිකුත් කරලා තිබෙන අයදුම්පත්‍රයක් මම සභාගත කරනවා. ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කවුරුත් දේශපාලනය කරනවා. නමුත් පාසල් දරුවන් මෙයට ඇඳා ගැනීම සුදුසු වන්නේ නැහැ. පොදුවේ පාසලක් තෝරාගෙන මන්ත්‍රීවරයෙක් හරි හැමෝටම දෙනවා නම් ඒකේ ගැටලුවක් නැහැ. මෙයින් වෙන්නේ ළමයින් අපහසුතාවයට ලක් වීමක්. මධ්‍යම රජයෙන් දෙන දීමනාවලදී පවා වෙනසක් නොකර දෙන්නේ, එක්කෙනෙක් දූප්පත්. එක්කෙනෙක් පොහොසත් කියලා වෙනස් කරලා දරුවන්ගේ මානසික තත්ත්වය වට්ටන්න ඕනෑ නැති නිසා තමයි පොහොසත් ළමයින්ට පවා ඒ දීමනා හිමි වෙන්නේ. ඒ නිසා මේ ගැන මෙම විශේෂ ප්‍රකාශයෙන් අවධානය යොමු කරමින්, අයදුම්පත්‍රය සභාගත කරමින් මෙවැනි බාල වැඩ කරන්න එපාය කියන ප්‍රකාශය කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමිය, බොහොමත්ම ස්තුතියි. මීළඟට උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා උදේ ඉඳන්ම සිටියා. ඉඳලා ඊට පස්සේ ශාරිරික අවශ්‍යතාවයක් සඳහා එළියට ගියා. එම නිසා මම එතුමාගේ ප්‍රකාශය ඉදිරිපත් කරන්න එතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තූතියි. මම මේ අත්‍යවශ්‍ය ප්‍රකාශයක් කරන්නේ. අපේ ප්‍රදේශයේ නුගේගොඩ සමුද්‍රදේවි බාලිකා විද්‍යාලයට, ඒ කාලයේ සිටම ගංගොඩවිල ප්‍රදේශයේ තිබුණු ජයසිංහ විද්‍යාලය අපි ඒකාබද්ධ කළා. එතකොට මේ ඒකාබද්ධ කිරීම තුළ රෙජිනෝල්ඩ් කුරේ හිටපු ගරු මහ ඇමතිතුමා, ඒ වාගේම අපේ ප්‍රසන්න රණතුංග හිටපු ගරු මහ ඇමතිතුමා ඒ ප්‍රදේශයේ හිටපු ආදිශිෂ්‍යයන්ගේ, ඒ ප්‍රදේශයේ හිටපු දෙමව්පියන්ගේ දරුවන් වෙනුවෙන් වෙනම පන්ති කාමරයක් ඇති කරන්න, ඒ දරුවන් ඇතුළත් කරගන්න කටයුතු කරන ගිවිසුම යටතේ තමයි මේ පාසල ඒකාබද්ධ කරන්න දෙමව්පියන් එකඟ වුණේ. මම මීට පෙරත් මේ සභාවේ අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට මේ ප්‍රකාශය කළාම එතුමා කිව්වා, නිලධාරී මහත්වරුන්ට උපදෙස් දීලා මේ ක්‍රියාව කරනවා කියලා. නමුත් මේ වනතුරු ඒ ප්‍රදේශයේ ඉන්න දරුවන් 15 දෙනෙකුට විතර දැනට මේ ඉස්කෝලේ අහිමි වෙලා තිබෙනවා. දැන් ඒ අයට වෙනත් ඉස්කෝලයට යන්න පුළුවන්කමකුත් නැහැ. තමාගේ ගමේ තිබෙන ඉස්කෝලේ, සමුද්‍රදේවියට අපේ ගංගොඩවිල තිබෙන ජයසිංහ විද්‍යාලය ඒකාබද්ධ කිරීම තුළින් ඒ ඇති වුණු ගිවිසුමත් එක්ක, ඒ ඇති වුණු පොරොන්දුවත් එක්ක ඒ දෙමව්පියන් වෙනත් තැන්වලට අයදුම් කළෙත් නැහැ. මේ නිසා මේ පන්තිය වෙන් කරලා, ගරු අධ්‍යාපන ඇමතුමාට ඔබතුමා හරහා මෙය දන්වලා මේ ලැයිස්තුවේ ඉන්න අයව ඇතුළත් කරගන්න, කටයුතු කරන්න.

දැන් නුගේගොඩ ඉස්කෝලෙට ඒ ප්‍රදේශයේ ඉන්න අය ගත්තාම අර තිබෙන චක්‍රලේඛය අනුව අර ලකුණු සංඛ්‍යාව දෙන්න බැහැ. අර Interview board එකට ඒක කරන්න බැහැ. ඒ නිසා තමයි අර ගංගොඩවිල, විජේරාමේ තිබුණු ජයසිංහ විද්‍යාලයට වෙනම පන්තියක් හදලා, ඒ ප්‍රදේශය වෙන් කරලා, ඒ ප්‍රදේශයේ දරුවන්ව ඇතුළත් කරන්නය කියලා තමයි අපි ගිවිසුමේ ඇතුළත් කරලා තිබුණේ. එතකොට අපේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉන්න නිලධාරී මහත්වරු, අපේ ප්‍රධාන ලේකම්තුමා ඉන්නවා. මේ ගැන සලකා බලලා මේ කටයුත්ත කරන්න. එහෙම නැත්නම් අර දරුවන්ට පාසලක් නැහැ. මේ දරුවන්ට ඉගෙන ගන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. වෙනත් ඉස්කෝලයක් ඒ ළඟ ඇත්තෙත් නැහැ. ඒ දෙමව්පියන් දරුවන් වෙනුවෙන් වෙනත් පාසලකට අයදුම්පත් ඉදිරිපත් කරලත් නැහැ. මේ සම්බන්ධයෙන් මීට පෙරත් අපි ප්‍රකාශ කළාට ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ ගැන ශතේකටවත්, තුට්ටුවකටවත් ගණන් ගන්නේ නැහැ. අපි පොරොන්දුවක් වෙලා තමයි අයවැය විවාදයේදී එතුමාට ඡන්දය දුන්නේ. මෙවැනි ප්‍රශ්න සියල්ලක්ම විසඳලා දෙනවා කිව්ව පොරොන්දුව මත. ඒ නිසා එතුමා එහෙම නොකරනවා නම් ඊළඟ සභාව වන විට අපි වෙනත් තීරණයක් ගන්න කටයුතු කරනවා කියන එකත් මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. මොකද මේ අධ්‍යාපන චක්‍රලේඛ නිකුත් කරලා තිබෙන - වැසී යන පාසල් ඒකාබද්ධ කිරීම තුළ විශාල වශයෙන් වැසී යන පාසල් සංඛ්‍යාවක් පසුගිය කාලයේ පළාත් සභාව තුළ අපට අරින්න පුළුවන් හැකියාවක් ලැබුණා. අන්න ඒ අනුව මේ පාසලේ තිබුණු ඒ අවස්ථාව නැවත ඒ දරුවන්ට ලබා දෙන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිමින්, ඒ ප්‍රදේශයේ දෙමව්පියන්ටත් ඒ අවස්ථාව ලබා දෙන්නය කියලා ඉල්ලමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට මගේ ගෞරවනීය ස්තූතිය පුද කරමින් මගේ වචන ස්වල්පය මම අවසන් කරනවා.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"2018.10.23 හා 2018.12.19 යන දිනවල පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී ලද එකඟතාවයට අනුව, කාර්ය පටිපාටි රීති අංක 39(4) හා 53(3) හි විධිවිධානයන් කෙරෙහි තැකීමකින් තොරව, අද දිනට (2019.01.08 දිනට) නියමිත න්‍යාය පත්‍රයේ අංක XII පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු විෂයය යටතේ ඇතුළත් කාර්යයන්හි අනුපිළිවෙළ, පිළිවෙළින් කාර්යය අංක 02 හා 01 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කිරීමට මෙම පළාත් සභාව එකඟ වෙයි."* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව එකඟයිද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාවේ ගිය අවුරුද්දේ අයවැය වෙලාවේදී අපි කිව්වා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලාට මොකුත් කියවන්න බැහැ. දැන් මේ අපේ ගරු ඇමතිතුමාටත් කියවා ගන්න අමාරු තත්ත්වයක් තිබෙන්නේ. Reading lamp එකක්. මේ තිබෙන ලයිට් සංයුතියත් එක්ක මේ ඉස්සරහා ඉන්න අයට පේනවා අඩුයි. ඒ නිසා Reading lamp එකක් සවි කරන්න කියලා අපි කිව්වා. එය ගෘහ කාරක සභාවට යොමු කරලා, එය ඉටු කර දෙන්නය කියලා ඉල්ලීම කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කලින් ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධව සභාවේ එකඟතාවය?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය : පළමුවනවර කියැවීම
## WESTERN PROVINCIAL TOURIST BOARD STATUTE : FIRST READING

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2018 අංක .... දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය"* පළමුවන වර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා රීති ප්‍රකාරව මීළගට තිබෙන්නේ ලේකම්වරයා විසින් අසුනින් නැඟිට ප්‍රඥප්තියේ පූර්විකාව කියැවීමයි. ඒ අනුව ප්‍රඥප්තියේ පූර්විකාව මෙම සභාව හමුවේ ප්‍රකාශ කරන ලෙස මම සභා ලේකම්තුමාට ඇරයුම් කරනවා.

**[පූර්විකාව ]*
*[Preamble]*

**හේමන්ත සමරකොන් - සභා ලේකම්**
Hemantha Samarakoon - Council Secretary

ගරු නියෝජ්‍ය සභාපතිතුමාගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව ලෙසින් වූ,

*"බස්නාහිර පළාත තුළ සංචාරක කටයුතුවල නියැලෙන්නන්ගේ වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම, ඔවුන්ට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය හා සහාය සේවාවන් සැපයීම, සංචාරක සේවාවල ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම, සංචාරක ආකර්ෂණ ස්ථානයන් ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා පළාතේ දේශීය හා විදේශීය සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා ද, බස්නාහිර පළාතේ සංචාරක මණ්ඩලය සංස්ථාපනය කිරීම සඳහා ද, 1994 අංක 03 දරන බස්නාහිර පළාත් සංචාරක මණ්ඩල ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා හා ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලසීමටද වූ ප්‍රඥප්තියකි."* යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කර සිටිනවා. ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභා රීති ප්‍රකාරව ප්‍රඥප්තියේ පළමුවර කියැවීමේ වැඩ කටයුතු දැන් නිමා වුණා. මීළඟට එම ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන්න පුළුවන්. එහෙම නැත්නම් ඊළඟට විවාදයට ගන්න දිනයක් නියම කරගන්නත් පුළුවන්. ඒ අනුව මෙම ප්‍රඥප්තිය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනවා.

***අනතුරුව, ප්‍රඥප්තිය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.***
*Accordingly, it was ordered that the Statute be forwarded to the Committee on Statutes and Laws.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට පෞද්ගලික මන්ත්‍රී යෝජනා තිබෙන්නේ. නමුත් ඊට අමතරව රීති අත්හිටුවීමේ යෝජනාවක් එවලා තිබෙනවා. ඒ රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ, හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා. රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

# රීති අංක 110 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 110

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අංක 110 අත්හිටුවා මගේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඔබතුමා ඇතුළු සියලුම දෙනාට සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. රීති අත්හිටුවීමේ යෝජනාව,

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 110 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂංගිකව කාර්ය පටිපාටි රීති 14(6), 14(7)(ආ), 19(1), 19(3), 39, 53(2), 53(3) යන රීති අත්හිටුවිය යුතු බවට යෝජනා කරමි."*

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු
PRIVATE MEMBER'S AFFAIRS

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතනවා මේ යෝජනාව කාලෝචිතයි කියලා. අද රටේ බොහොම දැවෙන ප්‍රශ්නයක්. අපි බේරිලා හිටිය තැනක්. එතැනින් ගැලවීම උදෙසා මට ලැබුණු තොරතුරුත් එක්ක මම මේ සභාව හරහා මහ ආණ්ඩුවටයි යමක් කියන්න උත්සාහ ගන්නේ කියලා මම ඔබතුමාට මතක් කරමින්,

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"බරවා, මැලේරියා රෝග ලංකාවෙන් සම්පූර්ණයෙන් තුරන් වී ඇතැයි සිතාගෙන සිටිමු. ඒ ගැන ලෝකයට හඬගා කියමු. නමුත් යථාර්ථය එය නොවන බව බස්නාහිර පළාතේ මෑතකදී කළ පරීක්ෂණවලින් හෙළි වී ඇත.*

*එබැවින් මෙතෙක් ලෝක සෞඛ්‍ය සංවිධානය අප රට බරවා, මැලේරියා රහිත රටක් ලෙස කරන ලද නම් කිරීම වර්තමානයේ අභියෝගයට ලක් වී ඇත. මෙයින් සිදු වන්නේ, අනවශ්‍ය සෞඛ්‍ය බරක් දැරීමට ආණ්ඩුවට සිදුවීමයි. අනාගතයේ සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන් අඩපණ වීමට හේතුවක් විය හැක. පසුගිය මාස කිහිපය තුළ කරන ලද පරීක්ෂණවලදී හෙළි වී ඇත්තේ 30% ක් පමණ බරවා අසාධිත බවයි. 2018 මැලේරියාව අසාධිත සංඛ්‍යාව 48 ක් බව හෙළි වී තිබේ.*

*මෙහි බරපතළ තත්ත්වය, විදේශ රටවලින් පැමිණ මෙරට සේවය කරන කම්කරුවන් බරපතළව මෙම රෝගවලට ගොදුරු වී තිබීමයි. කිසිදු පරීක්ෂාවකින් තොරව මෙරටට රැගෙන එන විදේශ කම්කරුවන් නිසා රට ඉතා බරපතළ සෞඛ්‍ය ගැටළුවකට මුහුණ පා සිටී.*

*එබැවින් මේ පිළිබඳ අවධානය යොමු කර, අදාළ අංශ වහාම ක්‍රියාත්මක වී විදේශ කම්කරුවන් පරීක්ෂා කර ගත හැකි පියවර කඩිනමින් ගන්නා ලෙස මෙම ගරු සභාව රජයෙන් ඉල්ලා සිටී."*

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[පූ.භා. 11.20]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම විශ්වාස කරනවා, මෙම යෝජනාව ඉතා වැදගත් කියලා. හේතුව අප මේ වෙලාව වන කොට අප රට බරවා, මැලේරියා රෝගවලින් තුරන් කරපු රටක් හැටියට තමයි අපි පත් වෙලා සිටියේ. පසුගිය වර්ෂ කිහිපය තුළත් ලෝකයේ සියලු සෞඛ්‍ය සංවිධාන පිළිගත්තා අපේ රට මැලේරියාවත්, බරවා රෝගයෙනුත් free කියලා. ඒගොල්ලෝ නිදහස් කරපු රටක් බවට. අපි බොහොම සන්තෝෂයෙන් සිටියා. අපේ සෞඛ්‍ය

දෙපාර්තමේන්තුවට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. විශේෂයෙන්ම බස්නාහිර සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හරියටම මේ වැඩේ කරනවා. රාජ්‍ය මට්ටමෙනුත් මේ වැඩේ කරගෙන යනවා. නමුත් මේකේ දැන් පොඩි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ බොහොම සත්භාවයෙන්. මේක ගැටලුව වෙලා තිබෙන්නේ, ලංකාවේ මේ බරවා තත්ත්වයත්, මැලේරියා තත්ත්වයත් දැන් මේ වන විට තුරන් වෙලා තිබෙන අවස්ථාවක, අපි BOI Project වලට, අනිකුත් ආයතනවලට මේ රටට විදේශ ශ්‍රමිකයන් ගෙන්වා ගැනීමට අවසරයක් ලබා දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේකෙන් කවමදාවත් බලාපොරොත්තු වෙන්නේ නැහැ මේ ගෙන්වන සේවකයන් නවත්වන්න කියලා. අපට සේවකයින් අවශ්‍යයි. මේ රටේ ව්‍යාපාරිකයන්ට සේවකයන් නැතිව හරි අර්බුදයක් මතු වෙලා තිබෙනවා. මේක මම මුලින් කියලා පටන් ගන්න ඕනෑ. මගේ මේ චේතනාව, මගේ මතය අපි මේක වෙනස් විධියකට කරන්න ඕනෑය කියන එකයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2018 වර්ෂයේ මැලේරියා රෝගීන් 48 දෙනෙක් ලංකාවේ හමු වෙලා තිබෙනවා. ඉතාම භයංකරයි. එක්කෙනෙක්වත් පසුගිය කාලයේ හමු වුණේ නැහැ. 2018 වර්ෂයේ 48 දෙනෙක් මැලේරියා රෝගීන් හමු වෙන කොට, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අයගෙන් 39 ක් ඉන්දියාවෙන් පැමිණි ශ්‍රමිකයන්. මම හිතන්නේ මේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජීවත්වන ගරු මන්ත්‍රීවරුන්ට මේ කාරණාව වැදගත් වෙයි. මේ අය බහුතරයක් හමු වන්නේ ගම්පහින්. මොකද මේ විදේශික ශ්‍රමිකයෝ ගම්පහ යකඩ ෆැක්ට්‍රි ආයතන කිහිපයකම වැඩ කරනවා. මේ අපේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය පාරවල්වල, ඒ වාගේ කාර්මාන්ත ආයතනවල check කළාම මේ මැලේරියා රෝගය වැළඳුණු ඉන්දියන් ජාතිකයන් 39 දෙනෙක් හමු වෙලා තිබෙනවා. මේකෙන් 09 දෙනෙක් අපට ශ්‍රී ලාංකිකයන් හැටියට සොයාගන්න හැකි වෙලා තිබෙනවා. විදේශ සංචාරවල යෙදිලා එන අය ලංකාව ඇතුළට එන කොට ඒකෙන් 09 ක් අපට ලංකාවේ පුරවැසියන් ලෙස අපට සොයාගන්න හැකි වෙලා තිබෙනවා. මේකෙන් එක්කෙනෙක් ඉන්දියන් ජාතිකයෙක් එක්ක බොහොම ළඟින් ඇසුරු කළ කෙනෙක්. එලෙස එක මැලේරියා රෝගයෙක් හමු වෙලා තිබෙනවා. අපි මේක නවත්තාගෙන යන, තුරන් කරගෙන යන වෙලාවක අපට මේ වාගේ දෙයක් අහන්න ලැබුණාම බොහොම කනගාටුදායක තත්ත්වයක්.

ඒ විතරක් නොවෙයි. බරවා රෝගය ගැන අපි කථා කළාම 2% ක් තමයි බරවා රෝගීන් ශ්‍රී ලංකාවෙන් අපට හමු වෙලා තිබෙන්නේ. මේ හමු වෙන්නේ දෙහිවල, ගල්කිස්සේ තදාසන්න ප්‍රදේශවල ජීවත්වන, කොළොන්නාව වැනි ප්‍රදේශවල සාමාන්‍යයෙන් ළඟ ළඟ නිවාසවල ජීවත්වන උදවියගෙන් තමයි අපට බරවා රෝගීන් හමු වන්නේ. නමුත් මේ තත්ත්වය අවම කර ගැනීම සඳහා අපේ බස්නාහිර පළාතේ සෞඛ්‍ය ක්ෂේත්‍රය එය මැඩ පැවැත්වීම සඳහා සැහෙන වෙහෙසක්, මහන්සියක් අරගෙන, මෙය මැඩ පවත්වලා තිබෙනවා. නමුත් මේ වන විට මේ පරීක්ෂණ පැවැත් වූවාම අපට 5% ක් පිටරටින් ශ්‍රමිකයන් ඇවිල්ලා ඉන්න තැන්වල හමු වෙලා තිබෙනවා. ඉන්දියාවෙන් පැමිණිලා ඉන්න අය තුළින්. අපි යෝජනා කරන්නේ, මේකට සැලැස්මක් හදාගන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකට ක්‍රමවේදයක් හදාගන්න ඕනෑ. මේක තමයි විය යුත්තේ. මම හිතනවා, දැන් බරවා රෝගීන් ගත්තාම Screen පරීක්ෂාවක් කරන්න ඕනෑ. ගුවන්තොටුපළින් ඇතුළට එන කොට, එහෙම නැත්නම් ඒ රටින් කර ගත්ත පරීක්ෂණවල නිර්දේශ වාර්තාවන් අරගෙන ඒමේ තත්ත්වයන් අපි ගන්න තත්ත්වයට පත් වෙන්න ඕනෑ. අපි පිටරටකට ගියොත් කෙන්යාව හරි, රුසියාව වාගේ රටවලට යන කොට මෙහෙන් බරවා, මැලේරියා වාගේ බෙහෙත් එන්නත් කරගත් යන්න අවසරය නැතිව වීසා දෙන්නේ නැහැ. කෙන්යාවට ගිය ගමන් අහනවා, කෝ උඹගේ එන්නත් කරපු report එක කියලා. ඒ වාගේ තත්ත්වයක් තිබියදී අපි ඇයි අහක බලාගෙන ඉන්නේ. මේ සියල්ල අපි නිරාකරණය කරගෙන මේවායින් මිදිලා ඉන්න රටක් වශයෙන් අපි මේවාට සැලසුම් සකස් කරගන්නේ නැත්තේ ඇයි කියන එක අපට පොඩි ප්‍රශ්නයක්.

දැන් මේ අතරේ තිබෙනවා. මේ රෝගය වැළඳිලා සොයා ගන්න බැරි කොට්ඨාශයකුත් ලංකාවේ මේ අතරතුරේ ඇති. හැංගිලා, වහන් වෙලා සොයා ගන්න බැරි තත්ත්වයක්. මේක ගැනත් අපි අවධානය යොමු කරන්න ඕනෑ. මම කනගාටු වෙනවා. අද අපේ සෞඛ්‍ය ගරු ඇමතිතුමා නැහැ. සන්තෝෂ වෙනවා. ගරු මහ ඇමතිතුමා මේකට නිරන්තරයෙන් අපිත් එක්ක මැදිහත් වෙයි. ලේකම්තුමා ඉන්නවා. එතුමාත් අපට මේ සඳහා ඉතා වැදගත් වෙයි. මම මේකෙන් බලාපොරොත්තු වෙන්නේ එකම දෙයක් තමයි, මේක හරහා අපි මහ ආණ්ඩුව දැනුවත් කරන්න ඕනෑ. අපි මේ සභාව හරහා මේ යෝජනාව අරගෙන මහ ආණ්ඩුවත්

[ගරු හරිස්චන්ද්‍ර කොස්තා]

එක්ක එකතු වෙලා අපට තනියෙන් මේ විදේශ ශ්‍රමිකයන් එන එකට නීති පනවන්න බැහැ. නමුත් මහ ආණ්ඩුවත් එක්ක එකතු වෙලා මේකට වැඩ සටහනක් හදා ගන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. දැන් මේවායේ තිබෙන වටිනාකම්, WHO එකේ තිබෙන වටිනාකමත්, UN එක, යුනිසෙෆ් එකේ තිබෙන වටිනාකමත් දන්නේ නැහැ. අපට මේ ආයතනවලින් සේවාවන් රාශියක් සිද්ධ වෙනවා. අපි ඒවාට ගරු කරන්න ඕනෑ. සමහර දේශපාලඥයෝ against එකට ගිහින් ඒවාත් එක්ක ගේම ඉල්ලනවා. ඒක නොවෙයි වැඩේ. අපට ඒ අයගෙනුත් ගත යුතු දේවලුත් තියෙනවා. අපේ රටට විශාල සේවාවන් රාශියක් සිද්ධ කරන ආයතන. අපට මේවාගෙනුත් උදව් ගන්න පුළුවන්. අපි මේවායින් උදව් ගන්නේ නැතිව, ඒවායින් ගේම ඉල්ලන එක නොවෙයි වැඩේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හරහා අපි ගියාම, මේ BOI ව්‍යාපාරිකයන්ට පිටරට ශ්‍රමිකයන් ගෙන්වා ගන්න අවසරය දීලා තිබෙනවා. ඒ අයව ගෙන්න ගෙන, මේකට උදව් උපකාර කරගෙන, ඒ අයගේ ව්‍යාපාර කඩා වට්ටන්න නොවෙයි. මේ සියල්ල එක්රැස් කරගෙන යන්න ඕනෑ ගමනක් කියලා කියන්න ඕනෑ. එහෙමනම් මට මේ යෝජනාවට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ, මේ යෝජනාව ඉදිරිපත් කරමින් (බාධා කිරීමක්) කොහොම හරි ඔබතුමා මේකට සවන් දුන්න එක පිළිබඳවත්, විහිළුවක් කළාට ප්‍රශ්නයක් නැහැ. අපි එකතු වෙලා අපි බස්නාහිර පළාත් සභාවේ විශාල සේවයක් මේ සම්බන්ධව කරන්න අවස්ථාවක් සලසා ගෙන, සෞඛ්‍ය ඇමතිතුමාවත් දිරිගන්වාගෙන, සෞඛ්‍ය අමාත්‍යාංශයත් දිරි ගන්වාගෙන ඔබතුමාත් එකතු වෙලා යමක් මහ ආණ්ඩුවත් එක්කත් කථා කරලා යමක් කරන්න හැකියාව, ශක්තිය ලබා ගනිමු. තවත් අදහස් ටිකක් ඔබතුමන්ලාගෙන් මේ යෝජනාවට ලබා ගන්න හැකියාව ලැබේවායි කියලා ප්‍රාර්ථනය කරමින් මගේ මේ අදහස ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.27]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම අපේ හරිස්චන්ද්‍ර කොස්තා සහෝදර ගරු මන්ත්‍රීතුමාට මගේ ගෞරවය පුද කරනවා, මේ යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. ඇත්ත වශයෙන්ම ඔහු මේ ඉදිරිපත් කරන කාරණාවල සත්‍යයක් පවතිනවා කියන කාරණාව විවාදයකට ලක් වන්නේ නැහැ. මන්ද ශ්‍රී ලංකාව අතිරමණීය, සෞන්දර්යාත්මක වශයෙන් විශාලම ස්වභාවික සම්පත්වලින් අඩුවක් නැති රටක්. මේ රටේ මූලික සෞඛ්‍ය පහසුකම්, ඒ වාගේම විශේෂයෙන්ම බෝවන රෝගවල ප්‍රවනතාවය ඉතාම අඩු මට්ටමක පැවතුණත්, සංචාරක ව්‍යාපාරයේදී ඉතාමත් විශාල ලාභ අත්පත් කරගන්න පුළුවන් පරිසරයක් තිබෙන රටක්. ඒ වාගේම රටේ අභ්‍යන්තරයේ ජීවත්වන ජනතාවට තමන්ගේ ජීවිතය පිළිබඳව අවිශ්වාසයකින් තොරව සමස්තයක් ලෙස රටේ ඕනෑම තැනක ජීවත් වෙන්න පුළුවන් පාරිසරික තත්ත්වයන් ගොඩනගා ගන්න නම් මෙවැනි රෝගාබාධ තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා අපට තිබෙන ඉඩකඩ සම්පූර්ණයෙන්ම භාවිතා කළ යුතුව පවතිනවා.

දැන් පසුගිය කාලවකවානුව තුළ විශේෂයෙන්ම දැන් මේ රෝග දෙක - සාමාන්‍යයෙන් ෆයිලේරියා, බරවා රෝගය ආසාධිත රෝගියෙක් මියැදෙන්නේ නැහැ. නමුත් ඔහුට දරුණු විධියට තමන්ගේ ශරීරයේ වන අස්වාභාවික තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ වාගේම කොළරාවය, මැලේරියාව වැනි රෝග ශරීර අභ්‍යන්තරයේ ඒ විෂබීජ තැන්පත් වුණාට පස්සේ ඉතාමත් අවාසනාවන්ත ආසාධිත තත්ත්වයන්ට පත් වෙනවා. මේවා පැතිර යෑමේ ප්‍රවනතාවය හරි ශීඝ්‍රයි. දැන් ඒක අඩු වෙලා, අඩු වෙලා ගිහිල්ලා පාලනය කළ හැකි මට්ටමක තිබුණත් මේවා ගැන අවධානයට ලක් නොවුණොත් එහෙම පැතිරීම ඉතාම වේගවත්ව සිද්ධ වෙන්න පුළුවන් රෝග තත්ත්වයන්. ඒ නිසා මේවා සහමුලින් උපුටා දැමීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග සඳහා ප්‍රවේශවීම ඉතාමත්ම වැදගත් කාරණාවක්. ඒ නිසා මේ නැවත හිස ඔසවන මොහොතේ මේ යෝජනාව වගකිවයුත්තන්ගේ අවධානයට ලක් කිරීම ඉතාමත් වැදගත් කාරණාවක්.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කනගාටු වෙනවා. මේ ඉදිරිපත් කරපු යෝජනාවටම ඩෙංගු රෝගයත් බද්ධ වෙන්න ඕනෑ. මොකද, ඩෙංගු රෝගය මිනිසෙකුගේ ජීවිතය විනාශ කරන්න පුළුවන් රෝග තත්ත්වයක්. ඩෙංගු මදුරුවාගේ විනාශය සම්බන්ධයෙන් අපට විශාල ප්‍රශ්නයක් පවතිනවා. දැන් ලංකාවේ මැලේරියාව වාගේ වසංගත රෝග ඇති වුණාම මේ රෝග මර්දනය කිරීම සඳහා රටේ විශාල ව්‍යාපාර ඇති වුණා. සිවිල් සංවිධාන, ඒ වාගේම රාජ්‍ය නොවන සංවිධාන, ඒ වාගේම රජය මැදිහත් වෙලා, ලෝක සෞඛ්‍ය සංවිධානය මැදිහත් වෙලා එම රෝග තත්ත්වයන් පාලනය කර ගැනීම සඳහා

0073

විශාල වැඩ පිළිවෙළකට ගොනු වුණා. නමුත් අවාසනාවකට මෙපමණ දරුණු විධියට මිනිස් ජීවිතය විනාශ කරන ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා එසේ වූ වැඩ පිළිවෙළක් රටේ අභ්‍යන්තරයේ තවම ගොනු වෙලා නැහැ. දැන් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණාව වැදගත් කියන එක මම වැඩියෙන්ම අවධාරණය කරන්නේ, මේ රෝගී තත්ත්වයන් නැවත හිස ඔසවන්න හදන මොහොතේ මේක පාලනය කරගත්තොත් එහෙම, අපට විශාල වශයෙන් වාසිදායක තත්ත්වයක් පවතිනවා. දැනට කලාප හඳුනාගෙන, මේ ආසාධිතයට පත් වුණු රෝගීන් ඉන්නේ මොන කලාප වලද? මොන තැන්වලද? ඒක පැතිර යාමේ තත්ත්වය වළක්වා ගැනීම සඳහා දැන් මේ මොහොතේ ක්‍රියාත්මක වුණොත් එහෙම සෞඛ්‍ය අමාත්‍යාංශයටත්, ජනතාවටත් විශාල සහනයක් වෙනවා. එතකොට තුන්වැනි කාරණාවක් බවට පත් වෙනවා. එසේ නොවුණොත් එහෙම සිද්ධ වෙන්නේ මේවා ගණන් නොගෙන සිටියොත් විශාල වශයෙන් රටේ අභ්‍යන්තරය තුළ මේවා පැතිර ගිහිල්ලා අපට අවාසිදායක තත්ත්වය හැම පැත්තෙන්ම වැඩියි. ඒ නිසා අතිශයෙන්ම වැදගත් වෙනවා - ඉස්සර කාලයේ විශේෂයෙන්ම මැලේරියාව, කොළරාව වැනි රෝග ඇති වුණු කාලවකවානුව තුළ විශාල වශයෙන් ජනතාව ජීවිතක්ෂයට පත් වුණා. ඒ වාගේ මේවාට ඉදිරිපත් වුණු දේශප්‍රේමී ජනතාවත් ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා, ආචාර්ය ඇන්.එම්. පෙරේරා වැනි මහ විද්වතුන් බොහොම උනන්දුවෙන් ඒ කාලයේ තිබුණු වාමාංශික දේශපාලන ව්‍යාපාරයේ සාමාජිකයනුත් මේවා පාලනය කර ගැනීම සඳහා දේශපාලනමය වශයෙන් මැදිහත් වෙලා ක්‍රියාත්මක වුණා. ඒ විධියට තමයි ඒ තත්ත්වයන් පාලනය කර ගත්තේ. අවාසනාවකට අද මේ තත්ත්වය රටේ අභ්‍යන්තරයේ නැහැ. මිනිස්සු එදා වගේ මිනිස්සුන්ට ආදරය කරන්නේ නැහැ. ඒ කාලයේ ජීවත් වුණු මිනිස්සු, අසරණතාවයට පත් වුණු මිනිස්සු වෙනුවෙන් මහා කැපවීමෙන් ක්‍රියා කළා. අද එවැනි තත්ත්වයක් අපට පෙනෙන්න නැහැ. ඒ නිසා රජයේ මැදිහත්වීම සඳහා සෞඛ්‍ය සංවිධානවල මැදිහත්වීම අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි මෙය පාලනය කර ගැනීම සඳහා.

හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා අවධානයෙන් ඉඳලා මේ පිළිබඳව තමන්ට ලැබුණු තොරතුරු ඒකරාශී කර ගනිමින් හදිසි යෝජනාවක් හැටියට හරි මේ සභාවට යෝජනාව ඉදිරිපත් කරලා සාකච්ඡාවට බඳුන් කිරීම අතිශයම වැදගත් කියලා මා විශ්වාස කරනවා. මේ පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ගරු ප්‍රධාන

0074

අමාත්‍යතුමාගේ අවධානයට අපි ලක් කරනවා. ඔබතුමාගේ මැදිහත්වීමෙන් වගකිවයුත්තන්ට මේ පණිවිඩය යොමු කරලා, ඔවුන්ගේ අවධානය අවදි කරගෙන බැරෑරුම් තත්ත්වයකට පත් වෙන්න කලින් මේක වහ වහා පාලනය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතුවලට මැදිහත් වෙමුයි කියන කාරණාවත් මම අවධාරණය කරනවා.

ඒ එක්කම ගරු ප්‍රධාන ඇමතිතුමනි, පසුගිය දවස්වල ජනාධිපති කාර්යසාධන බලකායක් තිබුණා. මෙවැනි හදිසි තත්ත්වයන් පාලනය කර ගැනීම සඳහා ක්‍රියාත්මක වීමට. මේ වන කොට දැන් ඒවා යටපත් වෙලා. යටපත් වෙලා තිබෙන්නේ මොකද හේතුව, හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා මට එකඟවෙයිද මම දන්නේ නැහැ. ෆයිලේරියා - ඒ දවස්වල FA ලා field එකේ සිටියා. රෑට ඇවිල්ලා රුධිර පරීක්ෂාවට ලක් කළා. ඒ කණ්ඩායම් දැන් නැහැ. සොයාගන්න නැහැ. එක එක ප්‍රදේශවලට වෙන් වෙලා මුළු රටේම විසිරුණු කණ්ඩායමක් සිටියා. අඩුම ගණනේ මේ ආසාධිත තත්ත්වයට පත් වුණු රෝගීන් හඳුනාගත්තු ප්‍රදේශ ආවරණය කරන්නවත් මේ කණ්ඩායම් යොදවා ගැනීම අතිශයෙන්ම වැදගත් වෙනවා. එසේත් නැතිනම් පැතිරෙනවා. පැතිරීම වළක්වා ගන්න බැහැ. ඒ නිසා මම දන්නේ නැහැ, සෞඛ්‍ය බලධාරීන්ගේ අවධානය මේ වෙත යොමු නොවී තිබෙන්නේ මොන හේතුවක් නිසාද කියන එක. මම යළි යළිත් අවධාරණය කරනවා. විශේෂයෙන්ම ඩෙංගු හැම වර්ෂයකම එක්තරා කාලපරිච්ඡේදයක හිස ඔසවනවා. ඒකෙනුත් අපේ රටේ විශාල ජනතාවක් ජීවිතක්ෂයට පත් වෙනවා. මම අද සූදානමින් ආවේ නැහැ. නැත්නම් මා ළඟ බොහෝ තොරතුරු තිබෙනවා. අපි මේ සියල්ල පිළිබඳව අවධානය, විශේෂයෙන්ම සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වගකිවයුතු නිලධාරීන්ටත්, ඒ වාගේම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මේවා සඳහා උපකාර, උදව් කරන සංවිධානවලටත් යොමු කරලා, මේ සඳහා සහනයක් සලසා දීමට කටයුතු සලස්වා දෙන්නේ නම් මැනවි කියන කාරණාව ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරමින් - සෞඛ්‍ය ගරු අමාත්‍යතුමා අද මේ සභාවේ නැහැ. එතුමාගේ විශේෂ අවධානයට මේ කටයුත්ත ලක් වෙලා රටේ ජනතාවගේ සුරක්ෂිතභාවය, රැකවරණය, ආරක්ෂාව වෙනුවෙන් ලහි ලහියේ වැඩ පිළිවෙළක් සංවිධානය කරන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනය කරමින් ගරු මන්ත්‍රීතුමාට නැවතත් මගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.35]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අපේ හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා මේ අදහස එතුමාගේ ඔළුවට ආ හැටිය මා සමඟත් කථා කළා. කථා කරලා කිව්වා, මෙවැනි ප්‍රශ්නයක් රටේ තිබෙනවා. අපි මේ ගැන අවධානය යොමු කළ යුතුයි කියලා. ඇත්ත වශයෙන්ම එතුමාගේ උනන්දුව ගැන මම දැඩි ලෙස සතුටට පත් වුණා. ඒ නිසාම මම මේ ගැන කරුණු කිහිපයක් සොයා ගන්න උත්සාහ කළා. විශේෂයෙන්ම සභාව දැනුවත් කරනවා වාගේම, අපි මේ සභාව පොළඹවා ගන්න ඕනෑ, වැදගත් වැඩ සටහනක් සඳහා ඉදිරියට යන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලෝක සෞඛ්‍ය සංවිධානය කියන විධියට - මම බරවා රෝගය ගැන, නැත්නම් ෆයිලේරියා ගැන කථා කරන්නේ නැහැ. මැලේරියා ගැන විශේෂයෙන් කථා කරන කොට, මැලේරියා කියන්නේ ජීවිත තර්ජන එල්ල කරන රෝග තත්ත්වයක්. ඒ කියන්නේ මේකේ අනතුරක් තිබෙනවා. අපි පොඩි කාලයේ ඉගෙන ගත්තා ඇනෝෆිලස් මදුරුවාගේ ගැහැණු සතා තමයි මේ රෝගය ගෙන යන්නේ. ඒ වාගේම ප්ලැස්මෝඩියම් කියන පරපෝෂිතයා - අපට මතකයි, අපි පොඩි කාලයේ සෞඛ්‍ය පාඩමේදී ඉගෙන ගත්තා. ඇල්සිෆාරෝ, වයිවැක්ස් කියන පරපෝෂිතයන් දෙන්නා තමයි මේ මැලේරියා රෝගයට හේතු වෙන්නේ. මේක සුව කරන්න පුළුවන්. මේක වළක්වන්න ඊටත් වඩා පුළුවන්. ඒ නිසා අපි මේක ජයග්‍රහණය කරපු රටක්. ලෝක සෞඛ්‍ය සංවිධානයේ කලාපීය අධ්‍යක්ෂිකාව එක්තරා අවස්ථාවක කියනවා අපේ රටේ, ශ්‍රී ලංකාවේ නායකයෝ විශාල වශයෙන් උදව් කළා මෙවැනි රෝග වළක්වන්න. ඒ නිසා 2015 දී ශ්‍රී ලංකාව මැලේරියා රෝගයෙන් තොර රටක් හැටියට ප්‍රකාශයට පත් කළා. ඊට පස්සේ 2016 දී ඒ වාගේම බරවා රෝගයෙන් තොර රටක් හැටියට නම් කළා. එවැනි රෝග ගණනාවකින් තොර රටක් හැටියට නම් කරලා තිබුණු ශ්‍රී ලංකාවට දැන් මොකද වෙන්නේ කියලා අපට අහන්න වෙනවා. ලෝක සෞඛ්‍ය සංවිධානය කියන විධියට ලෝකය පුරා හැරිලා බැලුවොත් 2018 නොවැම්බර් මාසයේ, ඒ කියන්නේ ගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ පිට වුණු වාර්තාවලට අනුව ලෝකයේ රටවල් 90 ක මිලියන 219 ක් මැලේරියාවලින් රෝගී වෙලා තිබෙනවා. 2017 අවුරුද්දේදී විතරක්. 2018 වාර්තා වෙන්නේ, මේ අවුරුද්දේ අවසානයේ. මේ 2017 දී ලොව පුරා මැලේරියා මරණ හාර ලක්ෂ තිස් පන්දාහක් වාර්තා වෙනවා. ඒ නිසා මේක ටිකක් අපි හිතනවාට වැඩිය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බරපතළයි. මේ තත්ත්වය වැඩියෙන්ම බරපතළ අප්‍රිකානු කලාපයේ. මේ වාර්තා වුණු මරණවලින් සහ රෝගීන්ගෙන් 92% ක් අප්‍රිකාවේ. මරණවලින් ඒක 93% ක්. 2017 දී මැලේරියා පාලනයට ලෝක සෞඛ්‍ය සංවිධානය වැය කරලා තිබෙනවා, ඇමරිකානු ඩොලර් බිලියන 3.1 ක්. අප්‍රිකාවට වැඩි මුදලක් වැය කරලා තිබෙන්නේ. හැබැයි ප්‍රධාන රටවල් කිහිපයක් තිබෙනවා. ඒ මොනවාද? විශේෂයෙන්ම මේකෙන් අඩක් වාර්තා වෙන්නේ රටවල් පහක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකයි මට කියන්න ඕනෑකම තිබෙන්නේ. ඒ රටවල් මොනවාද? DRC අපි කවුරුත් දන්න කොංගෝව කියන එක. Democratic Republic of the Congo. ඊළඟට මොසැම්බික්. ඊළඟට උගන්ඩා. ඊළඟට නයිජීරියාව. පස්වැනි රට තමයි අපේ මේ ප්‍රශ්නයට ප්‍රස්තුත වන, අපේ අවධානය යොමු වන රට ඉන්දියාව. එහෙමනම් මේකේ බරපතළකම තේරුම් ගන්න ඕනෑ. මතක තියාගන්න. ලෝකයේ කොතැන හරි තැනක හැම මිනිත්තුවකටම අවුරුදු පහට අඩු ළමයින් දෙන්නෙක් මැලේරියාව නිසා මැරෙනවා. මේක බරපතළයි. අවුරුදු පහේ වයසේ ඉන්න දරුවන් මැලේරියාව නිසා ක්ෂණිකයෙන් මරණයට පත් වෙනවා. අවුරුදු පහට වැඩි ළමයින් වුණත්, අවුරුදු දහ තුනට විතර අඩු නම් ක්ෂණිකව මරණයට පත් නොවුණත්, මැලේරියා නිසා ජීවිත කාලයම දුක් විඳින්න වන ආබාධවලට ලක් වෙනවා. ඒ නිසා මේක ටිකක බරපතළ තත්ත්වයක්.

දැන් රෝග වාහකයා වළක්වන්න තමයි ප්‍රධාන වශයෙන් අපේ අවධානය යොමු වෙන්නේ. කවුද මේ? ඒකට කියනවා, Vector Control කියලා. මදුරුවා. දැලක් දා ගන්න පුළුවන්. මදුරුවෝ ටික මර්දනය කරගන්න පුළුවන්. අඩු වැඩි වශයෙන් ලංකාවේ පළාත් පාලන ආයතනවලින් ඒක කෙරෙනවා. අඩු වැඩි වශයෙන්. මදුරුවෝ වැඩියි කියලා ඇවිල්ලා කාන්තලව් කළාම තෙල් ටිකක් ගහනවා. සමහරු ඒකටත් අත යට ගාණක් ඉල්ලනවා. එහෙම හරි වැඩේ ඇද ඇද යනවා. හැබැයි, ඊට වඩා බරපතළ කාරණය ඒක නොවෙයි. විශාල ලෙස ඉන්දියාවේ පැතිරිලා තිබෙනවා. ඉන්දියාවේ තමිල්නාඩුවේ අන්ද්‍රා ප්‍රදේශයේ, බටහිර බෙංගාලයේ ඔරිසා ප්‍රාන්තයේ විශාල වශයෙන් මේ මැලේරියා රෝගය පැතිර යනවා. ඒ කියන්නේ මේගොල්ලෝ ලංකාවට එනවා. මම ජීවත්වන

කොළොන්නාවේ, මීතොටමුල්ලේ රේල් ගේට්ටුව ළඟ සවස 5.00 සිට 6.30 වනතුරු හිටගෙන සිටියොත්, පෙරහැරක් වාගේ 500 ක් විතර එනවා. සමහරුන්ගේ අතේ උණුවතුර බෝතලයක් තිබෙනවා. සමහරුන්ගේ අතේ කෑම පෙට්ටියක් තිබෙනවා. ඇත්තටම මම දන්නේ නැහැ. ඒ ළඟ තැනක ඉන්න මස් කඩේ මුදලාලිගෙන් මම දවසක් ඇහුවා. "මුදලාලි කවුද මේ කට්ටිය. පෝළිමේ යන්නේ? ඇයි මහත්තයෝ ඉන්දියාවෙන් ආපු අය නේ කිව්වා." හරියට ආක්‍රමණිකයෝ වාගේ. එතැන අඩුම ගණනේ 200 ක් විතර ඉන්නවා කියලා ඒ මුදලාලි මට කිව්වා. මීතොටමුල්ලේ 200 ක් ඉන්නවා නම්, කොයිතරම් සේවකයන් ප්‍රමාණයක් ලංකාවේ ඇත්ද? විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල, ජා-ඇළ ඒ තීරුවේ යකඩ කර්මාන්තශාලාවල වැඩ කරන විශාල සේවකයන් ප්‍රමාණයක්. මම දැක්කා, ඊයේ ප්‍රවෘත්තියක් තිබෙනවා. මෙහේ නොවෙයි. උතුරුමැද පළාත දිහා මැලේරියා බෙහෙත් බෙදනවා කියලා. එතකොට මම මාධ්‍යවේදියෙක්ගෙන් කථා කරලා ඇහුවා. ඇයි? මේ කියලා. එතකොට කිව්වා. ඉන්දියානුවන් විශාල වශයෙන් ඉන්නවා. ඒ නිසා දැන් මැලේරියා බෙහෙත් බෙදනවා කියලා. අපි දැනගෙන සිටියේ නැහැ නේද? මේක ටිකක් බරපතළයි. ඒ නිසා අපට ආවේක්ෂණය, පරීක්ෂණය, සොයා බැලීම, මුරකාවල් දැමීම මේ අවස්ථාවේදී කළ යුතුයි. මේක ඉතාම වැදගත්. ඒක කරන්න පුළුවන් කාටද? අංශ දෙකක් ඉන්නවා. එකක්, මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය බලධාරීන්. දෙවැනි එක, පළාත් සෞඛ්‍ය බලධාරීන්. ඇයි? මේ වැඩේ ඉතාමත් බරපතළ වෙලා තිබෙනවා, විශේෂයෙන් කොළඹ දිස්ත්‍රික්කය තුළයි, ගම්පහ දිස්ත්‍රික්කය තුළයි. අපි දන්නේ නැහැ, කොළඹ විශාල වශයෙන් ඉන්නවා. රත්තරං බඩු කර්මාන්තයේ යෙදෙන්නේ ඔක්කොම ඉන්දියන් ජාතිකයන්. ඉන්දියානුවෝ ලංකාවේ ඉන්නේ. ගොඩනැගිලි ඉදි කිරීම් ක්ෂේත්‍රයේ දහස් ගණනක් කොළඹ ඉන්නවා. චීන ජාතිකයන් අතර මේ රෝගය එතරම් නැහැයි කියලා තමයි ආරංචි වෙන්නේ. නමුත් ඉන්දියාව, පාකිස්තානය, බංගලාදේශය වාගේ රටවල විශාල පිරිසක් කොළඹ ඉන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා සෞඛ්‍ය බලධාරීන්ට - අනේ මම දන්නේ නැහැ. ඇමතිතුමා නම් නැහැ. ඇමතිවරු දකින්නත් ආසයි. අඩුම ගණනේ මේ පිළිබඳව අවධානය යොමු කරලා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මගින් ගරු සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මම හිතන්නේ සෞඛ්‍ය ලේකම්තුමාත් ඉන්නවා. මේ පිළිබඳව දත්ත වෙන කාගෙන්වත් නොවෙයි අපි ගන්නේ. ඔබතුමන්ලාගේ වෛද්‍යවරු මේක දන්නවා. ඔබතුමන්ලාට තමයි අහු වුණේ. දැන් අපි දන්නවා. ගම්පහ 615 දෙනෙක් පරීක්ෂා කරන කොට ඉන් 21 කට බරවා තිබෙනවා. හැබැයි කොළඹ අපි දේශීයව කරපු මැලේරියා සම්පාල් 8000 කින් එක්කෙනෙකුටවත් මැලේරියා තිබුණේ නැහැ. මේ මෑතකදී කරපු එකක්. හැබැයි මේක ඉන්දියානුවන් අතරේ බරපතළයි. ඉන්දියානුවන්ගෙන් 30% කට මැලේරියා තිබෙන බව හඳුනාගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, එහෙම නේද? ඒකයි මේ කියන්නේ. ඒකයි මේකේ බරපතළකම. මේකේ ගැඹුර ඒකයි. ඒ නිසා මේ ගැන දැඩි අවධානය යොමු කරන්න.

ඒ වාගේම මතක තියාගන්න. මැලේරියා බෝවන ඒ රටවල් පහෙන් අවධානම වැඩිම රට ලෙස ඉන්දියාව ඉන්නවා. High-risk Countries. අවධානම වැඩිම රටවල් අතර. ලෝක සෞඛ්‍ය සංවිධානය කියනවා අවධානම වැඩි වුණාට, අවධානය අඩුම රටත් ඉන්දියාව කියලා. එතකොට හිතාගන්න පුළුවන් නේ. අවධානම වැඩියි. අවධානය අඩුයි. එහෙමයි ලෝක සෞඛ්‍ය සංවිධානය ඉන්දියාව ගැන කියන්නේ. ඒකට හේතු ඉන්දියාවෙත් තිබෙනවා. හැබැයි ඉතින් ඒක මෙහෙට ගෙනැල්ලා අතහැරලා හරි යන්නේ නැහැ නේ. ඒ නිසා මම අද කියන්නේ, සෞඛ්‍ය ඇමතිවරයාත්, මහ ඇමතිතුමාත් කථා කරලා වහාම මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමතිතුමාට කථා කරලා, ආගමන විගමන නිලධාරීන්ට කථා කරලා මේ අය වහාම Screen කරන්න. මම දන්නේ නැහැ, ඒකට මොකක්ද කියන්නේ කියලා. තිරගත කරනවාද? තිරගත කිරීම් කරලා, Screening කරලා මේ අයව හඳුනාගෙන, එන අයව අඩුම ගණනේ ගුවන්තොටුපලේදී හරි පරීක්ෂා කරලා මේකට හැකි ඉක්මණින් දත්ත එක් රැස් කරලා ගත හැකි පියවර ගන්නය කියලා මේ සභාවෙන් ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.48]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට කථා කරන්න ලැබීම සතුටක්. විශේෂයෙන් අපේ ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ශ්‍රී ලංකාව කියන කොට ඉතාමත් සුන්දර

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

රටක්. ඒ රටේ දිය ඇළි, ඒ වාගේම පරිසරය ඒ සුන්දර භාවය තිබෙනවා. එතකොට ශ්‍රී ලංකාව කියන කොට රටේ තිබෙන අපේ නිරෝගීකම සහ ඒවා දිහා බලන කොටත් අපි ඉදිරියෙන් ඉන්න රටක්. නමුත් අපි හිතන්න ඕනෑ. එහෙම රටේ ගිය වසරේ 23 දෙනෙකු මැරුණේ කුණු කන්දකට යට වෙලා. එහෙම නම්, එවැනි රටක් තිබෙන සුන්දරභාවය පිළිබඳව අපට ගැටළුවක් තිබෙනවා. ඒ වාගේම රටේ ස්වභාවික පරිසරය පිළිබඳව අද අපට විශාල වශයෙන් ගැටළු ඇති වෙලා තිබෙනවා. එතකොට යමක් රට තුළ නිර්මාණය වෙන්න, පරිසර හා විවිධ කාරණා අපට තිබෙනවා. ඉතින් මේ කාරණා දිහා බලන කොට පරිසරයේ සමතුලිතභාවය ආරක්ෂා වෙලා තිබෙනවාද? මදුරුවෝ පාලනය කරන්න අපි අහලා තිබෙන විධියට ගොළුබෙල්ලා කියන සතාගෙන් සිද්ධ වෙනවා. ගොළුබෙල්ලා පාලනය වීම ඇටි කුකුලාගෙන් සිද්ධ වෙනවා. මේ වාගේ පරිසරයේ සමතුලිතභාවය තුළින් තමයි ගොඩක් දේවල් ක්‍රියාත්මක වෙන්නේ. නමුත් අද මේ සමාජ ක්‍රමය තුළ මේ පරිසර සමතුලිතතාවය බිඳ වැටීම නිසා විවිධ වූ පාරිසරික ගැටළුවලට අපට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ හැම දෙයක් දිහාම බලන කොට එක අතකට කනගාටුවක් තිබෙනවා. මේ රට යම්කිසි ආවේණික ක්‍රමයකට අපේ රට ගමන් කළා. මේ රටට විවෘත ආර්ථික ක්‍රමයක් හඳුන්වා දුන්නා. එපා දේයි, හොඳ දේයි සියල්ල මේ රටට ගලා එන ක්‍රමයක් රට තුළ නිර්මාණය වුණා. ඒ නිර්මාණය වීම හරහාම අපේ ජනතාව සහ ලෝකය අතර තිබෙන සබඳතා වැඩි වෙන කොට විවිධ නොගැළපෙන දේ මේ රට තුළට ගමන් කළා. ඒ ගමන් කිරීම හරහා අපේ රටක මූලික මිනිසුන්ගේ කාරණාවක් තමයි සෞඛ්‍ය. මේ සෞඛ්‍ය මොන විධියට මේ රට තුළට හානිකාර වුණාද? ඒ නිසා මේ මැලේරියා කියන රෝගය මම කියන්නේ නැහැ විවෘත ආර්ථිකය තුළ ඇති වුණාය කියලා.

නමුත් මේ මැලේරියා කියන රෝගය ගම් මට්ටමින් මිනිස්සු හැඳින්වූයේ කැලෑ උණ කියලා. අදටත් ගමේ වැඩිහිටි කෙනෙකුට හදිසියේ උණ ගත්තොත්, ඔහුට සීතල ආවොත්, ඔහු නිකම් වෙව්ලන්න ගත්තොත් ඔහු කියනවා, මැලේරියාව හැදුනු කාලය වාගේ කියලා. මැලේරියා උණ හැදෙන්න වාගේ කියලා. ඒ තරම් උණෙන් ඒ පීඩා වුණු මිනිස්සු හිටියා. නමුත් මොනවා හරි ක්‍රමයකට අපේ වැඩිහිටියෝ කියනවා, මැලතියන් පාවිච්චි කළාය, ඒවාට බෙහෙත් ගහලා හරි මොන විධියෙන් හරි මේ මැලේරියා කියන රෝගය පාලනය කළා. හැබැයි, පුංචි කාලේ අර සෞඛ්‍ය පාඩමට වාගේ ඇතුළත් කළා. මැලේරියා රෝගයම ඇනෝෆිලස් මදුරුවා කියන්නේ මොනවාගේ සතෙක්ද? ඌව හඳුනාගන්නේ කොහොමද? උගෙන් වන හානිය පිළිබඳව අපට පුංචි දැනුමක් පුංචි කාලේ ඉඳන්ම තිබුණා. මදුරුවෙකුට නමක් කියලා අපි නම් කළා නම් ඒ මැලේරියා රෝගයට සම්බන්ධ මදුරුවා. නමුත් අද වන කොට නැවත මේ රෝගය උත්සන්න වෙලා තිබෙනවා. මේ රෝගය විතරක් නොවෙයි. ලාදුරු රෝගය මේ සමාජයෙන් තුරන් කරන ලද රෝගයක්. අපේ ප්‍රදේශයේ ලාදුරු රෝගීනුත් ඉන්නවා. එහෙම නම් මේ රෝග වෛරස් වෙන්න පුළුවන්, විවිධ මාධ්‍ය හරහා ගොඩ නැගෙන මේ රෝග රට තුළ ඇති වෙලා තිබෙනවා. බරවා රෝගය ඒ අතර තිබෙනවා. මැලේරියාව, එහෙම නැත්නම් ඩෙංගු රෝගය අද බහුලව ඇති වෙලා තිබෙනවා. මේ සියල්ල කරන්න අපි පුද්ගලයෝ වශයෙන් දැනුවත් වෙලා ඉන්නට ඕනෑ. පුද්ගලයාට හැඟීමක් තිබෙන්නට ඕනෑ. පරිසරයේ සමතුලිතතාවය රකින්න, ඒ වාගේම තමන්ගේ ගෙවත්ත, වට පිටාව සුද්ද පවිත්‍ර කරන්න තමන් ඒ රෝගය හරහා ඇති වෙන්නා වූ අයුතු ප්‍රතිවිපාක අපි අවබෝධ කර ගන්නට ඕනෑ. පුද්ගලයා මේ කාරණාවට යොමු නොවෙන තාක් මේවා පාලනය කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා ජනතාව දැනුවත් කරන්නට ඕනෑ. ඒ ජනතාව දැනුවත් කිරීම හරහා මේවා පාලනය කිරීමට පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

නමුත් මම මේ කියන්න යන කාරණාව. මේ මන්ත්‍රීතුමන්ලා පුන පුනා කියනවා, ඉන්දියාවේ බහුල මිනිස්සු මේ ප්‍රදේශයට ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා තමයි දේශපාලන වශයෙන් හා රටක් වශයෙන් විරුද්ධ වුණේ. යම් යම් ගිවිසුම් ගහලා ශ්‍රමිකයන් මේ රටට ගෙන්වන්න විරෝධතාවය දැක්වූවා. රටක් වශයෙන්, දේශපාලන අධිකාරිය වශයෙන් මේ ගිවිසුම්වලට යන්න එපා. ශ්‍රමිකයෝ ගෙන්වන්න එපා. අපේ රටට ආවේනික නොවන දේවල්. මේ මැලේරියාව, ඩෙංගු විතරක් නොවෙයි. බරවා විතරක් නොවෙයි. මීට වඩා විවිධ තත්ත්වයන් ඇවිල්ලා, අපේ රටේ ඉන්දීය සම්භවයක් තිබෙන සිංහල මිනිස්සුන් පවා බෝ වෙන තත්ත්වයක් ඇති වෙනවා. මේකට ගේන්න එපාය කියලා. ඒක එන්න පෙර තමයි ඇම්බියුලන්ස් රථය ගමේ පොලීසියට එව්වේ. අන්න, ඇම්බියුලන්ස් රථය නවත්වලා තිබෙනවා, ගමේ පොලීසියේ. ඩෙංගු හැදිලා වෙව්ලන කොට 119 ට කථා කළාම රෝගියා අරගෙන

0073

යන්න පරිසරය, සංස්කෘතිය නිර්මාණය කරලා තමයි මේ මැලේරියා වාගේ රෝග අපේ රටේ බහුලව ප්‍රචලිත කරන තත්ත්වය ඇති වුණේ. ඒ නිසා දුර දිග බලලා අපි තීන්දු ගත්තා නම්, සමහර විට ශ්‍රමිකයෝ හරහා ඇති වන, මේ ඉන්දියාව වාගේ රටක තිබෙන මේ බෝ වන රෝග තත්ත්වයන් අපට පාලනය කරන්න පුළුවන් ක්‍රම මොනවාද? ඒ හරහා අපට බාධකයන් යොදලා තිබෙනවාද? රට තුළට එන අය පරීක්ෂා කරන්න, ඒ අය ගැන පූර්ව වශයෙන් නිගමන ගන්න, පුද්ගලයා පිළිබඳ දත්ත එක්රැස් කරලා, ඔහුට පරම්පරාගතව යම් යම් රෝගී තත්ත්වයන් මොනවාද? ඔහුගේ වට පිටාව, එහෙම නැත්නම් පුද්ගලයා පිළිබඳ යම්කිසි තොරතුරු දත්ත පද්ධතියක් තිබෙනවාද? මේවා එකක්වත් අපි ළඟ නැහැ. ඒ නිසා ඕනෑ කුණු ගොඩක් භාර ගන්න ගිහිල්ලා අද අපේ ජන සමාජය සෞඛ්‍ය පැත්තෙන් විනාශ වෙමින් යනවා. ඒ වාගේම තමයි ජාතියක් වශයෙන් අද අපේ මළගම ඇති වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරන්නේ, මේ තත්ත්වයන් තුළ ජනතාව දැනුවත් කරන්නට ඕනෑ. ඒ වාගේම තමයි මේ තත්ත්වයන් තුළ කටයුතු කරන කොට, මේ රටේ තිබෙන නිදහස් සෞඛ්‍ය සේවය හරියට අර්ථවත් වෙලා තිබෙනවාද? නිදහස් අධ්‍යාපනය කියලා කියන කොට පාසලක ගොඩනැගිලි ටිකක් තිබෙනවා. අනෙක් සියලු දේවල් ළමයා ගන්නට ඕනෑ. මිල මුදල් යොදවන්නට ඕනෑ. පාසලට ඇතුළත් වෙන්න සල්ලි දෙන්නට ඕනෑ.

ඒ වාගේම පන්තියේ ක්‍රීඩා කරන්න සල්ලි ගෙවන්න ඕනෑ. අමතර පංතිවලට සල්ලි දෙන්න ඕනෑ. ටියුෂන් යන්න ඕනෑ. හැබැයි, විභාගය සමත් වුණාම නිදහස් අධ්‍යාපනයෙන් තමයි ළමයා ඉගෙන ගත්තේ කියලා කියනවා. නමුත්, නිදහස් අධ්‍යාපනය අද බින්දුවට වැටිලා තිබෙනවා. සෞඛ්‍යත් එහෙම තමයි. සෞඛ්‍ය තිබෙන්නේ රෝහලේ ගොඩනැගිලි ටික විතරයි. මුත්‍රා සාම්පලය පරීක්ෂා කර ගන්න තිබෙනවා. ලේ සාම්පලය පරීක්ෂා කර ගන්න වෙලා තිබෙනවා. වෛද්‍යවරයා චැනල් කරන්න වෙලා තිබෙනවා. බෙහෙත් ටික සල්ලිවලට ගන්න වෙලා තිබෙනවා. ඔය කියන බෙහෙත් සියල්ල, ප්‍රමිතියෙන් බාල බෙහෙත් ගෙනැල්ලා තිබෙන්නේ. කල් ඉකුත් වුණු බෙහෙත් ටික රෝහල්වලට ඇවිල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේවා නුසුදුසු ඖෂධ වර්ග වශයෙන් මේ රටේ වෛද්‍ය සංගම් ප්‍රතික්ෂේප කරන කොට මෙන්න රටේ නිදහස් සෞඛ්‍යයට වෙලා තිබෙන දේ. මේ නිදහස් සෞඛ්‍ය නැති වෙලා යන කොට අහිංසක මිනිහා කා ළඟට ද යන්නේ. මගේ පෞද්ගලික අත්දැකීමක්. මට

0074

පෞද්ගලිකව කරදරයක් සිද්ධ වුණා. මම හදිසියේ වෛද්‍යවරයෙක් චැනල් කරලා රෝහලට ගියාම ප්‍රධාන වෛද්‍යවරයා කියනවා මේ කාරණාව මට ඉටු කරන්න පුළුවන්. හැබැයි, මම මේ කාරණාව ඉටු කරන කොට බලනවා විතරයි. මගේ ගෝලයෝයි මේ වැඩේ කරන්නේ. මම සහතිකයක් දෙන්නේ නැහැ. මේ කරන ඔපරේෂන් එකෙන් මේ රෝගියාට සුව වෙයි කියලා. හැබැයි, ඔබතුමන්ලාට පුළුවන් නම්, මගේ ප්‍රයිවට් රෝහලට ගේන්න. මම සහතිකයක් දෙනවා. මේ කෙනාට මේ ඔපරේෂන් එක හරහා 100% ක සුව වීමක් ලබා දෙනවාය කියලා. අපි මොකක්ද ගන්න තීන්දුව? එතකොට තමන්ගේ රෝගියා අරගෙන යනවා රෝහලට. ඒක කරන්න බැහැයි කියලා කියනවා. විශ්වාසය නැහැයි කියනවා. තමන්ගේ පෞද්ගලික රෝහලට ගේන්න කියනවා. මම ඒකට සහතිකය දෙනවා කියලා කිව්වාම ඕනෑම පුද්ගලයෙකු ගන්න තීන්දුව මොකක්ද? ප්‍රයිවට් රෝහලට හරි යන්න ඕනෑ. දුප්පත් මිනිහා කා ළඟට ද යන්නේ? තුන් වේල කන්න බැරි මිනිස්සු, එදා වේල කාලා ජීවත් වෙන්න බැරි මිනිස්සු, ඒ වාගේම දරුවා පාසල් යවා ගන්න බැරි මනුස්සයාට ලේ සාම්පල් බලන්න පුළුවන්කමක් තිබෙනවාද? රෝහලෙන් මේක බලලා දෙනවාද? රෝහල්වලට ගියාම කියනවා, අහවල් තැනින් බලන්න. ආසිරි එකෙන් බලන්න. වෙන තැනකින් බලාගෙන එන්න. මේවා කොළඹට අරගෙන එන්නට ඕනෑ. එතකොට මුත්‍රා සාම්පලය බලන්න ඕනෑ. ඉතින් මේවා බලන්න මිනිස්සුන්ට මිල මුදල් තිබෙනවාද? මිනිස්සුන්ගේ දුප්පත්කම රටේ සෞඛ්‍යය පිරිහෙන්න හේතුවක් වෙලා තිබෙනවා. මේ දුප්පත්කම දඩ මීමා කර ගන්නවා. ඒ අහිංසක මිනිස්සුන් රෝහලට ගියාට, තමන්ට අවශ්‍ය ප්‍රතිකාර ටික ලැබෙන්නේ නැහැ. මිනිස්සුන්ට මැරෙනවාට ඇරෙන්න සම්පතක් මේ රටේ ඉතිරි වෙලා නැහැ. ඒ නිසා මේ සෞඛ්‍ය සේවය ගොඩ නගන්න ඕනෑ. දුප්පත් මිනිස්සුන්ගේ ලේ ටික බලන්න, ඒ තිබෙන පරීක්ෂණවලට යොමු වෙන්න. බෙත් හේත් ටික ගන්න. ඒ වාගේම ප්‍රමිතියෙන් යුතු ඖෂධ ටික මිනිස්සුන්ට ලැබෙන විධියට කටයුතු කරන්නට ඕනෑ.

ඒ වාගේම මම විශ්වාස කරන දේ තමයි මේ සමාජයේ විවිධ වූ එක එක පුද්ගල තලයන් තිබෙනවා. රාජ්‍ය නිලධාරීන් ඉන්නවා. ප්‍රධානීන්. දේශපාලන අධිකාරිය. රටට නායකයෝ ඉන්නවා. එකිනෙකට පැවරුණු කාර්යයන් තිබෙනවා. එතකොට සෞඛ්‍ය අංශයට මොනවාද පැවරිලා තිබෙන්නේ. සෞඛ්‍ය අංශයට මේ රටේ

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ]

රෝග පාලනය කරන්නට ඕනෑ. ඒ වාගේම රටේ නීරෝගී මිනිස්සු බිහි කරන්නට ඕනෑ. දැනුවත් කරන්නට ඕනෑ. ඒ වාගේ කරුණු කාරණා තිබෙනවා. එහෙම නම් මේ රටේ ඒ නිසි බලධාරීන් මොනවාද කරන්නේ? අද බලන්න. MOH කාර්යාලයට ගිහිල්ලා සෞඛ්‍ය අංශයට සම්බන්ධ වෙලා කටයුතු කරන නිලධාරීන් මොකක්ද කරන්නේ? මේ ප්‍රදේශයේ ආහාර පිළිබඳව තමන්ගේ වගකීම ඉටු කරනවාද? හෝටල් ටික පරීක්ෂා කරනවාද? එහෙම නැත්නම් පරිසර සෞඛ්‍ය රකිනවාද? මිනිස්සුන්ගේ බෝ වන රෝග පිළිබඳව සෞඛ්‍ය රකිනවාද? නැහැ. ඔවුන් ඉන්නේ තමන්ගේ අතට කොයි වෙලේද building plan එකක් එන්නේ? මේ building plan එක උස්සගෙන ගිහිල්ලා ඒකට අනුමැතියක් අරගෙන දෙන්න. කවුද building plan එකක් අඳින්න අරගෙන එන්නේ. කොහේද ඉඩම් කට්ටියක් තිබෙන්නේ. මේක සොයා ගෙන යනවා. තමන්ගේ බඩගෝස්තරය සොයා ගන්න කටයුතු කරනවා මිසක්, ප්‍රදේශයේ ජනතාවගේ බෝ වන රෝග සම්බන්ධයෙන් මොන සෞඛ්‍ය නිලධාරියාද කථා කරන්නේ? ඔවුන්ට තිබෙන වගකීම ඔවුන් ඉටු කරනවාද? ඔවුන් බලාගෙන ඉන්නේ තමන්ට කීයක් හරි එනවාද? ව්‍යාපාරිකයෙක් එනවාද, ඒ සහතිකය නිකුත් කරන්න. එහෙම නැත්නම් building plan එකක් එනවාද? අඩුපාඩුවක් කියලා අත මිට මොළවා ගන්න. එහෙම නැත්නම් building plan එක අඳින්න ලබා දෙනවා නම් අනුමත කරලා දෙන්න මුළු ගණනටම ගාණ කියන්න ඔවුන් බලාගෙන ඉන්වා මිසක්, තමන්ගෙන් සමාජයට විය යුතු වගකීම ඉටු වෙලා නැහැ. ඒ නිසා මිනිස්සු තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන්න ඕනෑ. තමන්ට පැවරුණු කාරණා තිබෙනවා.

ඒ නිසා සෞඛ්‍ය කියන්නේ, මේ රටේ ප්‍රමුඛ කාරණාවක්. ඒ රටේ මිනිස්සුන්ගේ ජීවන කාලය, මිනිස්සුන්ගේ උපතේදී අපේක්ෂිත ආයු කාලය වැඩි වෙනවා නම්, මිනිස්සුන්ගේ මරණ සංඛ්‍යාව අඩු වෙනවා නම්, මේවා තමයි රටක සංවර්ධනයේ යම් යම් නිර්ණායක වෙලා තිබෙන්නේ. මේ රට යම් තැනකට ඇවිල්ලා තිබුණා. අද සියල්ල බිඳ වැටෙමින් පවතිනවා. ඒ නිසා මේ සෞඛ්‍ය කියලා මැලේරියාවට, එහෙම නැත්නම් මේ රෝහලට බෙත් හේත් ගේනවා වාගේම පරිසයේ තිබෙන කාණු පද්ධතිය සුද්ද වෙන්න ඕනෑ. නගරය අලංකාර වෙන්නට ඕනෑ. ඒ මදුරුවෝ බෝ වන තැන් ටික විනාශ කරලා ඒවා සුන්දර නගර බවට පත් කරන්නට ඕනෑ. මේවා පිළිබඳව අපට එහෙම හැඟීමක් තිබෙනවාද? ඒ වාගේම තමයි අපට විශ්වාසයක් තිබෙනවාද? ගමේ වැඩිහිටියෝ කියනවා, අනේ මහත්තයා අපට පෙනඩෝල් පෙත්තක්වත් දෙන්න ඕනෑ නැහැ. මම හොඳ ශක්තිමත් මනුස්සයෙක්. එහෙම විශ්වාසයක් අපේ රටේ මිනිස්සුන්ට තිබුණා. ස්වභාවික ප්‍රතිශක්තිකරණයක් තිබුණා විශ්වාසයක්. අම්මාගේ කිරි ටිකක් බීපු මිනිස්සුන්ට තිබුණා, අම්මාගේ කිරි බීපු මට කවදාවත් ලෙඩක් හැදෙන්නේ නැහැ. මට ඒ ප්‍රතිශක්තිකරණය අම්මාගෙන් ලැබුණා. අද එහෙම කියන්න පුළුවන්ද? අපි ගන්නා ආහාර පිළිබඳව අපට එහෙම ස්වභාවික ප්‍රතිශක්තිකරණයක් තියෙනවා කියලා කියන්න පුළුවන්ද? වස විෂ පිරුණු ආහාර රට පුරා බහුල වෙලා තිබෙන කොට, අපේ තිබෙන ඒ ප්‍රතිශක්තිකරණය පහළ වැටිලා තිබෙන කොට අපට පුළුවන්ද මේ සමාජයේ තිබෙන මේ බෝ වන රෝග වෙන්න පුළුවන්. බෝ නොවන රෝග වෙන්න පුළුවන්. මේවායෙන් මිදෙන්න පුළුවන්කමක් අද සිද්ධ වෙලා නැහැ. ඒ නිසා දූප්පත්කමක් අපේ සමාජයේ තිබෙන ප්‍රතිපත්ති හා ඒවායේ සකස් කිරීම්වල තිබෙන ගැටළු නිසාත් විවිධ ගිවිසුම් හා ඇති වෙන්නා වූ නොගැලපෙන ශ්‍රමයන් ලබා ගන්න ගියාම තමයි මෙවන් තත්ත්වයන් නිර්මාණය වෙලා තිබෙන්නේ.

ඒ නිසා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක්. බරවා මේ ලෝකයෙන් දූරස්ථ වෙන්නට ඕනෑ. ලාදුරු මේ ලෝකයෙන් දූරස් වෙන්නට ඕනෑ. මැලේරියාව, ඩෙංගු වාගේ මේ රෝගයන් දූරස්ථ වෙන්නට ඕනෑ. මරණය කාටද කියන එක නොවෙයි. මරණය අපි කාටත් සිද්ධ වෙන්න පුළුවන්. මේ සියල්ල තුළින් ජන සමාජයේ මොන තරම් ඛේදජනක තත්ත්වයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවාද? ඒ නිසා මේ අයාලයේ මිනිස්සු මැරිලා යන එක, වසංගත ඇති වෙලා මිනිස්සු මැරෙන එක වළක්වන්න නම් සෞඛ්‍ය නිවැරදි තැනට කටයුතු කරන්නට ඕනෑ. ඒ සඳහා දේශපාලන අධිකාරිය වශයෙන් අපට තිබෙන වගකීම, ඒ සෞඛ්‍ය බලධාරීන් වශයෙන් තිබෙන වගකීම, මහජනතාව වශයෙන් තිබෙන වගකීම මනාව තේරුම් ගෙන අපේ කොටස අපි නිසියාකාරයෙන් ඉටු කළොත් මේ රට සෞඛ්‍ය සම්පන්න රටක් කර ගන්න පුළුවන්කම ලැබෙයි කියන විශ්වාසයෙන් අද මේ අවස්ථාවට කථා කරන්න ලැබීමට ස්තූතිය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ වෙනවා ඇත.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, සිරිකමල් පිලීෂියන් ද සිල්වා ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.***
*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Sirikamal Filician de Silva M.P.C took the Chair*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.03]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා විසින් කාලීන වශයෙන් වැදගත් යෝජනාවක් අද ඉදිරිපත් කරලා තිබෙනවා. මේ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම ස්තූතිවන්ත වෙනවා. පළමුවෙන්ම මේ ලැබුවා වූ 2019 වර්ෂය රටේ දේශපාලන දිසානතිය, රටේ දේශපාලන අනාගතය තීරණය කෙරෙන ඉතාම තීරණාත්මක වසරක්. මේ වසර පටන් ගැනීමේදී අපි සියලු දෙනාම එකිනෙකාට සුභපතා ගන්නවා. අපට සුභ පැතුම් පත් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා තිබුණා. අපේ මන්ත්‍රීතුමන්ලාගෙන්. අමාත්‍යවරුන්ගෙන්. ඒ වාගේම අපේ ගරු සභාපතිතුමා. මේ හැම කෙනෙකුගේම සුභපැතුම් පණිවුඩවල තිබෙන්නේ, රට පිළිබඳව, ජාතිය පිළිබඳව, ඒ වාගේම ජනතාවගේ බලාපොරොත්තු පිළිබඳව ඉතාම අනගි වැකි තමයි සටහන් කරලා තිබෙන්නේ. දැන් අපි හැම අවුරුද්දකම මේක පුරුද්දක් වාගේ කරනවා. අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් ඉතාම ලස්සන කැලැන්ඩරයක් එවලා තිබුණා. එතුමා ලස්සනට හිනා වෙවී ඉන්නවා. එතුමාගේ දේශපාලන නායකයන් සමඟ එතුමාවත් ඇතුළත් කරලා. මේ සුභ පැතුම්පත් අපට හැම වසරකම එවනවා. හැබැයි, රට සුභ වෙන්නේ නැහැ. අපි සුභ කර ගන්න උත්සාහ කරන්න ඕනෑ. ඉතින් ඒකට යම්කිසි දැක්මක් තිබෙන්න ඕනෑ. දර්ශනයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම අපි ඒ සඳහා කැපවීමෙන් කටයුතු කරන්න ඕනෑ. එහෙම කළොත් විතරයි මේ රට යහපත් තැනකට අපට ගේන්න පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් අපට හැම්දාම අපේ හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව වාගේ වසංගත ගැන තමයි කථා කරන්න වෙන්නේ. මම හිතන්නේ, අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා යම්කිසි ආසාදනයකට මුහුණ දීලා ඉන්නවා. උගුරේ ආසාදනයකට. මේ දිනවල පැතිරිලා යනවා මේ වෛරස් රෝගයක්. මම හිතන්නේ, මේකට හැම කෙනෙකුම වාගේ පසුගිය සති දෙක තුන තුළ ගොදුරු වුණා. දැන් මේ දේශපාලන වෛරසය එක පැත්තකින් තිබෙනවා. ඒ වාගේම අපේ සෞඛ්‍යයට බලපාන වෙනත් ආකාරයේ වෛරස් රෝග පැතිරිලා යනවා. ඉතින් මේ සියල්ල මැද අපි රට පිළිබඳව බලාපොරොත්තු තියාගෙන කටයුතු කරන්නේ. අද විශේෂ දිනයක්. ජනවාරි 08. අපි 2015 ජනවාරි 08 වැනිදා කරපු, මේ රටේ හැට දෙලක්ෂයක් ජනතාව එකතු වෙලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කරපු මෝඩකම.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඒ කරපු ප්‍රජාතන්ත්‍රවාදී වෙනසට අද අවුරුදු හතරක් සම්පූර්ණ වෙලා තිබෙනවා. සමහරු කියනවා ඒක මෝඩකමක් කියලා. අපි නම් මෝඩකමක් කියලා හිතන්නේ නැහැ. ඒ කළ යුතුව තිබෙන වෙනස අපි කළා. ඒ තුළින් මේ රටට ලබා ගන්න පුළුවන් වුණු ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් තිබෙනවා. දැන් -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අදාළ යෝජනාවට කථා කරන්න කෝ?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

යෝජනාව ගැන මතක් කරලා දෙන එක බොහොම හොඳයි මන්ත්‍රීතුමා. මම මේ යෝජනාව ගැන නොදැන තමයි කථා කරන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඔගොල්ලෝ තමයි -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අපේ උගත් ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි. පොඩ්ඩක් විනයක් ඇතිව ඉන්න කියලා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

යෝජනාවට අදාළව කථා කළා නම් ඉවරයි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඊළඟට කථා කරන්න තිබෙන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඔබතුමා කථා කරන්න කෝ යෝජනාවට. මම මේ යෝජනාවට අදාළව තමයි කථා කරන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

යෝජනාව -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මගේ වෙලාවත් දෙන්නද? මම නතර කරන්නද?

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

කථා කරන -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මම දන්නවා ඕගොල්ලන්ට එහෙම තමයි කියලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, වාදයක පැටලෙන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඉතාමත් හොඳයි කියලා දැකලා තිබෙනවා මේ රටේ ජනතාව.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපට තාම මතකයි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ඕගොල්ලොන්ගේ කථා ඉතාම හොඳයි කියලා මේ රටේ ජනතාව දැක්කා පසුගිය කාලයේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දන්නවා ඔයා කළුතර දිස්ත්‍රික්කට ඇවිල්ලා කරපුවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරියට රිදෙනවා, මේ කට්ටියට කථා කරන කොට.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඔයගොල්ලෝ නේ ගෙවල්වලට CD එව්වේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් මොකක්ද CD එකයි මේකයි අතර තිබෙන ප්‍රශ්නය මොකක්ද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා මේ යෝජනාවට අදාළව කථා කරන්න. වාදයක පැටලෙන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ කාලේ ඔබතුමන්ලා එතුමන්ලාව ආරක්ෂා කළා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

අපි ආරක්ෂා කළේ නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැත්තේ මොකද? ඔබතුමන්ලා ඔක්කොමලා පෙනී සිටියා ඒ කාලේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඒකනේ ගෙදර ඇරියේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

හරි නේ? දැන් ගෙදර යවලා නේ? දැන් සතුටුයි නේ? හරිද දැන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබට සතුටුයිද දැන්.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

දැන් ඔක්කොගේම දේශපාලන සොහොන් ලකුණු මතු වෙලා තිබෙන්නේ. ඒකයි ඔය කෑ ගහන්නේ. බරවා රෝගය සහ මැලේරියා තුරන් කර ඇති රටක් අපි. ඒක ඇත්ත. හැබැයි, ඉතින් කාලයෙන් කාලයට මේවා නැවත මතු වෙනවා. පසුගිය සියවසේ මුල භාගයේදී මැලේරියා රෝගය විශාල වසංගතයක් බවට පත් වෙලා තිබුණා. ඒකට ඇත්ත වශයෙන්ම ලංකාවේ වාමාංශික ව්‍යාපාරය, ප්‍රගතිශීලී ව්‍යාපාර, ඒ වාගේම වෛද්‍යවරු විශාල කැප කිරීමක් කරලා 1930 ගණන්වල මේ රටෙන් සම්පූර්ණ මැලේරියා වසංගතය තුරන් කරන්න අවශ්‍ය කරන පසුබිම නිර්මාණය කළා. ඒකට සිය දහස් ගණනක් ජනතාව ගොදුරු වුණා. ඒ වාගේම අද අපි මේ මැලේරියා වසංගතයට ගොදුරු වෙලා ඉන්න, එහෙම නැත්නම් මේ මැලේරියා රෝගයට ගොදුරු වෙලා ඉන්න ඉන්දියන් ජාතිකයන් පිළිබඳව කථා කරනවා. ලක්ෂ ගණනක් ඉන්දියන් ජාතිකයෝ වතුකරයේ මිය ගියා. ඒ කියන්නේ ඉන්දීය සම්භවයක් සහිත දෙමළ ජාතිකයින් ලක්ෂ ගණනක් වතුකරයේ මිය ගියා. මොකද, මේකට ප්‍රතිකාර නැතිව. ඉතින් ඒ විධියට මේ රට තුළින් බරවා රෝගයත්, මේ මැලේරියා රෝගයත්, අනෙකුත් වසංගත රෝගත් තුරන් කරපු රටක් විධියට අපි ලෝකයේ විශාල කීර්තියක් දිනාගෙන තිබෙනවා. දැන් ඒ කීර්තිය දිනා ගන්න පුළුවන්කම ලැබුණේ අපේ සෞඛ්‍ය සේවය ඉතාම විශිෂ්ට මට්ටමකට අපි ගෙනාපු නිසා. ඉතින් ඒකට නිදහසින් පස්සේ රජයන්. ඊට පෙරත් ඒ ඉංග්‍රීසි ආණ්ඩු පාලන සමයේදීත් ගත් ක්‍රියාමාර්ග නිසා තමයි මේවා අපට සම්පූර්ණයෙන්ම පිටුදකින්න, තුරන් කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ.

අද අපි මේ කථා කරන ප්‍රශ්නයේ දෙපැත්තක් තිබෙනවා. එකක් අද මේ රටේ විශාල ශ්‍රම හිඟයක් තිබෙනවා. එතකොට මේ ශ්‍රම හිඟයට විසඳුම් මොනවාද කියන එක අද අපි සාකච්ඡා කරමින් තිබෙනවා. අද අරගෙන බැලුවාම අපේ සෑම ක්ෂේත්‍රයකම තිබෙන කර්මාන්ත. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ, ඒ වාගේම හෝටල් කර්මාන්තයේ, ඒ වාගේම ජුවලරි කර්මාන්තයේ, ඒ වාගේම කෘෂිකර්මාන්තයේ, ධීවර කර්මාන්තයේ අනෙක් සෑම ක්ෂේත්‍රයකම, විශේෂයෙන් වැවිලි ක්ෂේත්‍රයේ ඉඳලා මේ සෑම ක්ෂේත්‍රයකම අද මේ ශ්‍රමිකයින්ගේ හිඟය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා දැන් මේකට විධිමත් ක්‍රමවේදයකින්, නීත්‍යානුකූල ක්‍රමවේදයකින් රට ඇතුළේ තිබෙන මේ ශ්‍රමිකයින්ගේ ප්‍රශ්නයට විසඳුම් සොයන්න අපි උත්සාහ කරනවා වාගේම අවිධිමත් ක්‍රමවලිනුත්, නීති විරෝධී ක්‍රමවලිනුත් රට ඇතුළට විශාල වශයෙන් ශ්‍රමිකයින් ගලා එමින් තිබෙනවා. ඉතින් ඒ ශ්‍රමිකයින් පැමිණීමේදී ඔවුන් වෛද්‍ය පරීක්ෂාවන්ට ලක් වෙන්නේ නැහැ. ඒ වාගේම ඔවුන්ගේ ප්‍රමිතිය පිළිබඳව සොයා බලන්නේ නැහැ. මේ කර්මාන්තය සඳහා විශාල වශයෙන් ශ්‍රමිකයෝ රට තුළට එනවා. ඒ ශ්‍රමිකයෝ ආවාම ඒ අය මාස තුනක වාගේ කාලයකට තමයි වීසා ලැබෙන්නේ. නමුත් අපට පේනවා ඊට පස්සේ ඒ අය තමන්ගේ වීසා කාලය අවසන් වුණාට පස්සේ හොර රහසේ මේ රට තුළම ලැගුම් ගන්න ඔවුන් උත්සාහ කරනවා. ඉතින් මේ අය විවිධාකාරයේ, සමහර විට ඒ අය රෝග වාහකයින් විධියට කටයුතු කරනවා. රෝගය රැගෙන එන්නන් විධියට. අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ආන්ද්‍ර ප්‍රදේශයේ, ඔරිස්රා ප්‍රාන්තයේ, බෙංගාලයේ, ඉන්දියාවේ තිබෙනවා. ඒ වාගේම අප්‍රිකානු මහාද්වීපයේ විශේෂයෙන් මැලේරියා රෝගය විශාල වශයෙන් පැතිරිලා තිබෙනවා. ඒ නිසා මේ අය රට ඇතුළට එන මංකඩවල් මොනවාද කියලා අපි හඳුනා ගනිමින් ඒ අය කිසියම් ආකාරයකට පරීක්ෂාවට ලක් කරන ක්‍රමවේදයක් අවශ්‍යයි. ඉතින් මේකට විධිමත් ක්‍රමවේදයක් නැතිව මේ රෝගය අපට පාලනය කරන්න, නියාමනය කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ.

ඒ නිසා විශේෂයෙන්ම මේ ගැන මධ්‍යම රජයේ අවධානය යොමු වෙන්න ඕනෑ. ඒ වාගේම ආගමන විගමන ක්ෂේත්‍රයේ කටයුතු කරන ඒ අපේ ප්‍රධාන ගුවන් තොටුපළ සහ අනෙකුත් වරායවල් සහ රට ඇතුළට විධිමත් සහ අවිධිමත් ආකාරයකින් රට ඇතුළට එන්න පුළුවන් ඒ ස්ථාන පිළිබඳව විධිමත් ක්‍රමවේදයක් සකසලා රට ඇතුළට මේ රෝග

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

වසංගත පැමිණීම පාලනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදය අපි සකස් කළ යුතුව තිබෙනවා. එසේ සකස් කිරීම තුළින් පමණයි මේක පාලනය කරන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතිව අපි ඉන්දියන් විරෝධයක් හෝ එහෙම නැත්නම් ශ්‍රමික විරෝධයක් හෝ මතු කිරීම නොවෙයි කළ යුතු වන්නේ. මේකට අවශ්‍ය කරන නියමිත ක්‍රමවේදයක්, සැලැස්මක් අපි සකස් කර ගන්නයි අවශ්‍ය වෙන්නේ. එහෙම නැත්නම් මේක පෙන්වන්න පුළුවන්. මේ ඉන්දියාවත් එක්ක ගහලා තිබෙන ගිවිසුම් නිසා, එහෙම නැත්නම් වෙනත් ගිවිසුම් නිසා ඇති වන තත්ත්වයන් කියලා. ඕනෑම ගිවිසුමකින් ඒ කටයුතු කර ගෙන යෑමේදී මේ වාගේ ගැටළු මතු වෙන්න පුළුවන්. ඒ ගැටළු පාලනය කරන්න, ඒවා නියාමනය කරන්න, ඒවා විධිමත් කරන්න අවශ්‍ය කරන ක්‍රමවේදයයි අපි සකස් කරන්න ඕනෑ. එවැනි ක්‍රමවේදයක් සකස් කිරීමකින් තොරව අපි එහෙම නැතිව මේක මතු කිරීමෙන් ඉන්දියන් ජාතිකයින් මෙපමණ ප්‍රමාණයක් ඉන්නවා. පකිස්ථාන් ජාතිකයෝ මෙපමණ ප්‍රමාණයක් ඉන්නවා. දැන් පසුගිය දවස්වල අපි දැක්කා. මේ රටේ මත් කුඩු ජාවාරම. මත්කුඩු ජාවාරමේ ප්‍රධාන කේන්ද්‍රස්ථාන කිහිපයක්, මර්මස්ථාන කිහිපයක් අපට වටලන්න පුළුවන්කම ලැබුණා. වැඩිම මත්ද්‍රව්‍ය තොගය පසුගිය දිනවල අපි දෙහිවල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ ජාවාරම පිටුපස හිටියේ බංගලාදේශ ජාතිකයින්. අද මේ රටේ බංගලාදේශ ජාතිකයින් ඉන්නවා. ඒ වාගේම සරණාගතයින් විධියට රෝහින්හියා සරණාගතයින් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා ඉන්නවා. ලෝකයේ ජාත්‍යන්තර සම්මුතිවලට ඇතුළත් වෙලා තිබෙනවා.

ඒ සරණාගත සම්මුතීන් එක්ක සමහර විට අපේ රට තුළ ඒ අයට රැකවරණ ලබා දෙන්න වෙලා තිබෙනවා. පකිස්ථාන් ජාතිකයෝ ලංකාවට ඇවිල්ලා ඉන්නවා. ඇෆ්ගනිස්ථානයෙන් ලංකාවට ඇවිල්ලා ඉන්නවා. ඉතින් ඒ අයට මේ රට ඇතුළේ රැකවරණ ලැබිලා තිබෙනවා. හැබැයි, ඒකෙන් අපි අදහස් කරන්නේ නැහැ කිසිසේත්ම මෙවැනි නීති විරෝධී කටයුතුවලට නිරත වෙන්න ඒ අයට ඒකෙන් අයිතියක් ලැබිලා තිබෙනවා කියලා. ඒවා පාලනය කිරීම - අපේ නීතිය හා සාමය පිළිබඳව කටයුතු කරන ඒ ආයතනවලට, අනෙකුත් ආයතනවලට, ඒ සියලු ආයතනවල තිබෙන වගකීමක් තමයි මේ කටයුත්ත පාලනය කරන එක. ඒ නිසා මම කියන්න කැමැතියි. අද අපේ රට ඇතුළේ හැම ක්ෂේත්‍රයකම ඇති වෙලා තිබෙන මේ සංකූලතාවය, මේ රෝගී තත්ත්වය අපි පාලනය කර ගන්න උත්සාහ කරන්න ඕනෑ. සාමාජීය වශයෙන් අපි රෝගී වෙමින් ඉන්නවා. දේශපාලනික වශයෙන් අපි රෝගී වෙමින් ඉන්නවා. අපේ දේශපාලන ක්‍රමය ඉතාමත් අවලස්සන විධියට, අශෝභන විධියට අද කඩා වැටෙමින් තිබෙනවා. ඒක පාලනය කරලා අපි මේ රට විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ඉදිරියට ගෙනියන්න කටයුතු කළේ නැත්නම් මම හිතන්නේ, රටක් විධියට අපි හැම පැත්තෙන්ම මෙවැනි ව්‍යසනවලට ගොදුරු වෙන එක වළක්වා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා හැම දෙයකටම ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය අනුගමනය නොකිරීම තමයි අද මේකට මූලිකම හේතුව වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ අපි හදලා තිබෙන යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු තිබෙනවා නම්, ඒ අඩුපාඩු අපි සකස් කර ගන්න ඕනෑ. අපේ වෛද්‍ය ක්ෂේත්‍රය තව විධිමත් කර ගන්න ඕනෑ. ආගමන විගමන ක්ෂේත්‍රයේ නීති රීති දැඩි කරන්න ඕනෑ. ඒ වාගේම ඒකට අදාළව පුද්ගලයෙක් රට ඇතුළට ගැනීමේදී, ඒ පුද්ගලයාට අදාළව අපි සොයා බැලිය යුතු තොරතුරු ප්‍රමාණයක් තිබෙනවා. අපි ජීව විද්‍යාත්මක තොරතුරු බලන්නේ නැහැ. ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව තොරතුරු බලන්නේ නැහැ. ඔහු රෝග වාහකයෙක් ද නැද්ද කියලා අපි බලන්නේ නැහැ. ඔහු මේ රටට ඇවිල්ලා කරන්නේ මොනවාද? ඔහු කරන රැකියාව මොකක්ද? ඔහු හුදු ශ්‍රමය වගුරුවන එක පමණක් ද කරන්නේ? එහෙම නැත්නම් වෙනත් අයුතු, නීති විරෝධී කටයුතුවල නිරත වෙනවාද නැද්ද කියන එක සොයා බලන්නේ නැහැ.

ඒ වාගේම මේ අයගේ නියමිත කාලය අවසන් වුණාට පස්සේ, මේ අය රටින් පිට වෙලා යනවාද නැද්ද කියලා බලන්නේ නැහැ. ඒ නිසා අද අපට පේනවා. හම්බන්තොට පැත්තට ගියාම, ඒ වාගේම අනුරාධපුර, අම්පාර, දිගාමඩුල්ල වාගේ ප්‍රදේශවල ගිහිල්ලා බැලුවාම අපට පේනවා. විශාල වශයෙන් මේ ඉන්දියන් ජාතිකයෝ ඉන්නවා. විවිධ සේවාවන් සැපයීම සඳහා රට ඇතුළට ඇවිල්ලා ඒ අය දැන් රටේ පැළ පදියම් වෙලා ඉන්නවා. නීත්‍යානුකූල ද නැද්ද කියලා අපට තහවුරු කර ගන්න විධියක් නැහැ. එක්කෝ ග්‍රාම සේවක හරහා සහතික ලබා ගෙන ගොයම් කපන්න ආපු අය, එහෙම නැත්නම් වෙනත් වැඩ කටයුතු කරන්න ආපු අය මේ විධියට දහස් ගණනක් රට ඇතුළේ ඉන්නවා.

ඉතින් ඒක පැහැදිලිව අපි පාලනය කරන්න ක්‍රමවේදයක් සකස් කර ගැනීම අත්‍යවශ්‍යයි.

ඒ නිසා අපේ හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා මේ ගෙනාපු යෝජනාව පිළිබඳව විශේෂයෙන්ම අපේ මධ්‍යම රජයේ සෞඛ්‍ය ප්‍රතිපත්ති තීරණය කරන්නන් විසින් අනිවාර්යයෙන්ම විමසා බැලිය යුතුව තිබෙනවා. එහෙම නැත්නම් අපි මෙවැනි ව්‍යසනවලට අනාගතයේදී හැම ආකාරයකින්ම ගොදුරු වෙන්න පුළුවන්. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විතරක් නොවෙයි. සාමාජීය වශයෙන්, ආර්ථික වශයෙන්, දේශපාලනික වශයෙන් අද මේ ව්‍යසනයට අපි ගොදුරු වෙමින් තිබෙන්නේ.

ඒ නිසා මේ රටට අනාගතයක් නිර්මාණය කරන්න නම්, මේ වසර ඉතාම තීරණාත්මක වසරක්. අපි හැම කෙනාම කියනවා, මේ වසර මැතිවරණ වසරක් කියලා. ඒ නිසා මේ මැතිවරණ වසරේදී අපි සිහි බුද්ධියෙන් යුතුව තීන්දු තීරණ ගත්තේ නැත්නම් මේ රට විශාල අගාධයකට යන එක වළක්වන්න බැහැ. ඒ නිසා හැම කෙනෙකුටම මහජන නියෝජිතයින් විධියට ඒ වාගේම මේ රටේ අනාගතය පිළිබඳව කල්පනා කරන පිරිසක් විධියට, රටේ ප්‍රතිපත්ති නිර්මාණය කරන පිරිස් විධියට අපි හැම කෙනෙකුටම වගකීමක් තිබෙනවා, මේ රට හරි මගට අරගෙන, මේ රට ස්ථාවර කරන්න. දේශපාලනික වශයෙන් ස්ථාවර කරන්න. ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් ස්ථාවර කරලා මේ රට කිසියම් ආකාරකට ලෝකයේ අනෙක් රටවල් එක්ක ස්ථාවර රටක් විධියට ඉදිරියට ගෙන යාම අපි සියලු දෙනාගේම වගකීමක්.

ඒ නිසා මේ යෝජනාව තුළිනුත් අපි බලාපොරොත්තු වෙන්නේ, මේ රටට කිසියම් ආකාරයකට අනාගතයේදී ගැටළුවක් බවට පත් වෙන්න පුළුවන් මේ මැලේරියා වසංගතය, බරවා වසංගතය මුල් අවදියේදීම පාලනය කරන්න අවශ්‍ය පියවර ගත යුතුයි කියන එක ඉල්ලා සිටිමින්, මේ ලැබුවා වූ 2019 වසර අපි සියලු දෙනාම සුභ නව වසරක් බවට පත් කර ගැනීම සඳහාත්, අපේ අභිලාෂයන්, අපේ ප්‍රාර්ථනාවන් වඩා ප්‍රජාතන්ත්‍රවාදීව ඒ වාගේම නීත්‍යානුකූලව සහ සියලු දෙනා අතර ගෞරවය, අපි සියලු දෙනාගේම මානව ගරුත්වය රැකෙන, අපි හැම කෙනාගේම ගරුත්වය රැකෙන ආකාරයට විවෘත භාවයකින්, ප්‍රජාතන්ත්‍රවාදීව ඉදිරියට ගෙනියන්න අපි සියලු දෙනාටම ශක්තිය, ධෛර්යය, නිරෝගී සුව ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට -

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි කාරණයක්. දැන් අපේ මේසය මත මේ පරිගණක සවි කරලා තිබුණාට, මේ එකකින්වත් වැඩ ගන්න බැහැ. මේකේ පණිවුඩයක් එනවා, මේකේ තිබෙන ප්‍රශ්නයක් ගැන. අපට මේකට මොකක් හරි විසඳුමක් අවශ්‍යයි. වහාම මේක නිවැරදි කරන්න. නැත්නම් අපට wifi සවිකරලා දෙන්න. අපි සාමාන්‍ය අයි පෑඩ්වලින් බලා ගන්නම්. මොකද, මේකේ කිසිම වෙලාවක, කිසිම site එකකට යන්න බැහැ. මේක වහාම නිවැරදි කරන්න. Download කරන්න, බලන්න, කිසිම දෙයක් මේකෙන් කරන්න බැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඒ ගැන දැනුවත් කිරීමක් කරන්නම්.

**ගරු සුසිල් කිදෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

මීළඟට ශ්‍රීනාත් ම. පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 12.20]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මම මේ සභාවට අද එන මොහොත වෙනකල් මේ යෝජනාව ගැන දැනගෙන හිටියේ නැහැ. ඒ නිසා සූදානමක් වෙලා ඇවිල්ලා කථා කිරීමට නොහැකි වුණත්, කෙටියෙන් වුණත් අදහස් දැක්වීම වැදගත් කියලා හිතපු හින්දයි අවසර ඉල්ලුවේ. ඒ අවසර ලබා දීම ගැන විපක්ෂ නායකතුමාටත්, ඔබතුමාටත් මගේ ගෞරවය පුද කරනවා. මම හිතන්නේ, ලංකාව රෝග ගණනාවක් පිටු දැකපු රටක් හැටියට ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් පවා

[ගරු ශ්‍රීනාත් ම. පෙරේරා]

සහතික කරලා තිබුණා. ලාදුරු, මැලේරියා, බරවා වැනි රෝග. නමුත් අපි දකින දෙයක් තමයි - ඇත්තටම හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන කල් මම දැනුවත් වෙලා හිටියේ නැහැ, බරවා සහ මැලේරියා රෝගය මේ රටේ නැවත් මුල් බැස ගැනීමේ හැකියාවක් තිබෙනවාය කියලා. මට මතකයි, මම මේ සභා ගර්භයේදී ලාදුරු රෝගය නැවතත් මුල් බැස ගැනීමේ හැකියාවක් තිබෙන බවට කරුණු ඉදිරිපත් කළා, මීට කලකට ඉස්සෙල්ලා. හේතුව, මම මොරටුවේ සංවිධායකවරයා හැටියට ඉන්න කොට අපි සායන දෙකක් කළා. ඒ සායන දෙකේදී මොරටුව ප්‍රදේශයේ හත් දෙනෙකු ලාදුරු රෝගයට ගොදුරු වෙලා තිබෙන බව අපට දැන ගන්නට ලැබුණා. ඒ අනුව ඒ අය අපි රෝහල්වලට යොමු කළා. ඉන් පස්සේ මොකක් වුණාද කියලා මම දන්නේ නැහැ. නමුත් මේ කාරණය ඉදිරිපත් කරන කොට මට තවම මතකයි. අපේ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂතුමා ඉඳලා පිළිගත්තා. ඒ වාගේ ප්‍රවණතාවයක් ලාදුරු සම්බන්ධයෙන් තිබෙන බව. නමුත් මම දැනගෙන හිටියේ නැහැ, ඇත්තටම මැලේරියා සහ බරවා රෝගය නැවතත් මේ රටට මුල් බැස ගැනීමේ හැකියාවක් තිබෙනවා කියලා. මේක බරපතළ ප්‍රශ්නයක්. මම හිතන්නේ, මේක තවම පාලනය කළ හැකි තැනක තිබෙන්නේ. හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා කියපු හැටියට, මට මතක හැටියට මැලේරියා රෝගීන් 48 දෙනෙක් දැනට සොයා ගෙන තිබෙනවා. 48 දෙනෙකු සොයා ගත්තාය කියන්නේ ඒ කියන්නේ අඩු ගණනේ ඉන් තුන් ගුණයක්වත් රෝගීන් බස්නාහිර පළාතේ ඇති.

මේක දැන් මේ මොහොතේ කල් දාන්නේ නැතිව අපි මේක පාලනය කරන්න පියවර ගත්තොත් මම හිතන්නේ කරදරයකින් තොරව අපට පාලනය කර ගන්න පුළුවන් වෙයි. නමුත් අපි ඒක කල් දමමින් සිටියොත් සමහර විට මේක රටේ ආර්ථිකයට පවා බලපාන බරපතළ ප්‍රශ්නයක් බවට පත් විය හැකියි. ගිය සුමානේ මම මාධ්‍යයෙන් දැනුවත් වුණා, යේමන් රටේ වසූරිය රෝගීන් 10,000 ක් මාසයකට සොයා ගන්නවා කියලා. මම හිතන්නේ, යේමනය කියන්නේ මම දන්නා තරමට යුද්ධයක් යම් ප්‍රමාණයකින් පවත්වාගෙන යන රටක්. මාසයකට 10,000 කට වසූරිය රෝගය වැළඳෙනවා කියලා. දැන් මේ නියපොත්තෙන් කඩන්න පුළුවන් දේ සම්බන්ධව අපි දැනට ක්‍රියාත්මක වෙලා ඒකට පියවර නොගත්තොත් සමහර විට පොරොවෙන් ගහලා කපන්න බැරි තැනකට මේ රෝග නැවතත් මේ රට පුරා යන්න පුළුවන්. ඒ නිසා හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාට මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරනවා, මේ ප්‍රශ්නය මතු කිරීම පිළිබඳව. මේකට අපි ගත යුතු විසඳුම් මොනවාද? මම දන්නේ නැහැ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අපේ නිලධාරීන් ඉන්නවාද කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලේකම්තුමා ඉන්නවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ලේකම්තුමා ඉන්නවා නම් මම ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. වහාම බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් පියවර ගත යුතුයි. ඒ විතරක් නොවෙයි. මම හිතනවා, මේ සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයත් දැනුවත් කිරීම වැදගත් වෙනවා. මොකද, සමහර විට මේ වාගේ සුළු තැනකින් පටන් ගන්න දේවල් පිළිබඳව රේඛීය අමාත්‍යාංශය දැනුවත් වෙලා ඉන්නත් පුළුවන්. නැති වෙන්නත් පුළුවන්. ඒ නිසා දැනුවත් කිරීම සහ ලෝක සෞඛ්‍ය සංවිධානයත් මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම, ලංකාවේ ඒ ශාඛාවට දැනුවත් කරලා ඒ මඟින් මේ පිළිබඳව සියලු පාර්ශවකරුවන් දැනුවත් කිරීම වටිනවා. මේක විහිළුවක් හැටියට, නැත්නම් මේක සැලකිල්ලට ගැනීමට අවශ්‍ය දෙයක් නොවන්නේය කියන තැන ඉඳගෙන කටයුතු කරන්නේ නැතිව මම හිතන්නේ, මේකට සම්බන්ධ සියලු ආයතන සම්බන්ධ වෙලා කටයුතු කළ යුතුයි. ඒ නිසා මම ඔබතුමා හරහා ඉල්ලීමක් කරනවා. කරුණාකරලා ඒ බලධාරීන්ගෙන් මේ නැවතත් ලියැලී එන්න හදන මේ මැලේරියා, බරවා රෝග සමඟ මම කියනවා, ලාදුරු රෝගයත් මේ රටේ නැවතත් හිස එසවීමේ හැකියාවක් තිබෙනවා. ඒ පිළිබඳව පියවර ගන්නා ලෙස ඉතාමත් කාරුණිකව ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම හිතනවා, මේ ආසාධිත තත්ත්වයේ ඉන්න අය පිළිබඳව විස්තර ලබා ගැනීම ඉතාමත්ම වැදගත්. ඔවුන් කුමන ප්‍රදේශවලද පදිංචි වෙලා ඉන්නේ කියන කාරණාව සලකා බැලීම වැදගත් වෙනවා. මොකද, ඒ අනුව ඒ ප්‍රදේශවලවත් අඩු තරමින් ඒ පළාත් පාලන ආයතන මාර්ගයෙන් - අපි දන්වා මේ රෝග වාහකයා හැටියට කටයුතු කරන්නේ මදුරුවා. මදුරුවා හැම විටම අපට වඩා ඉස්සරහායින් ඉන්නේ. මට මතකයි. අපේ ගෙවල් කිට්ටුව

ලොකු බෝඩ් එකක් ගහලා තිබුණා, 'මරණ වරෙන්තුව අපට නොව මදුරුවාට විය යුතුය' කියලා. ඒ නිසා මම හිතන්නේ, ඒ පිළිබඳවත් යම්කිසි හෝ අවධානයක් යොමු කරලා අඩු තරමින් මේ ආසාධිත අය පදිංචි වෙලා ඉන්න ප්‍රදේශ මොනවාද කියලා හඳුනාගෙන ඒ ප්‍රදේශවලවත් මේ මදුරු මර්දනය පිළිබඳවත් අවශ්‍යතාවයක් තිබෙනවාද නැද්ද කියන කාරණාව ගැන සොයලා බැලීම මම හිතන්නේ, වැදගත් වෙනවා.

ඒ වාගේම තව එක කාරණාවක් ගැන විතරක් මම කියන්න බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ, මේ රටේ මට තේරුම් ගන්න බැහැ කොහොමද ඒක ඇති වෙලා තිබෙන්නේ කියලා. කම්කරු හිඟයක් පවතිනවාය කියලා කියනවා. ඒ නිසා අඩු මුදලට අපට ඉන්දියාවෙන් කම්කරුවන් ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවාය කියලා කියනවා. ඇත්තටම මම හිතනවා, ඒ තොරතුරු සත්‍යයි. ඉන්දියාවේ ඉඳලා ලංකාවට ගෙනාපු කම්කරුවන්, කම්කරුවන් හැටියට නොවෙයි. බොහෝ විට ඔවුන් සංචාරකයින් හැටියට මාස තුනක වීසා එක ලබා ගෙන ඇවිල්ලා මෙහේ කම්කරු රාජකාරිය කරලා, සමහර අය යනවා. සමහර අය යන්නේ නැහැ. දැන් අපට මේක අපේ කම්කරු හිඟයට පහසු විසඳුමක් වෙන්න පුළුවන්. නමුත් අවසානයේදී මේක බරපතළ සෞඛ්‍ය ප්‍රශ්නයක් බවට පරිවර්තනය වෙනවා නම්, මේ මොහොතේ ලබා ගන්නා ඒ වාසියට වඩා දීර්ඝ කාලීනව අපට වන හානිය ගැන අපි හිතන්නට ඕනෑ. විශේෂයෙන් සංචාරක අමාත්‍යාංශය මම හිතන්නේ, සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න කැමැතියි. ගිය අවුරුද්දට වඩා 10% කින්, 12% කින්, 15% කින් අපේ සංචාරක පිරිස් වැඩි වෙලා තිබෙනවාය කියලා. නමුත් මේ වැඩි වන සංචාරකයින් අතර වැඩියෙන් ඉන්නේ රටට මුදලක් අරගෙන එන අය නොවෙයි. විශේෂයෙන් ඉන්දියාව වාගේ රටවල්වල ඉඳලා එන අපෙන් කීයක් හරි සොයා ගෙන ඒ රටට යන්න උත්සාහ ගන්නා මිනිස්සු. ඒ නිසා මම හිතන්නේ, අපට බරපතළ ලෙස සලකා බලන්න සිද්ධ වෙනවා. පළාත් සභාවක් හැටියට නොවෙයි. මම හිතන්නේ, රජයට විශේෂයෙන් මේ එන රෝග තිබෙන රටවල්වලින්, විශේෂයෙන් මේ වාගේ පැතිරෙන්න පුළුවන් රෝග තිබෙන රටවල්වලින් එන පුද්ගලයින් පැමිණීමේදී යම්කිසි ක්‍රමවේදයකට අනුව ඔවුන් පරික්ෂා කරලා බලලා ඇතුළු කරන්න පියවර ගත යුතු ද කියන කාරණාව ගැන මම හිතන්නේ, අපට බරපතළ සිතින් යුක්තව හිතලා බලන්න වෙයි. ඒ කියන්නේ, වෙනත් වචනවලින් කියනවා නම් අපි හිතමු. ඉන්දියාවේ ඉඳලා එන අයගෙන් බරවා, මැලේරියා සහ ලාදුරු වාගේ රෝග ලක්ෂණයන්, නැත්නම් ඒ පිළිබඳව ඔවුන්ට සහතිකයක් ලබා ගන්න පුළුවන් නම්, ඒ සෞඛ්‍ය සහතිකය නැතිව ඔවුන්ව මේ රට ඇතුළට ඇතුළු කිරීම තහනම් කිරීම වාගේ බරපතළ තීන්දු තීරණ අපට ගන්න සිද්ධ වෙයි. මම හිතනවා, මේ රටේ ඉන්න පාලකයින් මේ පිළිබඳවත් කරුණු සලකා බලලා අර මම මුලින් කිව්වා වාගේ, නියපොත්තෙන් කඩන්න පුළුවන් දේ අපි පොරොවෙන් ගහලාවත් කපන්න බැරි තැනකට යන්න ඉඩ දෙන්නේ නැතිව, පාලනය කර ගැනීම අවශ්‍ය වෙනවාය කියලා මම හිතනවා. ඒ පසුබිම තුළ මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන අතර, මේ අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව සලසා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට අනේකවාරයක් ස්තුති කරන අතර, අදට වඩා ශ්‍රී ලාංකිකයින් හැටියට අපට සාධාරණය සහ යුක්තිය ඉෂ්ට කෙරෙන, කාටත් අනෙක් අය ඉදිරියේ දනින් වැටී ජීවිතය ගත කරන්නට සිදු වන අනාගතයක් වෙනුවට තමන්ගේ කකුල් දෙකෙන් හිට ගෙන සාධාරණය සහ යුක්තිය ඉෂ්ට වන සමාජයක් ගොඩ නැඟීමට හෙට දවසේදී අපට ශක්තිය ලැබේවායි කියන ප්‍රාර්ථනාවත් එක්ක, නැවත වාරයක් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 12.31]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව හදවතින්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, මෙවන් වූ යෝජනා ඉදිරිපත් කරලා අද රටේ නැවත වතාවක් මම හිතන්නේ මේ රට තුළ තුරන් වෙලා තිබුණු ලෙඩ රෝග නැවත අප රටට ගලාගෙන ඒම තුළ අපේ කථා කරපු මන්ත්‍රීවරු විවිධ අදහස් ප්‍රකාශ කළා. මට මතක් වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පුංචි කාලයේ පළාත් පාලන ආයතනය තුළ තිබුණේ සුළු නගර සභා, ගම් සභා ක්‍රමය. මේ සුළු නගර සභා, ගම් සභා ක්‍රමය තුළ තිබෙන කොට නගර එදා වැඩියෙන් දියුණු නොවී තිබුණත් එදා පිළිවෙළකට මදුරු තෙල් ටික ගහලා, එදිනෙදා හැමදාම කාණු පද්ධතිය සුද්ද කරලා, ඒ සියල්ල අංග සම්පූර්ණව සිදු වුණා. අද මම හිතන්නේ, විද්‍යාවේ දියුණුවත් එක්ක ලෝකය හරි ඉක්මණින් ගමනක් යන මොහොතක එක

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

බොත්තමක් තද කළොත් අහහරු ලෝකයට වුණත් යන්න පුළුවන් යුගයක මම හිතන්නේ, අද සියල්ල නවීකරණය වීම තුළ අපි දකිනවා. මේ ලෙඩ රෝග තුරන් වුණත්, නැවත මේ ලෙඩ රෝග අපට වැළඳෙන්න කටයුතු වෙලා තිබෙන්නේ අපේම තිබෙන අවිධිමත් භාවය නිසා කියලා මම කියනවා. මොකද, ඒකට හේතුව. අපේ පළාත් පාලන ආයතනය තුළ තිබෙන කැළි කසළ ටික පිළිවෙළකට ක්‍රියාත්මක නොවෙනවා. කාණු පද්ධතිය හරියට ශුද්ධ වෙන්නේ නැහැ. මොකද, ඒ කාණු ටික උඩින් කොන්ක්‍රීට් එකක් දාලා වහලා තිබෙනවා. ඒවාට ගෙවල්වල, එහෙම නැත්නම් ව්‍යාපාරික ස්ථානවල තිබෙන මුත්‍රා, එහෙම නැත්නම් මළ පහ කරන සියල්ල ඒ කාණු පද්ධතියට එවලා ඒවා ගඟ දිගට අරින්න කටයුතු කරලා තිබෙනවා. මෙවන් වූ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන කොට අද පළාත් පාලන ආයතන තුළ සමහර දේශපාලන අධිකාරිය මේවාට ක්‍රියාත්මක නොවුණත්, මම හිතන්නේ ඒ ඉන්න නායකයෝත් එක්ක එකට එකතු වෙලා නොයෙකුත් ආකාරයේ කටයුතු කිරීම තුළ මම හිතන්නේ, අද මේ මහා භයානක තත්ත්වයක් මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. උදාහරණයක් ගත්තොත් මට කියන්න පුළුවන්. හැම එකකටම මම ඇඟිල්ල දික් කරන්නේ නැහැ. මම හැම එකක්ම සොයන්න යන්නේ නැහැ. නමුත් අද අපි ජීවත් වන ප්‍රදේශය තුළ බේරුවල ප්‍රාදේශීය සභාව තුළ අද මේ ප්‍රශ්නය දැඩි ලෙස උග්‍ර වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි. අද MOH එකේ ඉන්න සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගෙන් හරියට වැඩ ගන්නේ නැති ක්‍රමවේදය නිසා. අද ඔවුන්ව පැත්තකට දාලා ඔවුන්ගෙන් ගන්න ඕනෑ ඒ අවශ්‍යතාවය පිළිබඳව කටයුතු නොකිරීම තුළ, අද මහා භයානක ලෙඩ රෝගවලට මුහුණ පාලා තිබෙනවා.

මැලේරියාව පමණක් නොවෙයි. බරවා පමණක් නොවෙයි. අද ඩෙංගු රෝගය මහා දරුණු විධියට ක්රියාත්මක වෙනවා. ඒවාට අවශ්‍ය බෙහෙත් ටික ගහන්නේ නැහැ. ඒවා පිරිසිදු කරන්නේ නැහැ. හැබැයි, ඇහුවාම කියනවා. සමහර විට මෙතැන ප්‍රධාන නිලධාරීන් ඉන්නවා. කියන්න කනගාටු වෙනවා. අපි අයවැයේදීත් කථා කළා. ප්‍රශ්නවලට පිළිතුරු ලිඛිතව භාර දුන්නත් අද නිලධාරීන්ගෙන් ඇහුවාම, පළාත් පාලන ආයතන බේරුවල ප්‍රාදේශීය සභාව තුළ කථා කරනවා. අවුරුද්දකට කෝටි දෙකක බෙහෙත් ගහලා තිබෙනවා. හැබැයි, අපි ජීවිතේට දකින්නේ නැහැ එහෙම බෙහෙත් ගහලා තිබෙනවා. කොහේද එහෙම බෙහෙත් ගහලා තිබෙන්නේ. එක දවසක්වත් බෙහෙත් ගහලා නැහැ. නමුත් වංචා විධියට මේ කටයුතු සියල්ල සිදු වේ ගෙන යනවා. දේශපාලන අධිකාරියත් බලාගෙන ඉන්නවා. හැබැයි, සමහර නිලධාරීනුත් මේවා ආරක්ෂා කරනවා. අපි සංචාරක කලාපයක් තුළ ජීවත් වෙන ප්‍රදේශයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පුංචි කාලේ මේ බරවා රෝගය පිළිබඳව පරීක්ෂා කරන්න රෑ හතට විතර එනවා, අපේ ඇඟිල්ල විදලා ලේ ටික පරීක්ෂා කරන්න. අපි පුංචි කාලේ භයේ ගෙයි මුල්ලට ගිහිල්ලා හැංගෙනවා. අද මම හිතන්නේ, මම දන්නා කාලයක අපේ ප්‍රදේශයේ පැත්ත පළාතකට මේ කිසිම නිලධාරියෙක් ඇවිල්ලා නැහැයි කියන එක මම භයක්, සැකක් නැතිව ඉදිරිපත් කරනවා. අද මේවා මම හිතන්නේ මුදලට, එහෙම නැත්නම් ඒ ක්‍රියාත්මක වන වැඩ සටහන් ක්‍රියාත්මක නොවීම තුළ මධ්‍යම රජය, පළාත් සෞඛ්‍ය, අපේ මේ පළාත් සභාව තුළ අද ඇමතිතුමා නැති වුණත් අපේ ලේකම්තුමා ඉන්නවා. ලේකම්තුමනි, මේ වෙනුවෙන් වැඩ පිළිවෙළක් දියත් කරන්න ඕනෑ. මේ ලෙඩ රෝග දෙක පමණක් නොවෙයි. ඉතාම පිළිවෙළකට මේ කටයුතු නිර්මාණය කර ගෙන යන්න වැඩ සටහන් දියත් කර ගෙන යන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මඟින් මධ්‍යම රජය දැනුවත් කරලා, පළාත් පාලන ආයතනත් කැඳවලා, ඒ අදාළ සෞඛ්‍ය පරීක්ෂකවරුත් කැඳවලා විධිමත් වැඩ පිළිවෙළක් දියත් කිරීම තුළ නැවත මේ රෝග අපි වැළඳ ගන්න එක මම හිතන්නේ, අඩු කර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබෙනවා.

අද සංචාරක කලාපයක් වන අපේ ප්‍රදේශය තුළ මම මීට ඉස්සෙල්ලාත් කථා කළා. ඒ ප්‍රදේශයේ වැහිලා තිබෙන සමහර හෝටල් ටික හදන්න දැන් අවුරුදු ගණනක් ගිහිල්ලා තිබෙනවා. මේ හෝටල් හදලා භාගයට නවත්වපු තැන්වල මදුරුවෝ බෝ වන මහා තැන් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, මේවා පළාත් පාලන ආයතනවලට කිව්වත් අද වැඩක් නැති වෙලා තිබෙනවා. සමහර හිස් භූමි තිබෙනවා. ඒවා විදේශීය රටවල්වලට අයත් වෙලා තිබෙන ස්ථාන. හැබැයි, මේවා මහා කැලෑ බවට පත් වෙලා අද ඒ සංචාරක කලාපය අල්ලපු වැටේ තිබෙන තරු හතරේ හෝටල්, තරු තුනේ හෝටල්, තරු පහේ හෝටල් තිබුණත් අල්ලපු වැටේ තිබෙන්නේ මහා දරුණු කැලෑවක්. මම හිතන්නේ, මේවාට වැඩ පිළිවෙළක් දියත් කරන්න කියලා අපි කිව්වත්,

මේවා බීරි අලින්ට වීණා වයනවා වාගේ තමයි. සමහර දේශපාලඥයෝ සහ සමහර රාජ්‍ය නිලධාරීන්ට. මම හිතන්නේ, මේවාට වැඩ පිළිවෙළවල් දියත් කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි මේවා අවම කර ගන්න පුළුවන්කම තිබෙන්නේ.

දැන් ඊට වඩා භයානක ලෙඩ රෝගයක් බෝ වේ ගෙන යනවා. මම හිතන්නේ, මේ වන කොට දරුණුම දේ තමයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාවත් එක්ක අපි මේක මතක් කරනවා. ඒඩ්ස් රෝගය. අද මම හිතන්නේ, කළුතර දිස්ත්‍රික්කය බැලුවොත් සංචාරක කලාපයක් හැටියට ක්‍රියාත්මක වෙන කොට විවිධ සංචාරකයෝ පැමිණෙනවා. ඒ සංචාරකයින්ගෙන් සහ එහෙම නැත්නම් වෙනස් වුණු පුද්ගලයින්ගෙන් බෝ වුණු ඒ රෝගය අද මම හිතන්නේ, ක්‍රම ක්‍රමයෙන් අපේ ප්‍රදේශවල ව්‍යාප්ත වෙමින් යනවා. පසුගිය දවස්වල කළුතර රෝහලේ යම්කිසි පුද්ගලයින් තුන් දෙනෙකුව පරීක්ෂාවට ලක් වුණා. ඒ තුන් දෙනාම positive බවට පත් වුණා. හැබැයි, ඔවුන්ට මේක positive බවට පත් වුණත්, මේක ඇඟ තුළ ක්‍රියාත්මක වෙන බව තිබුණත්, ඔහුව වෙන් කරන්න, ඔහුව මරන්න රටේ නීතියක් නැහැ. හැබැයි, මේ සමහර පුද්ගලයෝ සමලිංගික ක්‍රියාදාම කර ගෙන යනවා. එහෙම නැත්නම් ගණිකා වෘත්තිය සමහර අවස්ථාවලදී කර ගෙන යනවා. මේ යන කිහිප දෙනෙක් අතර තමයි මේක වෙන්නේ. හැබැයි, මේ අය පාවිච්චි කරන විශාල ප්‍රමාණයකට අද මේ ලෙඩ රෝග බෝ වෙලා තිබෙනවා. අපි පසුගිය දවස්වල ඒ පිළිබඳ සෞඛ්‍ය පරීක්ෂකවරුත් එක්ක කථා කළා. පොලීසියත් එක්ක කථා කළා. පොලීසියත් එක්ක ගිහිල්ලා වැඩ මුළු පැවැත්වුවත් සමහර දේවල් අපි දකිනවා. ඒක දිගින් දිගටම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා මම හිතන්නේ, රට තුළට මම හිතන්නේ, අපි පාර්ලිමේන්තුව තුළ නොයෙකුත් අණ පනත් ක්‍රියාත්මක වෙන කොට මේවාට අවසර දෙන කොට මම හිතන්නේ, විදේශගතවලින් මෙහෙට ශ්‍රමිකයන් කැඳවන කොට මම හිතන්නේ ඔවුන්ව දැඩි පරීක්ෂාවකට යොදලා ඔවුන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ. එහෙම නොවන නිසා තමයි ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලාට අපට මේ යෝජනාවක් ගෙනැල්ලා, කථා කරන්න සිද්ධ වෙන්නේ. මේවා අවිධිමත්. එහෙම නම් ගුවන් තොටුපළේදී ඔවුන් එන කොට වෙනම පරීක්ෂාවකට ලක් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ රටේ ඉඳලා පරීක්ෂාවක් කරලා ගේන්න ඕනෑ. ඊට වඩා අපි මේ රටට ආවාට පස්සේ පරීක්ෂාවක් වෙන්න ඕනෑ. අපි විදේශීය රටකට ගියාට පස්සේ අපව වෙනම මම හිතන්නේ ඒ කම්පැනි එකකට වැඩට යනවා නම්, ඒ ආයතනයක වැඩට යනවා නම් ඒ සියලු පරීක්ෂාවන්ට ලක් කරලා තමයි ඒ රටට අපව ගන්නේ. හැබැයි, අපේ රටට එන සියලුම දේවල් අපේ ඉහළ තලයේ ඉන්න සියලුම කට්ටිය බඳා ගෙන කටයුතු කරන්න ගියාම තමයි මේ දේවල් සිද්ධ වෙන්නේ. විවිධ මත දරන සමහර මන්ත්‍රීවරු ඉන්නවා. කතා කරන්න ගියාම යෝජනා ගැන නොවෙයි කථා කරන්නේ. දේශපාලනය ගැන කථා කරනවා. ඒ නිසා ඔබතුමාට කථාව ආරම්භ කරන්න ඉස්සෙල්ලා කිව්වේ, මේ යෝජනාවකට අනුව කථා කරන කොට තමයි මේවාට අවශ්‍ය කරන ශක්තිය ලැබෙන්නේ.

ඒ නිසා මේ සුන්දර වූ මාතෘ භූමිය තුළ ජීවත් වන පුද්ගලයන්ට වඩා මේ මාතෘ භූමියට ආදරය කරන්නේ විදේශ බලවේග. ඒ බලවේග ආදරය කරන නිසා තමයි අපේ රටට නොයෙකුත් දේවල් ගෙනැල්ලා මේ රට විනාශ වෙන්න නොයෙකුත් ලෙඩ රෝග එවලා, ගෙනැල්ලා දාලා හරි මේ රටේ ඉන්න මේ මාතෘ භූමියට ආදරය කරන ජනතාව විනාශයට පත් කරලා ඔවුන් මේ රට ආක්‍රමණය කරන්න තමයි මේ සූදානම් වෙන්නේ. මෙන්න මේවාට වැඩ පිළිවෙළවල් හදන්න ඕනෑ පාර්ලිමේන්තුව තුළ. ඒවාට අවශ්‍ය කරන මොනවා හරි අණ පනත් ගේන කොට මේවාට සමහරු විරුද්ධ වෙනවා. මේවා කථා කරනවා නම් පිළිවෙළකට මේවා තෝරලා බලලා ඒ අවශ්‍ය කරන කටයුතු නිර්මාණය වෙන්න ඕනෑ. එහෙම වෙන නිසා තමයි මම හිතන්නේ, මෙවන් වූ ලෙඩ රෝග නැවත අපේ රට තුළ ස්ථාපිත වෙන්න සූදානම් වෙන්නේ. ඊට මුහුණ දෙන්න සිදු වෙන්නේ. අද බරවා රෝගය මම හිතන්නේ බරවා රෝගයට අවශ්‍ය කරන ප්‍රතිකර්ම රට තුළ හරියාකාරව නිර්මාණය වෙනවා නම්, අද මම හිතන්නේ මේ කටයුතු සිදු වෙන්නේ නැහැ. අපි ඔබතුමා මාර්ගයෙන් කියනවා, ලෝක සෞඛ්‍යයත් අපේ රට පිළිගෙන සහතිකයක් ලබා දීලා තිබෙනවා නම් මම හිතන්නේ, අද ඔබතුමා මඟින් නැවත ඉල්ලීමක් කරනවා, සෞඛ්‍ය අමාත්‍ය රාජිත සේනාරත්න මැතිතුමාගෙන්. වැඩ පිළිවෙළක් දියත් කරන්න. මේ වැඩ පිළිවෙළට අවශ්‍ය කරන ශක්තිය අපිත් ගම්මාන මට්ටමෙන් පක්ෂ භේදයකින් තොරව අපි ඕනෑම වෙලාවක ලබා දෙනවා. රටේ හරි දෙයක් සිදු වෙනවා නම්, හරි වැඩක් කරනවා නම් ඒ අවශ්‍යතාවය වෙනුවෙන් අපි පක්ෂ පාට නොබලා අපි හැම තැනම කටයුතු කරලා තිබෙනවා.

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

ඒ නිසා අපි ඒවාට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න අපි සූදානම් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මතක් කරනවා. ඒ වාගේම සෞඛ්‍ය ඇමතිතුමා නැති වුණත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඉන්නවා. නිවැරදි වැඩ පිළිවෙළක් මේ මන්ත්‍රීවරුන් එක්ක යොදලා, ඒ වාගේම ඒ අදාළ කලාපවලට අවශ්‍ය කරන ඒ සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් ගෙන්වලා, අපේ ප්‍රධාන අමාත්‍යතුමාට කියලා සෞඛ්‍ය පරීක්ෂකවරුන් ගෙන්වලා ඒ වැඩ පිළිවෙළ තුළදී මම හිතන්නේ නැවත මේ රෝග බෝ වීම අවම කර ගන්න පුළුවන්කම ලැබෙයි. එහෙම නැත්නම් අපි අපේ කලාප තුළ ඉතාම සුන්දර පරිසරයක් තුළ පිරිසිදු භාවය, ඒ වාගේම කැළි කසළ ප්‍රශ්නය, ඒවාට අවශ්‍ය කරන ශක්තිය තම තමන්ම මන්ත්‍රීවරු සභා ගැබට විතරක් ඇවිල්ලා කථා කරලා සීමා නොවී තමන්ගේ ප්‍රදේශය තුළ අවශ්‍ය විවිධ විවිධ වැඩ සටහන් පවත්වලා ඒ අවශ්‍ය කරන කාර්යය හරියාකාරව කෙරෙනවා නම් මේවා අඩු වෙනවා. මහජන නියෝජිතයා යනු ජනතාවගේ සේවකයා. ඒ වචනයේ පරිසමාප්ත අන්දමට සමහර මහජන නියෝජිතයෝ කටයුතු කරනවා. සමහරු මේ සභා ගැබට ඇවිල්ලා, මෙතැනට ඇවිල්ලා යම්කිසි යෝජනාවකට කථා කරලා ගිහිල්ලා එළියට ගියා ගියාමයි ආපහු එනවා යනවා. විනාඩි 05 ක් ඉඳලා යනවා. ඒක නොවෙයි විය යුත්තේ. මේ සභාවේ ගෙනෙන යෝජනාවලට, චෝදනාවලට අවශ්‍ය කරන ප්‍රශ්නවලට පිළිතුරු දීලා ඒවාට ඇහුම්කන් දීලා ගමට ගිහිල්ලා ඒ අවශ්‍ය කරන කාර්යය ඉටු වෙනවා නම්, ඔබතුමාගේ මේ යෝජනාවත් එක්ක අපි කථා කරන මේ සියලු දේවල්වලට ශක්තිය ලැබෙනවා.

ඒ නිසා අද හදවතින්ම ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව. සූදානම් වෙලා ආවේ නැති වුණත් වචන කිහිපයක් කථා කළා. මේවා ගැන සූදානම් වෙන්න දෙයක් නැහැ. දැක්කාම බැලුවාම අපට කථා කරන්න, ක්‍රමවේදය කියා දෙන්න අවශ්‍යතාවයකුත් නැහැ. ඒ නිසා ලැබුවා වූ 2019 වසර ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේ සියලුම ගරු ඇමතිවරුන්ටත්, සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත්, ඒ වාගේම අමාත්‍යාංශ ලේකම්වරුන්ටත් ප්‍රධාන සියලුම කාර්ය මණ්ඩලයටත්, පෞද්ගලික කාර්ය මණ්ඩලවටත්, සියලුම මාධ්‍යවේදීන්ටත්, සමස්ත රටේ හැම දෙනාටමත් සුහම සුභ වසරක් වේවා. ආපදා කිසිවක්, ලෙඩ රෝග කිසිවක් නැති වසරක් බවට අපි හැම දෙනාගේම ශක්තිය තුළින් කටයුතු කරන්න ධෛර්යය, ශක්තිය, වාසනාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.43]

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා වැදගත් යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කරලා එතුමා බලාපොරොත්තු වෙන්නේ, අපි මන්ත්‍රීවරු යෝජනාවක් හැටියට කලින් න්‍යාය පුස්තකයට ඇතුළත් කරලා එහෙම නැත්නම් හදිසි යෝජනා හැටියට ගෙනැල්ලා සාකච්ඡා කරලා, ඒ සාකච්ඡා කරපු යෝජනා, ඒ සිද්ධ වුණු හැම දේම හමස් පෙට්ටියට දමා අදින් පස්සේ මේක වසා දැමීම වෙනුවට මේ සම්බන්ධයෙන් ඊට වඩා අපේ බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මැදිහත් වීමක් විය යුතුයි කියන අදහසින් තමයි එතුමා මේ යෝජනාව ගේන්නේ. මොකද, එතුමාට විශේෂ හේතුවකුත් තිබෙනවා. එතුමා ජීවත් වන, එතුමා දේශපාලන කටයුතු කරන ප්‍රදේශයේම තමයි බරවා මර්දන ඒකකය තිබෙන්නේ. චෙරහැර. ඉතින් මේ ගැන කථා කරද්දී අපි වසංගත රෝග ගැන කථා කරනවා. වසංගත රෝග ආරම්භයේදීම කථා කරලා මේක මුලිනුපුටා දමන්න වැඩ කටයුතු කරන්න ඕනෑ කියන අදහස ඉදිරිපත් කරනවා. නමුත් ඒ සඳහා නිශ්චිතව ක්‍රියාත්මක වෙන්න වැඩ පිළිවෙළක් බස්නාහිර පළාත් සභාව හෝ මධ්‍යම රජය හෝ සතුව පවතිනවාද කියන ප්‍රශ්නය තිබෙනවා. දැන් උතුරු පළාතේ ගංවතුර ගලපු වෙලාවේ, එහෙම නැත්නම් රටේ වෙනත් තැනක ව්‍යසනයක් වුණු වෙලාවේ, ඒ ව්‍යසනය සිද්ධ වුණු දවසේ ඉඳලා ඒකට විසඳුම් කථා කරනවා. කෙටි කාලයක්. මාසයක්. දෙකක්. තුනක්. තුන් මාසේ දානේ දෙනකම් කථා කරනවා. එතැනින් පස්සේ ඒක අමතකයි. දැන් උතුරු පළාත් සභාව තිබුණා නම්, උතුරු පළාතේ ගං වතුර ගැන මේ මොහොතේ සාකච්ඡා කරන්න, විසඳුම් සොයන්න පුළුවන්. ඒ වාගේම ඩෙංගු අවදානම වැඩි වුණු කාලයට මේ සභාවට හදිසි යෝජනා ගෙනැල්ලා අපි ඩෙංගු මර්දනයට කටයුතු කරන්න, ඩෙංගු කාර්ය සාධක බලකායවල්, ජනාධිපති බලකායවල් පිහිටුවනවා. දැන් ඒ බලකායවල් සියල්ලම නිහඬ වෙලා තිබෙන්නේ. හැබැයි, ඩෙංගු මදුරුවාගේ ක්‍රියාකාරීත්වය ඒ ආකාරයෙන්ම සිද්ධ වෙනවා. ඒ මදුරුවාගේ ක්‍රියාකාරීත්වය අත් හැරිලා නැහැ. දැන් අදටත් ඩෙංගු රෝගීන් කඩුවෙල ප්‍රදේශයේ, කොලොන්නාව ප්‍රදේශයේ වැඩි වෙලා තිබෙනවා. මෙන්න

මේ ආකාරයෙන් දැන් මදුරුවාගේ ක්‍රියාකාරීත්වය වැඩි වෙනවා. හැබැයි, ඒ මර්දනය සඳහා ක්‍රියාත්මක වන බලකායවල් වෙනත් වෙනත් අරමුණු වෙනුවෙන් වැඩ කටයුතු කරමින් තිබෙනවා. දැන් ජනාධිපති කාර්ය සාධක බලකාය මේ මොහොතේ කරන්නේ මොකක්ද කියලා ඇහුවොත්, මොකුත් නැහැ. ඒ ඩෙංගු මදුරුවා ව්‍යාප්ත වීම වැඩි කාලයට, ඩෙංගු රෝගීන්ගෙන් රෝහල් පිරෙද්දී, රෝහල්වල ඇඳන් මදි වෙලා ඇඳන් යට, එහෙම නැත්නම් අසල් වැසි රෝහල්වලටත් පරීක්ෂණ කටයුතු සඳහා එවද්දී, අසළ තිබෙන රෝහල්වලට රෝගීන් මාරු කර එවද්දී මෙන්න මේ ගැන සමාජයේ කතා බහ වෙනවා. අමාත්‍යාංශත් හරි උනන්දුයි එතකොට. එතකොට බැනර් ප්‍රදර්ශනය වෙනවා, අන්න අර කියපු කාර්ය සාධක බලකායවල්වල. ඇමතිවරුන්ගේ, මන්ත්‍රීවරුන්ගේ ෆොටෝ ටික දා ගන්නවා. රෝහල වටේ බැනර් ටික ගහ ගන්නවා. එහෙම නැත්නම් ශ්‍රමදාන කරන තැන්වල. දැන් ඊට පස්සේ හිතනවා, ඔන්න අපි ඩෙංගු මර්දනය කරලා හමාරයි. කෙටි කාලයකට පායන කාලය ආවාට පස්සේ, ඩෙංගු ව්‍යාප්තිය අඩු වෙනවා. නමුත් ක්‍රමානුකූලව අපේ රටේ දැන් මර්දනය කර ගන්න අවශ්‍ය වූ ඒ ව්‍යසනයක්, අපි මොන තරම් කථා කළත්, ක්‍රියාමාර්ග යෙදුවත් තවමත් ඩෙංගු ව්‍යසනයෙන් අපේ රටේ ජනතාව මුදවා ගන්න බැරි වෙලා තිබෙනවා.

නමුත් ඉතිහාසයේ කිසියම් අවස්ථාවක අද යෝජනා කරන මැලේරියා, බරවා සම්පූර්ණයෙන්ම මර්දනය කර ගන්න පුළුවන් වුණාය කියලා සෑහීමකට පත් වෙලා, ලෝක සෞඛ්‍ය සංවිධානය අපි ගැන ප්‍රශංසා මුඛයෙන් කථා කරන තත්ත්වයට මේ රට පත් කර ගන්න පුළුවන්කම ලැබුණා. මෙන්න මේ තත්ත්වය ඉබේ පහළ වූවක් නොවෙයි. මුළු සමාජයම එක පෙළට පෙළගැහිලා. අපි දන්නවා, එක්දහස් නවසිය තිස් ගණන්වල ඒ කැලැ උණ පැතිරුණු කාලයේ සමාජයක් හැටියට කොහොමද ඒ සඳහා වැඩ කටයුතු කළේ කියලා. මුළු රටම පෙළගැහුනා, ඒ සඳහා එක අරමුණකට. උදාහරණයක් වශයෙන් කිව්වොත්, සුනාමිය වෙලාවේ මුළු රටේම දේශපාලන වාද භේදයක් තිබුණේ නැහැ. කවුරුත් සුනාමි ව්‍යසනයට ගොදුරු වුණු ඒ ප්‍රදේශවලට ගිහිල්ලා පවු, පෞද්ගලික අරමුණු පැත්තකට දාලා මහා දානපතියන් ඒ ධනස්කන්ධය පරිත්‍යාග කරන්න සූදානම් වුණා. ඔවුන්ට ජීවිතයේ අනිත්‍ය ගැන හොඳට වැටහුණා. අර මළ කඳන් හතළිස් දහස් ගණනක් අපේ රට වටේ ගොඩ ගැහිලා. ඒ නිසා එවැනි ව්‍යසනයකදී රටක් හැටියට පෙළ ගැසුණා. ඒ පෙළ ගැසීම හරහා ලෝකයේ අනෙක් රටවල්වලට ආදර්ශවත් වෙන හැටියට අපි සුනාමි ව්‍යසනයට මුහුණ දුන්නා. මුහුණ දීලා අපේ රට ගොඩ ගත්තා. විශේෂයෙන්ම අපි සතුටු වෙනවා. අපේ මැදිහත් වීම ජනතා විමුක්ති පෙරමුණ විධියට එවැනි ව්‍යසනයක් ආපු වෙලාවේදී දකුණේ පැරැළියේ ඒ මුහුදු බඩ දුම්රිය මාර්ගය විනාශ වෙලා යද්දී, ඒ රේල් පාරේ සිල්පර කොටන්, රේල් පීලි පොල්ගස් කරටිවල රැඳෙද්දී, ඉතා ඉක්මණින් ඒ දුම්රිය සේවාව ආරම්භ කර ගන්න අපට ඕනෑකම තිබුණා. රජය මේ සඳහා විදේශ රටවල සහාය ඉල්ලුවා. කෝටි ගණනක් වැය වන ව්‍යාපෘතියක්. දින 53 ක් ඇතුළත, මුළු කම්කරු බලවේගය මෙහෙයවලා. දුම්රිය සේවකයෝ සිදු කළා. එකේ දේශපාලන භේදයක් තිබුණේ නැහැ. අපි නායකත්වය දුන්නා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ඒ සියලුම වැඩ කරන කම්කරුවන්, වැඩ කරන අය, නිලධාරීන් එකාවන්ව මැදිහත් වුණා. දින 53 කින් අපේ රටේ නැවත දකුණට කෝච්චි ගියා. එහෙම කරන්න පුළුවන් රටක්. එහෙම මිනිස්සු ඉන්න රටක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මෙන්න මෙතැනට ආදර්ශය සපයන, ඒ මූලිකත්වය දෙන්න ඕනෑ අය වෙනත් අරමුණු කරා ගමන් කරද්දී, තමන්ගේ බල ව්‍යාපෘති පමණක්ම අරමුණු කරගෙන තමන්ගේ බලය තවදුරටත් රැක ගැනීමට අරමුණු කරගෙනම යන ගමනේ අපට සමාජයක් යහපත් කරන්න ඔවුන්ට ඒ ගැන හැරී බලන්නවත් වෙලාවක් නැහැ. අද ඊළඟ මැතිවරණයට සූදානම් වෙන්න. ඊළඟ මැතිවරණය කුමක් වෙයිද? අපේ මන්ත්‍රීතුමා යෝජනා කරන මැලේරියාව ව්‍යාප්ත වීමත්, සමහර විට මැතිවරණ ව්‍යාපාරය තවත් ඡන්ද වැඩි කරගන්න සටන් පාඨයක් බවට ඔවුන් අතට ගන්න පුළුවන්. ඒ මර්දනය කර ගැනීමේ අදහසින් නොවෙයි. මැතිවරණය තුළ ඡන්ද ලබා ගැනීමට. ඡන්දදායකයා අතරට මේ ප්‍රශ්නයත් අරගෙන යන්න පුළුවන්. නමුත් විය යුත්තේ එය නෙවෙයි. එදා සුනාමියට පෙළ ගැසුණා වාගේ මේ ව්‍යසනය මුලිනුපුටා දාන්න එකතු වෙන්න ඕනෑ. මේ මදුරුවෙක් හරහා බෝ වන ව්‍යසනය. ඩෙංගු මදුරුවා, එහෙම නැත්නම් මැලේරියා මදුරුවා, මේ බරවා මදුරුවන් මර්දනය කර ගන්න අපට බැරි ඇයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ භූගෝලීය පිහිටීම අනුව අපි ඉතාමත් වැදගත් පිහිටීමක් සහිත රටක්. අපේ රට දූපතක් හැටියට තිබෙන්නේ. රට වටේම මුහුද තියෙන්නේ. ඒ නිසා විදේශ රටවලට කිසියම් ආවරණයක් අපට ස්වභාවිකව ලැබිලා තිබෙනවා. ඒ ස්වභාවිකව අපට ලැබී තිබෙන දෙයින් අපි ප්‍රයෝජන ගන්නවාද? අපේ රටට

[ගරු සරත් පතිරණ]

ඉන්දියානුවන් මැදිහත් වෙන්නේ කොහොමද? වීසා ලබා ගන්නේ කොහොමද? එදා කිව්වා වාගේ කල්ලතෝනින් විධියට අපේ රටට ඇවිල්ලා අපේ රටේ මෙන්න මේ විධියට ඔවුන් කටයුතු කරන්නේ? ගිවිසුම් නීත්‍යානුකූලව ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියන ප්‍රශ්නය අපි ඉස්සරහා තියෙනවා. ඔය ඉට්කා, සීපා එහෙම නැත්නම් සිංගප්පූර් ගිවිසුම්. මේ ශ්‍රමිකයන් අපේ රටට ගොඩ බැහැලා, ඒ ගොඩ බහිද්දී අපි ඔවුන් පිළිබඳව කිසියම් සෞඛ්‍ය පරීක්ෂණයක් කරනවාද? එහෙම නිවැරැදි පරීක්ෂණයක් කෙරුවා නම්, කෙරුණා නම් කොහොමද මේ රෝගීන් අපේ රටේ රෝග වාහකයන් බවට පත් වෙලා රට පුරා සැරිසරන්නේ? අර මන්ත්‍රීතුමා කිව්වේ කොලොන්නාවේ පන්සියයක් විතර වැඩ ඇරිලා යන වෙලාවට හවස් වරුවේ ඒ මාර්ග දිගේ ගමන් කරනවා කියලා. මේ පන්සියයක් දෙනාව අඩුම තරමින් අපි මාස තුනකට වරක්වත් ඔවුන්ව පරීක්ෂා කරන්න - මුලින් එනකොට පරීක්ෂා කළ යුතුයි. නැවත් අඩුම තරමින් මාස හයකට වරක්වත් අභ්‍යන්තරිකව මේ රෝගය තිබෙනවාද කියා පරීක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් අපි සතුව තිබෙනවාද? මම මුලින් කිව්වේ මේ වෙහෙරහැර තිබෙන බරවා මධ්‍යස්ථානයේ වැඩ කරන්නේ හත් අට දෙනෙකුට අඩු කාර්ය මණ්ඩලයක්. මම හිතන්නේ 15 ක්. මට ගණන මතක නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාමත් සුළු කාර්ය මණ්ඩලයකින් තමයි මේ කටයුතු කරන්නේ. ඔවුන්ට ලැබෙන පහසුකම් ඉතාමත් අවමයි. නමුත් ඔවුන් ඒ කාර්ය කරගෙන යනවා. මම කනගාටු වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතැන අවුරුදු 15 ක් වැඩ කරන එක් නිලධාරිනියක් ඉන්නවා. ඒගොල්ලන්ට අපි කියන්නේ PHLT ලා. එතකොට මේ අය අවුරුදු 15 ක් කඩුවෙල ඉඳලා එතැන සේවා ස්ථානයට යනවා. කුඩා දරුවෝ දෙන්නෙක් ඉන්න අම්මා කෙනෙක්. මෙයාට මාරු වීමක් ලබා ගන්න ඇමැතිතුමාට කිව්වා. ඉතාමත් සාධාරණ ඉල්ලීමක්. හෝමාගම රෝහලට මාරුවීමක් ලබා ගන්න. ඒ නෝනා වැඩ යන්න බස් හතරක යන්න ඕනෑ. අඩුම තරමින් අලුත් පත්වීම් ටිකක් දෙද්දී මේ අවුරුදු 15 ක් සේවය කළ කෙනාට හෝමාගම රෝහලට මාරු වීමක් ලබා දෙන්න තරම්වත් මේ සෞඛ්‍ය අමාත්‍යාංශය තවමත් වැඩ කටයුතු කරලා නැහැ. මම මේ එක්කෙනෙක් ගැන කිව්වේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මාරු වීම් ඕනෑ ඕනෑ විධියට වැඩ කර ගන්නවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑ තරම් මේ ස්ථාන මාරුවීම්, ඕනෑ ඕනෑ තැන්වලට පත්වීම් ලබා දීම් කෙරෙනවා. මම කියන්නේ මෙවැනි සේවාවක් කරන - මට මාරුවීම ලබා දුන්නත් එකයි නැතත් එකයි. මම ඉල්ලා සිටින්නේ මූලාසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තුළ ඔවුන් කිසියම් මානසික තෘප්තිමත් භාවයකින් සේවාව ඉෂ්ට කරනවාද? සමහර සාම්පල් අනුරාධපුරයටත් යවනවාලු. කර ගන්න බැරි තරටම වැඩ ගොඩ ගැහිලා තිබෙන්නේ. බස් හතරක ගිහිල්ලා තමන්ගේ සේවය සපයන්න තරම් ඔවුන්ට හොඳ මානසිකත්වයකින් වැඩ කටයුතු කරගන්න පුළුවන්ද? දවසක බස් අටක එහාට මෙහාට යන්න ඕනෑ. ඉතින් මෙවැනි රාජ්‍ය සේවයක් සහිත, මේ ගැන කිසිඳු තැකීමක්, මේ ගැන කිසිඳු හැඟීමක්, මේ ගැන කිසිඳු වැඩ පිළිවෙළක් නැති අමාත්‍යාංශවල තවත් මොනවාටද සේවය කරන්නේ කියලා ඔවුන් කල්පනා කරමින් ඉන්නවා. වෙනත් තැනකට කොහොමද මාරු වෙන්නේ කියලා. Transfer එකක් හදාගන්නේ කොහොමද කියලා.

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉහළට, මුදුනට හෙණ ගහලා තිබෙන වෙලාවක අපි පහළ තිබෙන ඒ කුස්සියට මොනවාද වෙලා තිබෙන්නේ කියලා හොයලා බලලා වැඩක් නැහැ. ඒ නිසා මුදුන නිවැරැදි කර ගන්න ඕනෑ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුදුන පත් වෙන්න ඕනෑ මිරිස් කුඩු කල්ලියේ සාමාජිකයන් නොවෙයි. වැඩ කරන තැන, වැඩ හදන තැන, ප්‍රතිපත්ති හදන තැන, වැඩ බලන තැන නිවැරැදි කර ගන්න ඕනෑ මූලාසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතැනට යහපත් මිනිසුන් යවන්න ඕනෑ. ඒ යහපත් මිනිස්සු නැති නිසා තමයි මරා ගන්න, මරාගෙන මැරෙන බෝම්බකරුවන් වැනි ඒ මන්ත්‍රීවරු අපේ රටේ ව්‍යවස්ථාදායක සභාව නියෝජනය කරද්දී අපට මොන වැඩ කටයුතුද බලාපොරොත්තු වෙන්න පුළුවන් මූලාසානාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පහළ මිනිස්සුන්ගෙන් නිවැරැදි වූ සමාජමය ඉලක්කයක් සහිත වැඩ පිළිවෙළක් මේ මිනිස්සුන්ගෙන් බලාපොරොත්තු වෙන්න පුළුවන්ද? එහෙම බැහැ. එම නිසා ඉහළින් ආදර්ශය තියෙන්න ඕනෑ. ඒ ආදර්ශවත් මිනිස්සු හෙට දවසේ මේ ආයතනවලට යැවීමෙන් පමණක්මයි මේ රටට යහපත් වූ හෙට දවසක් උදා වෙන්නේ. ඒ නිසා නව වසර සුභ වෙන්න කියලා 2019 ජනවාරි 01 වැනිදා අපි එකිනෙකාට සුභ පතා ගත්තාට, මේ නව වසරත් අපට සුභ වෙන්නේ

නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කණ්ඩායම තමන්ගේ බල ව්‍යාපෘති වෙනුවෙන් මේ මදුරුවාත් උපයෝගී කර ගන්න වැඩ කටයුතු කරන මොහොතක, මේ අපේ රටේ සමාජ ව්‍යසනයන් තමන්ගේ දේශපාලන ව්‍යාපෘති බවට පත් කරගන්න සූදානම් වන මොහොතක අපට යහපත් නව වසරක් දකින්න හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මේ සමාජයට යහපත් හෙට දවසක් උදා කර ගන්න නම් මා අවසන් වශයෙන් කියපු විධියට මේ ව්‍යවස්ථාදායකයට තෝරා පත් කර යැවීමේදී නිවැරදි පුද්ගලයන් තෝරා පත් කර යැවීමෙන් පමණක්මයි මේ රට නිවැරදි දිශාවට ගෙනියන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා විසඳුම් ලබා ගත හැකියි කියමින් අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.56]

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සන්තෝෂ වෙනවා බොහොම වැදගත් අදහස් කිහිපයක් මේ සභාව තුළ අපේ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. මේ යෝජනාවට සහයෝගය දැක්වූවා. ඒ වාගේම අද ඇමැතිතුමාත් නැහැ. මේ වනකොට මහ ඇමැතිතුමාත් නැහැ. කවුරුත් නැහැ. මම එකක් ප්‍රකාශ කරන්න ඕනෑ. ලේකම්තුමා රැඳී සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලේකම්තුමාට පවසන්නේ එතුමාට මේ ප්‍රශ්නයෙන් ගැලවෙන්න බැහැ. බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය ලේකම්තුමාගේ මහ පෙන්වීම යටතේ තමයි - ඇමැතිතුමා නිකම් හිටියාට. ඕනෑම අමාත්‍යාංශයක ලේකම්තුමාගේ ඒ කාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් තමයි ඒක දුවන්නේ. මේක ඉතාමත් වැදගත් මාතෘකාවක්. කාලෝචිත යෝජනාවක් අපි අරගෙන ආවේ. මේ සම්බන්ධව ඇමැතිතුමා, ලේකම්තුමාත් එකතු වෙලා අපවත් එකතු කරගෙන මේ මන්ත්‍රීවරු ඕනෑ කෙනෙක් කථා කළොත් මේ යෝජනාට අද මෙතැන ඇතැ නැතැ සියලු දෙනාම එකතු වෙයි, සහයෝගයක් දක්වන්න. පළමුවෙන්ම බස්නාහිර පළාත් සභාවෙන් අපි එකතු වෙලා මධ්‍යම රජයට යමක් දැනුවත් කරන්න ඕනෑ, මේකට ගන්න ඕනෑ ක්‍රියා මාර්ගය මොකක්ද? ඔබතුමන්ලා දක්වන සහයෝගය මොකක්ද කියලා. අපට එහෙන් හොඳ ප්‍රතිචාරයක් නොලැබුණොත් දෙවනුව අපි ගන්න ඕනෑ ක්‍රියා මාර්ගය අපේ මහ ඇමැතිතුමාත් එකතු කර ගෙන ගරු සභාපතිතුමාත් එකතු කරගෙන අමාත්‍යතුමා සමග සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සියලු දෙනා එකතු වෙලා අපි වැඩ පිළිවෙළකට බහින්න ඕනෑ කියන එක මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ භයානක තත්ත්වය බස්නාහිර පළාතේ තමයි මේක කැරකෙන්නේ. රටෙන් තුරන් කරපු රෝගය මේ වන කොට අවතාරයක් වගේ කැරකෙන්නේ අපේ බස්නාහිර පළාතේමයි. එහෙම නම් අපි මේකට සුළු කාලයකින් විසඳුම්වලට යන්න ඕනෑ කියන එක මතක් කරන්න ඕනෑ. දෙවනුව මට මුලින්ම අමතක වුණු සිදුවීමක් තිබෙනවා. මේ බරවා රෝගීන් බහුතරයක් හම්බ වෙලා තිබෙන්නේ ගම්පහ දිස්ත්‍රික්කයෙන්. ගම්පහ දිස්ත්‍රික්කයේ 615 ක් පරීක්ෂා කළාම ඒ 615 න් 21 ක් බරවා රෝගීන්. මේ 21 දෙනාම ඉන්දියන් ජාතිකයින්. අපේ ශ්‍රී ලාංකික ජාතිකයෝ නොවෙයි. කොළඹ දිස්ත්‍රික්කයේ 8000 ක මැලේරියාව පරීක්ෂා කළාම අපට මැලේරියා රෝගීන් එක්කෙනෙක්වත් හම්බ වෙන්නේ නැහැ. බරවා රෝගීන් නම් යම් යම් ප්‍රතිශත අහු වෙනවා. අපේ තදාසන්න නිවෙස් තිබෙන නිසා. ඒවාට ප්‍රතිකර්ම කරනවා. තවත් මන්ත්‍රීවරු අදහස් දැක්වූවා.

සාමාන්‍යයෙන් බරවා රෝගියෙක් අහු වුණාම තමයි අපේ සෞඛ්‍ය අමාත්‍යාංශය බරවා රෝගියෙක් හමු වුණා කියලා එතැනට දැනුවත් කළාම ඊට පස්සේ රාත්‍රියට ගිහින් ඒ අවට ඔක්කොම පරීක්ෂා කරලා බැලුවා. දැනටත් ඒක සාර්ථකව අපේ බස්නාහිර පළාතේ ක්‍රියාත්මක වෙනවා. ඒක මම මතක් කරන්න ඕනෑ. එහෙම නම් අද විවාදයට සම්බන්ධ වෙලා ගොඩක් කරුණු කාරණා අපට මේ සම්බන්ධව දැනගන්න ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට කාරණාවක් තිබෙනවා. මේක නවත්වාගන්න මම අදහසක් වශයෙන් දක්වනවා. ආගමන විගමන දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගන්න ඕනෑ. අපට ඒවායෙන් සහයෝගයක් නැති වුණොත් අපේ මට්ටමින් දිසාපතිතුමන්ලාගෙන්, ප්‍රාදේශීය ලේකම්තුමන්ලාගෙන්, දිස්ත්‍රික් භාර දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ එකතු වෙලා අපට වැඩ සටහනක් දාන්න පුළුවන්. නීතියක් පනවන්න පුළුවන්. ශ්‍රමිකයින් ගෙනැල්ලා

[ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා]

කොහේ හරි ආයතනයක වැඩ කර ගන්නවා නම්, ඒ අය රෙජිස්ටර් කරගන්න ඕනෑ අපේ ආයතනවල. මේ වාගේ විවිධ විවිධ වැඩ සටහන්වලට, ආරක්ෂාකාරී පියවරවල්වලට අපට මේකෙන් මිදෙන්න පියවර ගත යුතුයි කියන එක අපි ඔබතුමාව දැනුවත් කරනවා.

ඒ වාගේම ඩෙංගු රෝගය වාගේ නොවෙයි මේක බෝ වෙන්නේ කියන එකත් මතක් කරලා දෙන්න ඕනෑ. ඩෙංගු රෝගය බෝ කරන්න පුළුවන් විශේෂ මදුරුවෙක්ට තමයි. මේ මැලේරියාව කියන්නේ ඇනෝෆිලිස් මදුරුවාගේ ගැහැණු සත්ත්වයා මේක අරගෙන ගිහින් ඒ රෝගකාරකය විද්දාම බොහොම සීඝ්‍රයෙන් පැතිර යාමක් තමයි මේ සම්බන්ධව තිබෙන්නේ. අපි ඒ නිසා බලාපොරොත්තු වන්නේ, අපේ බස්නාහිර පළාත් සභාව යටතේ වැඩ කරන විශේෂඥ වෛද්‍යවරු ඉන්නවා. මැලේරියාව මර්දනය කරන්න වෙනම දෙපාර්තමේන්තු පිහිටුවලා තිබෙනවා. බරවා මර්දනය කරන්න වෙනම දෙපාර්තමේන්තු, වැඩ සටහන් තිබෙනවා, අපි සතුව බස්නාහිර පළාත් සභාවේ. ලේකම්තුමා ඒක දන්නවා. අපි මූලික වශයෙන් ඒ නිලධාරීන්ව මුලින්ම ගෙනැල්ලා සාකච්ඡාවක් ඇති කරලා, අපි වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. මේ වැඩ සටහන කොතැනින්ද පටන් ගන්න ඕනෑ කියලා. මේක නිකන් අද කථා කරලා හෙට මේක මෙහෙම අතහැරලා දාන්න අවශ්‍ය නැහැයි කියන එක මම මේ වෙලාවේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා හරහා ගරු සභාවට මතක් කරනවා.

ඒ වාගේම අද ගරු ඇමතිතුමා නැහැයි කියලා අපට මේකෙන් කර අරින්න බැහැ. ලේකම්තුමා මේ සියලු වගකීම ගන්න ඕනෑය කියන එක පවසනවා. එතුමා මුල සිට අග වනතුරු අපිත් එක්ක මෙතැන සිටියා. අපි ආඩම්බර වෙනවා. සන්තෝෂ වෙනවා. ලේකම්තුමා අපිත් එක්ක රැඳී සිටීම ගැන. එතුමා මේ වගකීම අතට අරගන්න ඕනෑ. ඇමතිතමාත් එක්ක කථා කරන්න ඕනෑ. ඇමතිතුමාට සහයෝගය ඕනෑ නම් ඕනෑ වෙලාවක අපි පෞද්ගලිකව ඉදිරිපත් වෙනවා. මේ ගරු මන්ත්‍රීවරන්ට කථා කළොත් අපිත් එක්ක කරුණු කාරණා සොයාගෙන මේ සියලු ගරු මන්ත්‍රීවරු එක ගොන්නක් බවට පරිවර්තනය කර ගන්න පුළුවන් කියන විශ්වාසය අප සතුව තිබෙන බව මම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම මේ අවස්ථාවේ බොහොම වැදගත් කරුණු කාරණා සිද්ධ වුණා. මම හිතුවා සමහරවිට මේක දේශපාලන මතිමතාන්තරවලට කැරකිලා යයි කියලා. ඉන්දියන් ශ්‍රමිකයෝ ගේන්න අවසර දුන්නා. නමුත් ලංකාවේ අපි කවුරුත් පිළිගන්නවා. ව්‍යාපාරයක් කරන කෙනෙක් ව්‍යාපාරයකට සම්බන්ධ පරිසරයක ජීවත් වෙනවා නම් කවුරුන් හෝ කෙනෙක්, අද දන්නවා මේ රටේ ශ්‍රමිකයින් නැති විශාල ප්‍රශ්නයකට අපි මැදිහත් වෙලා ඉන්නවා කියලා. ලංකාවේ පඩිය දීලත් මිනිස්සු වැඩ කරන්න එන්නේ නැහැ. එහෙම නම් අද මේ රටේ දැවැන්ත ව්‍යාපාර කරන ව්‍යාපාරිකයෝ අසරණ වෙලා ඉන්නවා සේවකයින් නොමැති ප්‍රශ්නය උඩ. එතකොට මේ ප්‍රශ්නය හරහා - අද ව්‍යාපාරිකයින්ට ගහන්න ඕනෑ නැහැ. අපි මේක නවත්වන්න නොවෙයි කියන්නේ.

මේකට පැහැදිලි ක්‍රමවේදයක් මේ රටට හඳුන්වා දීමේ වගකීම රජයක් වශයෙනුත්, අපි පළාත් සභාව වශයෙනුත් ගන්න ඕනෑ කියමින් මේ අවස්ථාවට සහයෝගය දැක් වූ සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන්ටත්, අපට සහයෝගය දැක් වූ ගරු සභාපතිතුමා ඇතුළු මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමන්ලාටත් ඒ වාගේම අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරී මණ්ඩලයට, පෞද්ගලික කාර්ය මණ්ඩලය ඇතුළු, ජනමාධ්‍ය කාර්ය මණ්ඩලයටත්, අපි ජනමාධ්‍යයෙනුත් බලාපොරොත්තු වෙනවා මේකට සුවිශේෂී සහයෝගයක් ලැබෙයි කියලා. ඒ සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් ලැබුවා වූ 2019 වර්ෂය සියලු දෙනාටම නිදුක් නිරෝගී සැප සම්පත් සහිත වර්ෂයක් උදා වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම මේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

0073

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

කාර්ය පටිපාටි රීති අංක 110 යටතේ රීති අත්හිටුවමින් හරිස්චන්ද්‍ර ද කොස්තා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව මම හිතන්නේ ඉතා හොඳ අදහස් මේ සභාවේ පළ වුණා. එතුමා අවසානයේ ඉල්ලූ පරිදිම මේ අදහස් වගකිව යුත්තන්ට මේ සභාව හරහා, ගරු සභාපතිතුමා හරහා දැනුම් දීලා කඩිනම් ප්‍රතිචාරයක් ලබා ගන්න අපි යොමු කරනවා. මොකද, මීට කලිනුත් මේ වාගේ කාලීන වැදගත්කම් තිබෙන යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. වැඩි දෙයක් හමස් පෙට්ටියට ගිහිල්ලා තියෙන්නේ. ඇත්ත වශයෙන්ම මේක අත්‍යවශ්‍ය කාලීන යෝජනාවක්. තත්ත්වය බරපතළ වෙනකල් ඉන්නේ නැතුව ඉතා ඉක්මන් පියවරක් ගන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය?

0074

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීම
# ADJOURNMENT

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා**
Hon. Presiding Member

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.05 ට, 2019 ජනවාරි මස 22 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.05 p.m till 9.30 a.m. on 22.01.2019*